

srilanka

# වාර්ෂික වාර්තාව
# 2015

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

# වාර්ෂික වාර්තාව
# 2015

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



# හැඳින්වීම

2015 වසරේ දී සංචාරකයන් මිලියන 1.5 අධිකව පැමිණීමත් සමඟ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය නව සන්ධිස්ථානයකට පිවිසීම සිදු විය. සැබෑ ලෙස ගත් කළ 1,798,530 ක් වූ එම සංඛ්‍යාව ඉලක්කගත ප්‍රමාණයට සමීප වීමට හැකි විය. සංචාරක පැමිණීම තුලින් සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 2980 තෙක් ඉහළ යාමට හේතු විය.

මෙම ජයග්‍රාහී තත්වයට තිරසාර සාමය ප්‍රබල හේතුවක් වූ අතරම විශේෂයෙන්ම රට තුල සංචාරක කර්මාන්තය සඳහා වඩා යහපත් වටපිටාවක් සැකසෙන ක්‍රමවේද අනුගමනය කිරීම මගින් සංචාරකයන් අතර ප්‍රියජනක හා සිත් ඇදගන්නා සුළු ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ද කරලියට පැමිණ ඇත.  සංචාරක කර්මාන්තනේ බැහැර වූ වෙනස් වූ ප්‍රවනතා වල වාසිය ගැනීමට නව වෙළඳපලවල්  සඳහා ශ්‍රී ලංකාව පිවිසී ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වැඩසටහන් 2014-2016 සංයුක්ත සැළැස්ම මගින් සැකසෙන අතර, කැබිනට් මණ්ඩලය අනුමත කළ රටේ උදාවී ඇති නව සාමකාමී වාතාවරණය සැළකිල්ලට ගෙන පස් අවුරුදු සංචාරක ක්‍රමවේදය ස්ථිර එකක් ලෙස සළකා ඇත. එතුලින් ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයට ලෝකයේ ආරක්ෂිතම රටවල් වලින් එකක් බවට ශ්‍රී ලංකාව පත්වී ඇති බව තම වෙළඳපලවල් වෙත දක්වා යැවීමට හැකියාව ඇති වනු ඇත.



# පටුන


1. හැඳින්වීම
2. දැක්ම හා මෙහෙවර
3. සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය
4. සභාපතිවරයාගේ පණිවුඩය
5. ආයතනික තොරතුරු
   - ශ්‍රීලංසංසංඅ හි අධ්‍යක්ෂ මණ්ඩලය
   - විගණන හා කළමනාකරණ කමිටු සමාජිකයන්
   - හෝටල් වර්ගීකරණ කමිටු සාමාජිකයන්
   - ශ්‍රීලංසංසංඅහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්
6. දළ විශ්ලේෂණය

   ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ කැඩපත

   සංචාරක සංවර්ධන කාර්යසාධනයන්

   ලෝක සංචාරක සන්දර්භය
7. දෙපාර්තමේන්තු කාර්යසාධනයන්

   7.1 පර්යේෂණ හා අන්තර්ජාතික සබඳතා

   7.2 සංචාරක සැළසුම් හා සංවර්ධනය

   7.3 "වන් ස්ටොප්" ඒකකය

   7.4 දේශීය සංචාරක කර්මාන්තය හා නිකේතන කළමනාකරණය

   7.5 දේශීය සංචාරක කර්මාන්තය හා ප්‍රජා සබඳතා

   7.6 ප්‍රමිති හා තත්ත්ව ආරක්ෂණය

   7.7 මානව සම්පත් හා පරිශ්‍ර කළමනාකරණය

   7.8 තොරතුරු හා සංනිවේදන තාක්ෂණය

   7.9 අභ්‍යන්තර විගණනය

   7.10 මූල්‍ය කළමනාකරණය

   7.11 නීති අංශය
8. ශ්‍රී ලංකා සංචාරක නාමාවලිය
9. මූල්‍ය සමාලෝචනය
10. විගණන වාර්තාව






# දැක්ම

“මනස්කාන්ත මුහුදු වෙරළවල්, හිතෛෂී හා මිත්‍රශීලී ජනතාවක් සමඟ ස්වභාවික සංස්කෘතික වටිනාකම් සහ අසමසම දේ ඉදිරිපත් කෙරෙන ආසියානු සංචාරක කර්මාන්තයේ ප්‍රතිමාව වැනි ප්‍රතිරූපයක් ඇති කරමින්, එම කර්මාන්තය දැවැන්තම විදේශ විනිමය උපයන්නා බවට පත් කරමින් ශ්‍රි ලාංකීය ජනයා හ සංචාරක කර්මාන්තයේ නිරතවුවන් හට සෙත සළසමින් ආසියාවේ වඩාත් වටිනාකම් ඇති හරිත දිවයින බවට ශ්‍රී ලංකාව පත් කිරීම හා ස්ථාපිත කිරීම”

# මෙහෙවර

“අපගේ පාරිභෝගිකයන් (දේශීය හා විදේශීය) සතුටු කරවන අන්දමට කටයුතු කිරීම සහ ඔවුන් ශ්‍රී ලංකාව පිළිබඳ වූ හිතවාදී හැඟීම් වර්ධනය කිරීම.

# සංචාරක සංවර්ධන, ක්‍රිස්තියානි ආගමික කටයුතු හා ඉඩම් පිළිබඳ අමාත්‍යතුමාගේ පණිවුඩය

*කාලයක් බලාපොරොත්තු සහගත ව සිටි ගමනාන්ත ප්‍රවර්ධන ව්‍යාපාරය ඉදිරි වසරට කලින් ඇරඹීමට නියමිතව ඇත. මෙම ව්‍යාපාරය තුල අන්තර්ජාතික TV නාලිකා, සමාජ මාධ්‍ය, හදුනාගත් උපායශීලි වෙළඳපලවල්වල ඩිජිටල් හා මුද්‍රණ මාධ්‍ය අන්තර්ගත වේ. රු. මිලියන 800 ක් සමස්ත ව්‍යාපාරය සදහා වැය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.*

2015 වසරේ ලත් ජයග්‍රහණ පසක් කොට ගනිමින්, 2016 වසරේ සංචාරක පැමිණීම් ප්‍රමාණය සැප්තැම්බර් මස අවසානය වන විට පමණක් සියයට 15 ක ප්‍රගතියක් පෙන්නුම් කරමින් අඛන්ඩව වර්ධනයක් දක්වා ඇත. ඇති වී ඇති ප්‍රවනතාවය ඉදිරියට යමින් 2016 දෙසැම්බර් අග වන විට සංචාරකයන් මිලියන 2.2 ක ඉලක්කයක් කරා ලගා වන බව අපගේ විශ්වාසයයි.

බටහිර යුරෝපය අපගේ විශාලතම මූලාශ්‍ර වෙළඳපල ලෙස පැවතුනද, දකුණු ආසියාව දෙවන විශාලතම වෙළඳපල බවට තල්ලු කරමින් නැගෙනහිර ආසියාවෙන් තියුණු තරඟකාරිත්වයක් එල්ල වී ඇති බව අපට හැගේ. සම්ප්‍රදායික නොවන වෙළඳපලවල් වන උතුරු ඇමෙරිකාව හා ඕස්ට්‍රේලියාව මෙකී ඉහළ යමින් තිබෙන සංචාරක වර්ධනයන් හි ප්‍රබල දායකත්වයක් දැක්විහ පෙන්නුම් කිරීම මා ද ඉතාමත් ධෛර්යමත් කරවන සුළුය. මෙම සුභවාදී තත්වයන් ඇති කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාට හා අධ්‍යක්ෂ මණ්ඩලයට මා සුභ පතමි.

සංඛ්‍යාත්මකව ඉහළ ප්‍රමාණයකට ඒම අපගේ අරමුණයි. ප්‍රවර්ධන වැඩසටහන් හා මාර්ගස්ථ දැක්මවල් ලොව පුරා කර ගෙන යමින් සිටී. ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය විසින් ලොව පුරා අලෙවි ප්‍රදර්ශන හා වීථි ප්‍රවර්ධන වැඩසටහන් 58 කට තම සහභාගිත්වය මේ වසරේ ලබා දී ඇත. ජගත් සංචාරක කර්මාන්තයේ වැඩසටහන් අතරට ශ්‍රී ලංකාව ඇතුළත් කිරීම සහතික කිරීම සඳහා ඒවා අතරින් බර්ලින්වල පැවති ITB, ඩුබායි වල ATM, චීනයේ BITE, පැරිසියේ IFTM හා ලන්ඩන් හි WTM වැනි අවස්ථා පහකට මා පුද්ගලිකව සහභාගී වූයෙමි.

කාලයක් බලාපොරොත්තු සහගත ව සිටි ගමනාන්ත ප්‍රවර්ධන ව්‍යාපාරය ඉදිරි වසරට කලින් ඇරඹීමට නියමිතව ඇත. මෙම ව්‍යාපාරය තුල අන්තර්ජාතික TV නාලිකා, සමාජ මාධ්‍ය, හදුනාගත් උපායශීලි වෙළඳපලවල්වල ඩිජිටල් හා මුද්‍රණ මාධ්‍ය අන්තර්ගත වේ. රු. මිලියන 800 ක් සමස්ත ව්‍යාපාරය සදහා වැය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සමාලෝචිත වර්ෂය තුල විශේෂ අවධානය දිනා ගත් අනෙක් ක්ෂේත්‍රය වන්නේ අවිධිමත් අංශය විධිමත් නියමානුකූල කිරීමයි. එම අංශය තුල ඇති නව ආයතන 250 ක් පමණ මේ වසරේ දී ලියාපදිංචි කිරීම අප බලාපොරොත්තු වෙමු. මෙතුලින් අවම



ප්‍රමිති සහතික කිරීමත් අදාළ බදු ගෙවන බවටත් කර්මාන්තය සඳහා සමබර වාතාවරනයක් ඇති කිරීමත් අප අපේක්ෂා කරන්නෙමු.

සියළුම නව සංචාරක හෝටල් සඳහා මේ වසරේ මැයි 20 දින සිට අනිවාර්ය කර ඇති නව වර්ගීකරණ නීති ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් අද වන විට සාර්ථකව ක්‍රියාත්මක කරමින් සිටි. මෙම පියවර සංචාරක කර්මාන්තයේ නිරතවන්නන්ගේ දැඩි ප්‍රශංසාවට ලක් වී ඇත.

2016 ඔක්තෝබර් මස අවසානයේ පැවැත්වීමට නියමිත ප්‍රංශ සංචාරක නියෝජිතයන්ගේ සමුළුව (JEV) (මින් පෙර SNAV නමින් හැඳින්වූ) MICE සංචාරක කර්මාන්තය සඳහා අතිදැවැන්ත උත්තේජනයක් සැපයීමක් වන අතර එහිදී ප්‍රංශයේ මුල් පෙලේ සංචාරක නියෝජිතයන් 500 ක් කොළඹ දී ඔක්තෝබර් 30 වන දින සිට දින පහකට වැඩි කාලයක් එකට හමු වීමට අවස්ථාව සළසනු ඇත. සමාලෝචිත වර්ෂය තුල උපයා ගත් සංචාරක ආදායම් ප්‍රමාණයෙන් පහෙන් එකක ප්‍රමාණයක් ලාභදායී MICE අංශයෙන් අත් විය.


මේ අතර මාගේ නිර්දේශය අනුව අභ්‍යන්තරික සංචාරක කර්මාන්තය ඉහළ නැංවීමේ තවත් ඉදිරි පියවරක් තබමින් අග්නිදිග ආසියාවට ප්‍රවේශයක නමින් නව ජාත්‍යන්තර සංචාරක වෙළඳපලක් 2017 මැයි මස කොළඹ දී පැවැත්වෙනු ඇත.

මෙම සංචාරක වෙළඳපලේ ප්‍රධාන අරමුණ නව වෙළඳපල්වලින් සංචාරක නියෝජිතයන් 500 ක් ආකර්ශණය කර ගැනීම වන අතර. එය "සංචාරක උදාව" ප්‍රදර්ශනයට සමගාමීව පැවැත්වෙනු ඇත. මෙම කර්තව්‍ය සඳහා කර්මාන්තයේ නිරත සියළුම උනන්දුවක් දක්වන්නන් දැනටමත් තම සහාය පල කර ඇත.

2015 වසර තුල ධනාත්මක ප්‍රතිඵල පෙන්නුම් කළ අංශයන් අනාගතයේ දී මෙම කර්මාන්තය නව මානයට ඔසවා තැබීමට උචිතම පියවර ගෙන ඇති බව අප විශ්වාස කරමු.


## ගරු ජෝන් අමරතුංග

සංචාරක සංවර්ධන, ක්‍රිස්තියානි ආගමික කටයුතු හා ඉඩම් අමාත්‍යතුමා


KANKESANTURAI
JAFFNA
MANNAR
TRINCOMALEE
ANURADHAPURA
PUTTALAM
SIGIRIYA
DAMBULLA
BATTICALOA
POLONNARUWA
NEGOMBO
KANDY
ARUGAMBAY
COLOMBO
NUWARA ELIYA
WADDUWA
RATNAPURA
BENTOTA
YALA
HAMBANTOTA
GALLE
WELIGAMA
MATARA

# සභාපතිතුමාගේ පණිවුඩය

*දේශීය හා විදේශීය සංචාරකයන් සියළු දෙනා හට මෙම සොබාසම්පන්න දිවයින විද ගැනීමට ශ්‍රී ලංකාවේ දැනට තිබෙන පවතින සාමකාමී, සහජීවන හා යහ පාලන ක්‍රියාදාමය රුකුලක් වනු ඇත. සියළු ව්‍යාපාරික ප්‍රජාවට පැමිණ තම ආයෝජනයන් කිරීම සඳහා ජාත්‍යන්තර ව්‍යාපාරික මූලස්ථානයක් බවට අප පරිවර්තනය වෙමින් සිටි.*




ශ්‍රී ලංකාව තම සංස්කෘතික උරුමය, උත්සව හා අලංකාරත්වය වැනි දෑ වැදගත්කම් සමඟ සංචාරක කර්මාන්තයේ විශ්ව සංකේතය බවට පත් ව ඇත. 2015 වසරේ දී සංචාරක පැමිණීම් ප්‍රමාණය 4.4 % කින් වැඩිවී 2014 වසරේ මිලියන 1,134 සිට සමස්ත සංඛ්‍යාව මිලියන 1,184 වර්ධනය වි ඇත. 2015 වසරේ කලාප සියල්ලේම වැඩිම අගය වූ 5 % ප්‍රමාණය යුරෝපයෙන් වාර්තා වුනි.

දේශීය හා විදේශීය සංචාරකයන් සියළු දෙනා හට මෙම සොබාසම්පන්න දිවයින විද ගැනීමට ශ්‍රී ලංකාවේ දැනට තිබෙන පවතින සාමකාමී, සහජීවන හා යහ පාලන ක්‍රියාදාමය රුකුලක් වනු ඇත. සියළු ව්‍යාපාරික ප්‍රජාවට පැමිණ තම ආයෝනයන් කිරීම සඳහා ජාත්‍යන්තර ව්‍යාපාරික මූලස්ථානයක් බවට අප පරිවර්තනය වෙමින් සිටි. ශ්‍රී ලංකාව ගෝලිය සංචාරක මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය වි අප දිවයිනට වැඩි සංචාරකයන් සංඛ්‍යාවක් ආකර්ශණය කර ගැනීමට ශ්‍රී ලංකා රජය තම පූර්ණ සහාය දක්වා ඇත.

ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය විසින් ගන්නා මෙම ප්‍රයත්නය සාර්ථක වී බිම් මට්ටමේ සිටින ගැමි ප්‍රජාවට සෙතක් අත් වනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු.

## පී.එම්. විතාන

සභාපති
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



# ආයතනික තොරතුරු

*ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනු ශ්‍රී ලංකාව ප්‍රමුඛ සේවා අංශ වල එකක් වන සංචාරක කර්මාන්තයේ සිටින ප්‍රධානතම ආර්ථික සංවර්ධන නියෝජිතායතනය වේ. සහයෝගිතාවය, නව්‍යකරණය හා ප්‍රවීනත්වය සඳහා නම දිනා ගෙන ඇති ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සංචාරක කර්මාන්තයේ ප්‍රමුඛයා වෙමින් එය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික හොබවන්නා බවට පත් කිරීමට වෙර දරයි.*

## නම

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## නෛතික ව්‍යුහය

2005 අංක 38 දරණ සංචාරක පනතේ ස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.

## ප්‍රධාන කාර්යාලයේ ලිපිනය

80, ගාලු පාර, කොළඹ 03

ජාතික නිවාඩු නිකේතන පිහිටි ස්ථාන

පාසිකුඩා, කුච්චවේලි, කල්පිටිය, බෙන්තොට, ගිරිතලේ, පොළොන්නරුව සහ යාල

## දේශීය නිවාඩු නිකේතන පිහිටි ස්ථාන

අනුරාධපුරය, බණ්ඩාරවෙල, බෙන්තොට, කතරගම සහ නුවරඑළිය

## විගණකවරු

ශ්‍රී ලංකා විගණකාධිපති

## බැංකුකරුවන්

ලංකා බැංකුව





# 2015 වසරේ කළමනාකාරිත්ව මණ්ඩලය

1. පී.එම්. විතාන මහතා - සභාපති
2. එම්.බී. කිරිඇල්ල මහතා - සාමාජික
3. ශිරානි වීරසූරිය මිය - සාමාජික
4. එච්.ටී. කමල් පත්මසිරි මහතා - සාමාජික
5. පී. අල්ගම මහතා - සාමාජික
6. ලලින් ටී. සමරවික්‍රම මහතා - සාමාජික
7. සී. වික්‍රමසිංහ මහතා - සාමාජික
8. නිශාන්ත සෙනෙවිරත්න මහතා - සාමාජික
9. රුවන් කරුණාරත්න මහතා - සාමාජික

# විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයන්

1. පී. අල්ගම මහතා - සභාපති - අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
2. ශිරානි වීරකෝන් මිය - සාමාජික - අති. ලේකම්, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය
3. චන්ද්‍රා වික්‍රමසිංහ මහතා - සාමාජික/ කොන්සියන්ස් ද සිලෝන් හි සභාපති
4. රුවන් කරුණාරත්න මහතා - සාමාජික - M/s RWN ටෙක්නොලොජීස්

# හෝටල් වර්ගීකරණ කමිටු සාමාජිකයන්

1. අමරනාත් එස්. මහවඩුගේ මහතා - සභාපති
2. ඩේවිඩ් ඩාන් බොයිලර් මහතා - සාමාජික
3. එරාජ් අබේවර්ධන මහතා - සාමාජික
4. ගැමුණු ගුණවර්ධන මහතා - සාමාජික
5. විජිත පෙරේරා මහතා - සාමාජික
6. හිරාන් චරිත සේරසිංහ මහතා - සාමාජික
7. මහින්ද රත්නායක මහතා - සාමාජික

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
අධ්‍යක්ෂ ජනරාල්
**එම්.බී. කිරිඇල්ල මහතා**

සංචාරක සැළසුම් හා සංවර්ධනය
අධ්‍යක්ෂ
**පී.යූ. රත්නායක මහතා**

"වන් ස්ටොප්" ඒකකය
නියෝජ්‍ය අධ්‍යක්ෂ
**සිසිර වීරසේකර මහතා**

දේශීය සංචරණය හා නිකේතන කළමනාකරණය
අධ්‍යක්ෂ (වැ.බ)
**උදාන වික්‍රමසිංහ මහතා**

දේශීය සංචරණය
අධ්‍යක්ෂ
**එම්.යූ. ලියනාරච්චි**

මානව සම්පත් හා පරිශ්‍ර කළමනාකරණය
අධ්‍යක්ෂ
**එම්.යූ. ලියනාරච්චි මහතා**
**වත්සලා ප්‍රියදර්ශනී මිය**

ප්‍රමිති හා තත්ත්ව අරක්ෂණ
අධ්‍යක්ෂ (වැ.බ)
**චන්දන විජේරත්න මහතා**

මූල්‍ය කළමනාකරණය
අධ්‍යක්ෂ
**ඩී.පී. නන්දන මහතා**

තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය
අධ්‍යක්ෂ (වැ.බ)
**ඩී.පී. නන්දන මහතා**

තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය
අධ්‍යක්ෂ
**උදාන වික්‍රමසිංහ මහතා**

අභ්‍යන්තර විගණනය
අභ්‍යන්තර විගණක
**පසන්ති ජයසිංහ මිය / කේ.එම්. නහීම් මිය**

නීති කටයුතු
නීති නිලධාරී
**ඉනෝකා පුංචිහේවා මිය**

සංචාරක පොලීසිය
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී / ස්ථාන භාර අධ්‍යක්ෂ
**අර්ඩිලි පෙරේරා මහතා / ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී**




# දළ විශ්ලේෂණය

## ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ දර්ශනය

| සංචාරක පැමිණීම් - 2014 / 2015 * පළාත් | | | |
|---|---|---|---|
| මාසය | 2014 | 2015* | % Cha. 2014/15 |
| ජනවාරි | 146,575 | 156,246 | 6.6 |
| පෙබරවාරි | 141,878 | 165,541 | 16.7 |
| මාර්තු | 133,048 | 157,051 | 18 |
| අප්‍රේල් | 112,631 | 122,217 | 8.5 |
| මැයි | 90,046 | 113,529 | 26.1 |
| ජූනි | 103,175 | 115,467 | 11.9 |
| ජූලි | 133,971 | 175,804 | 31.2 |
| අගෝස්තු | 140,319 | 166,610 | 18.7 |
| සැප්තැම්බර් | 105,535 | 143,374 | 35.9 |
| ඔක්තෝබර් | 121,576 | 132,280 | 8.8 |
| නොවැම්බර් | 119,727 | 144,147 | 20.4 |
| දෙසැම්බර් | 178,672 | 206,114 | 15.4 |
| එකතුව | 1,527,153 | 1,798,380 | 17.8 |


| ආදායම් වර්ධනය | ඇ.ඩො<br>මිලියන වලින් |
|---|---|
| 2010 | 575 |
| 2011 | 839 |
| 2012 | 1,038 |
| 2013 | 1,715 |
| 2014 | 2,431 |
| 2015 | 2,980 |



## 2015 වසරේ ප්‍රමුඛතම වෙළඳපල දහය

| 2015 වසරේ ප්‍රමුඛතම වෙළඳපල දහය | | | | |
|---|---|---|---|---|
| අලෙවි ස්ථානය | අනුපිළිවෙල | 2014 | 2015 | වර්ධන වෙනස (%) |
| ඉන්දියාව | 1 | 242,734 | 316,247 | 30.3 |
| චීනය | 2 | 128,166 | 214,783 | 67.6 |
| එක්සත් රාජධානිය | 3 | 144,168 | 161,845 | 12.3 |
| ජර්මනිය | 4 | 102,977 | 115,868 | 12.5 |
| මාලදිවයින | 5 | 86,359 | 90,617 | 4.9 |
| ප්‍රංශය | 6 | 78,883 | 86,126 | 9.2 |
| ඕස්ට්‍රේලියාව | 7 | 57,940 | 63,554 | 9.7 |
| රුසියාව | 8 | 69,718 | 61,846 | (11.3) |
| ඇ.එ්.ජ | 9 | 39,371 | 47,211 | 19.9 |
| ජපානය | 10 | 39,136 | 39,358 | 0.6 |

| රටේ ප්‍රමුඛතම වෙළඳපල 10 - 2015 | |
|---|---|
| ඉන්දියාව | 316,247 |
| චීනය | 214,783 |
| එක්සත් රාජධානිය | 161,845 |
| ජර්මනිය | 115,868 |
| මාලදිවයින | 90,617 |
| ප්‍රංශය | 86,126 |
| ඕස්ට්‍ර▯ලියාව | 63,554 |
| රුසියාව | 61,846 |
| ඇඑජ | 47,211 |
| ජපානය | 39,358 |




2015 වසරේ ශ්‍රී ලංකා ප්‍රාථමික වෙළඳපල ලෙස ඉන්දියාව අඛණ්ඩව කටයුතු කලද 2014 වසර සමග සංසන්දනය කළ විට චීනය අති දැවැන්ත වර්ධනයක් (67.6%) පෙන්නුම් කර ඇත. සාම්ප්‍රදායික වෙළඳපලවල් වන එක්සත් රාජධානිය, ජර්මනිය හා ප්‍රංශ ප්‍රබල වර්ධනයක් පෙන්නුම් කර නොමැත. එසේ වුවද, රුසියාව 2014 හා සන්සන්දනාත්මකව ගත්කළ සෘනාත්මක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

### ප්‍රවේශවීමේ ඉඩ ප්‍රස්ථාවන්

ප්‍රධාන පෙලේ ගුවන් සේවාවන් 24 කට වඩා වැඩි ප්‍රමාණයක් හා යාත්‍රා මෙහෙයුම් කිහිපයක් නිරතවීම් සමඟ ම ශ්‍රී ලංකාවට ගමන් කිරීම අරඹා ඇත.

### 2015 වසරේ ගුවන් ගමන් විස්තර

එයා ඇරබියා, එයා ඉන්දියා, එයා ඒසියා එක්ස්**, එයා ඒෂියා බර්හැඩ්*, එයා චයිනා ගුවන් සේවාය, ඕස්ට්‍රේලියානු ගුවන් සේවය*, බ්‍රිටිෂ් එයාවේස්**, කැතේ පැසිෆික් එයාවේස්, නැගෙනහිර චීන ගුවන් සේවය, එමිරේට්ස්, එතිහඩ් ගුවන් සේවය, ෆ්ලයි ඩුබායි, ජෙට් ගුවන් සේවය, කොරියන් එයා, කුවේට් ගුවන් සේවය, මැලේසියානු ගුවන් සේවය, මලින්දෝ එයා*, මිහින් ලංකා, ඕමාන් එයා, කටාර් එයාවේස්, රොටානා ජෙට්,

සවුදි අරාබියානු ගුවන් සේවය, සිංගප්පූරු ගුවන් සේවය, ස්පයිස් ජෙට්, ශ්‍රී ලංකන් ගුවන් සේවය, තායි ගුවන් සේවය, තුර්කි ගුවන් සේවය.

* එයා ඒෂියා බර්හැඩ් 2015 ඔක්තෝබර් 20 වන දිනත් ඕස්ට්‍රේලියාවේ ගුවන් සේවය 2015 ඔක්තෝබර් 28 වන දිනත් සහ මලින්දො එයා 2015 දෙසැම්බර් 16 වන දිනත් මෙහෙයුම් ආරම්භ කෙරිනි.

** එයා ඒෂියා ඞ හි මෙහෙයුම් කටයුතු 2015 ඔක්තෝබර් 19 දින අත්හිටවූ අතර 2015 පෙබරවාරි මස 28 වන දින බ්‍රිතාන්‍ය ගුවන් සේවය 2015 පෙබරවාරි 28 දින නවත්වන ලදී.

## සංචාරක කාර්යසාධනය

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015* | උපයෙ-ර්ජනය 2015* |
|---|---|---|---|---|---|---|---|
| සංචාරකයිනගේ පැමිණීම | 654,476 | 855,953 | 1,005,605 | 1,274,593 | 1,527,153 | 1,798,380 | 17.8 |
| විනෝදය | 516,538 | 663,343 | 748,436 | 980,162 | 1,037,664 | 1,198,240* | 15.5 |
| ව්‍යාපාරික | 83,270 | 68,097 | 90,040 | 94,320 | 29,381 | 23,323* | (15.1) |
| අනෙකුත් | 54,668 | 124,535 | 167,129 | 200,111 | 460,128 | 576,817* | 22.9 |
| සංචාරක අමුත්තන්ගේ රාත්‍රී ගණන | 6,548 | 8,559 | 10,056 | 10,961 | 15,119 | 18,163 | 20.1 |
| කාමර අනුපාතය | 70,2 | 77.1 | 71.2 | 71.7 | 74.3 | 74.5 | 0.3 |
| දල සංචාරක ලැබිම (රුඃ මිලියන) | 65,018 | 91,926 | 132,427 | 221,720 | 317,502 | 405,492 | 27.7 |
| ඒක පුද්ගල සංචාරක ලැබිම (රුඃ මිලියන) | 99,344 | 107,393 | 131,688 | 173,954 | 207,905 | 225,476 | 8.5 |
| මුළු සේවා නියුක්තිය (ගණන) | 132,055 | 138,685 | 162,869 | 270,150 | 299,890 | 319,436* | 6.5 |
| සෘජු සේවා නියුක්තිය | 55,022 | 57,786 | 67,862 | 112,550 | 129,790 | 135,930* | 4.7 |
| ඇස්තමේන්තු කළ වක්‍රාකාර සේවා නියුක්තිය | 77,032 | 80,899 | 95,007 | 157,600 | 170,100 | 183,506* | 7.9 |

* - ඇස්තමේන්තුකළ

මූලාශ්‍ර - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සංචාරක අංශවලින් ලත් ආදායම - ඇඩො මිලියන 2,980.6
දිනක වියදම (සාමාන්‍යය) - 164.1

## සංචාරක සංවර්ධන කාර්යසාධනය

- ලොව පුරා සංචාරක කර්මාන්තය ශක්තිමත්ව ආගමනය වීමත් සමග 2015 වසරේ දී ජාත්‍යන්තර සංචාරක පැමිණීම් සියයට 4.4 ක වර්ධනයක් ලබමින් මුළු ප්‍රමාණය මිලියන 1,184 ක් බවට පත්වී ඇත. මෙය 2014 වසරේ දි සංඛ්‍යාව වූ මිලියන 1,134 සිට වැඩිවූවකි. කලාප සියල්ලේම 2015 ඉහළම වර්ධනය වූ සියයට 5.0 වාර්තා වුයේ යුරෝපයෙනි.

- 2015 වසරේ දී පැමිණීම් 1,798,380 සමග නව ඉහළ වාර්තාවක් තැබීමට ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සමත් වි ඇත. එය මෙතෙක් තම ඉතිහාසය පුරා ලැබූ ඉහළම තත්වය වන අතර පසුගිය වසරේ පැමිණීම් 1,527,153 සමඟ ගත් කළ සියයට 17.8 ක වර්ධනයකි. - 2014 වසරේ විදේශ විනිමය ඉපයීම් රුපියල් මිලියන 317,479 (ඇමෙරිකානු ඩොලර් මිලියන 2,431.1) ප්‍රමාණය සියයට 27.72 ක 2015 වසරේ දී වැඩිවීමෙන් රුපියල් මිලියන 405,492 (ඇමෙරිකානු ඩොලර් මිලියන 2,980.6)ක් බවට පත්විය.

- 2015 වසරේ දිනක සංචාරකයෙකුගෙන් ලැබෙන විදේශ විනියම (සෘ) ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් 160.8 සිට ඇමෙරිකානු ඩොලර් 164.1 දක්වා ඇමෙරිකානු ඩොලර් 3.3 කින් ඉහළ ගොස් ඇත.

- පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය වැඩිවීම නිසා, සංචාරක කර්මාන්තය ජාතික ආර්ථිකයට 2015 වසරේ විශාලතම විදේශ විනිමය උපයා දෙන්නා බවට පත්විම හේතුකොටගෙන තම හිමි ස්ථානය තෙවන මට්ටම දක්වා අධිශ්‍රේණි ගත කිරීමට හැකි විය. සංචාරක කර්මාන්තයට ඉක්මවා ගිය අංශ වනුයේ රු.

බිලියන 948.95 ක් සපයා දුන් විදේශ සම්ප්‍රේෂණ සහ රු. බිලියන 654.79 ක් ලබා දුන් රෙදිපිළි හා ඇඳුම් ය. සංචාරක කර්මාන්තය මගින් විදේශ විනිමය ඉපයීම් සඳහා 2015 වසරේ දී ලබා දුන් දායකත්වයේ ප්‍රමාණය සියයට 12.4 ක් විය.

- ගතවූ වසර වල මෙන්ම, සංචාරකයන් 316,247 සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවට පැමිණීමත් සමඟ ඉන්දියාව සංචාරක කර්මාන්තයේ ප්‍රධාන දායකයා බවට පත් වී ඇති අතර එය සමස්ත ආගමන ප්‍රමාණය සියයට 17.6 කි. සංචාරක පැමිනීම් වල සැලකිය යුතු වර්ධනයක් ඇති කිරීමට සමත් වූ චීනය දෙවන ස්ථානයටත් 2014 වසරේ දි දෙවන ස්ථානයේ රැදී සිටි එක්සත් රාජධානිය 2015 දි තෙවන ස්ථානයට පත් විය.

## ජගත් සංචාරක සන්දර්භය

ලොව වටා ස්ථාන වලින් පැමිණෙන ජාත්‍යාන්තර සංචාරක පැමිණීම් ප්‍රමාණය 2015 වසරේ දි මිලියන 1,184 ක් වෙමින් පසුගිය වසර වඩා සියයට 4.4 ක වර්ධනයක් ලබා ඇත. මිලියන 51 ට වැඩි සංචාරකයන් ප්‍රමාණයක් සංචාරය කිරීම නිසා සමස්ත ඉල්ලුම් අධික වි ඇත. 2010 වසරේ පශ්චාත් අර්බුදයෙන් පසු සෑම වසරකම අන්තර්ජාතික පැමිණීම් සියයට හතරක හෝ ඊට වැඩිවීමත් සමඟ අසාමාන්‍ය වර්ධනයක් ඇති අඛණ්ඩ 6 වන වසර ලෙස 2015 සැලකෙන අතර එම වසරේ දී ජාත්‍යන්තර සංචාරකයන් ඉතා ඉහළම අගයක් ගත් වසර බවටද පත් විය. මෙම අංශයේ ඉහළ කාර්යසාධනය මගින් ලෝකයේ බොහෝ රටවල ආර්ථික වර්ධනයට හා රැකියා උත්පාදනයට දායකත්වයක් සපයයි. ඒ අනුව, ප්‍රවාහන පහසුකම් සැපයීම, මානව සම්පත් සංවර්ධනය හා තිරසාරත්වය ඇතුළුව සංචාරක කර්මාන්තයේ අඛණ්ඩ වර්ධනය ශක්තිමත් කරන ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීමට එය රටවල්වලට තීරණාත්මක වේ. කලාප වශයෙන් ගත් කළ යුරෝපය, ඇමෙරිකාව, ආසියාව හා පැසිෆික් යන සියල්ල 2015 වසරේ දී සියයට පහක පමණ වර්ධනයක් ලබා ඇත. මැද පෙරදිග වෙත පැමිණීම් සියයට තුනකින් වැඩි වි ඇති අතර දත්ත නිසි ලෙස ලබා ගත නොහැකිවීම තත්වය තුලද අප්‍රිකාව කලාපයේ සංචාරක පැමිණීම් වලින් තුනෙන් දෙකකට වැඩි ප්‍රමාණයක හේතු වන උතුරු අප්‍රිකාවේ අසාර්ථකත්වයන් ප්‍රධාන ලෙස හේතුකොට සියයට තුනක පසුබැසීමක් පෙන්නුම් කරයි.

ලොව පුරා ඇති ස්ථාන වල සිට ජාත්‍යන්තර සංචාරක පැමිණීම් ප්‍රමාණය 2015 වසරේ දී ජාත්‍යන්තර පැමිණීම් වල 4.4% ක වැඩිවිමට සමගාමිව 3.6% ක් වර්ධනය විමක් සිදු වී ඇත. ජාත්‍යන්තර සංචාරක කර්මාන්තයෙන් ලැබුණු සමස්ත අපනයන වටිනාකම ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන 1.4 ක් වි ඇත. ජාත්‍යන්තර සංචාරකයන් සඳහා නවාතැන්, ආහාර පාන, විනෝදාස්වාදය, භාණ්ඩ මිලදි ගැනිම සහ වෙනත් සේවා ලබාදීම මගින් 2015 වසරේ දි ඇස්තමේන්තුගත ඉපයූ ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 1232 කි. ලොව පුරා ජාත්‍යන්තර සංචාරක පැමිණීම් වල සියයට 36.3 ප්‍රමාණයක් ඉසිලූ යුරෝපීය සංචාරක ඉපයීම් වලින් සැබැවින්ම අත්කර දුන් ඉපයීම ඇමෙරිකානු ඩොලර් බිලියන 64.8 ට සීමා විය. ආසියාව හා පැසිෆික් රටවල් (34%) ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2 කින් අඩු වි සමස්ත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 418.9 ක් විය. මැදපෙරදිග රටවල් (4.4%) වල සංචාරක පැමිණීම් ප්‍රමාණය ඇස්තමේන්තුගත ඇමෙරිකානු ඩොලර් බිලියන 3.1 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 54.6 දක්වා වැඩි වූ අතර අප්‍රිකාව (2.7%) ඇමෙරිකානු ඩොලර් බිලියන 3 කින් අඩු වී ඇමෙරිකානු ඩොලර් බිලියන 33.2 තෙක් පසු බැසීය.

# දෙපාර්තමේන්තුමය කාර්යසාධනය

## 7.1 පර්යේෂණ සහ ජාත්‍යන්තර සබඳතා

පර්යේෂණ හා සංඛ්‍යාලේඛන කාර්යක්ෂමව ඒකරාශි කිරීමේ වගකීම ශ්‍රීලංසංසං අධිකාරියේ පර්යේෂණ හා ජාත්‍යන්තර සබඳතා අංශය වෙත පැවරෙන්නකි. ඊට අමතරව, පුළුල් වෙළඳපල පර්යේෂණ අඛණ්ඩව සිදු කිරීමත්, අධ්‍යයන පැවැත්වීමත්, දුබලතා හඳුනා ගැනීමත් සහ අදාළ දෙපාර්තමේන්තු වලට තොරතුරු ලබා දීමත් සිදු කරමින් පවතී.


ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංචාරක කර්මාන්තයට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා කාලීන පර්යේෂණ සමීක්ෂණ පවත්වන අතරතුර සංචාරක පැමිණීම්, දේශීය ගමනාගමනය සහ නිෂ්පාදන හා සේවා පහසුකම් ද නිරීක්ෂණය කරනු ලබයි. පර්යේෂණ හා ජාත්‍යන්තර අංශය සහ තොරතුරු හා තාක්ෂණික අංශය (ICT) විසින් ශ්‍රී ලංකාවෙන් පිටත්වන විදේශීය සංචාරකයන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට අවශ්‍ය කරන ඉලෙක්ට්‍රොනික් මෙවලම සහිත ඉලෙක්ට්‍රොනික් මේසය මත තබන ටච් ස්ක්‍රීන් හඳුන්වා දීමට කටයුතු යොදා ඇත. (Touch Screen) මෙකී යන්ත්‍ර කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ සවි කෙරෙනු ඇත. සමුගන්නා සංචාරකයන්ගෙන් සෘජුව අදහස් ලබා ගැනීමට මෙය උපකාරී විය හැකි අතර එම දත්ත සංචාරක අංශයේ හා කර්මාන්තය දියුණු කරලීම සඳහා ඇති ගැටලු හඳුනා ගැනීමට මග පාදනු ඇත.





සංචාරක කර්මාන්තයට අදාළ සංඛ්‍යාමය දත්ත පිළිබඳ විස්තීර්ණ ප්‍රකාශනයක් නිරතුරුව ඉදිරිපත් කෙරේ. PATA, UNWTO සහ කලාපීය සංචාරක සංස්ථාව වැනි ජාත්‍යන්තර සංවිධාන සමඟ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ඇති කර ගෙන ඇති සබඳතා සාර්ථකව පවත්වාගෙන යන අතර විවිධ ජාත්‍යන්තර හා කලාපීය සමුළු හා උත්සව වලට සහභාගිවීම අනිවාර්ය ලෙස සිදුවේ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කලින් කල මාසික දත්ත ප්‍රකාශනයක් එළිදක්වන අතර, සංචාරක පැමිණීම්, විදේශ විනිමය ඉපයීම්, රැකියා අවස්ථා ඇති කිරීම් සහ හෝටල්වල නවාතැන් ගැනීමේ අනුපාත ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ කාර්යසාධනය හුවා දක්වන වාර්ෂික සංඛ්‍යාමය වාර්තාව පල කරයි.

**පලකළ සංඛ්‍යාලේඛනමය වාර්තා**




ගුවන්තොටුපොල සමීක්ෂණ වාර්තාව - 2016



වාර්ෂික සංඛ්‍යාලේඛණ වාර්තාව



මාසික සංඛ්‍යාලේඛණ සංග්‍රහය

** 2015 වාර්ෂික සංඛ්‍යාලේඛණ වාර්තාවේ අවසන් වාර්තාව මුද්‍රණය කරන ලදී.
** 2015 ගුවන්තොටුපල සමීක්ෂණ අවසන් වාර්තාව මුද්‍රණය කර බෙදාහැරින ලදී.
** ඉලෙක්ට්‍රොනික් පද්ධති සමීක්ෂණය හදුන්වා දෙනු ඇත.
** පර්යේෂණ හා සංඛ්‍යාමය තොරතුරු මාසික පදනම මත www.sltda.lk/statistics යන වෙබ් අඩවිය වෙත ලබා දේ.

**ගුවන් තොටුපල පිටවුම් සමීක්ෂණය - 2015/2016**





ශ්‍රී ලංකාවෙන් පිටත්වන විදේශිය සංචාරකයන් පිළිබඳ ගුවන් තොටුපල සමීක්ෂණය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ පර්යේෂණ හා ජාත්‍යන්තර සබඳතා අංශය මගින් පැවැත්විය. එබැවින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ලොව පුරා ප්‍රවර්ධනය කිරීම හා ජනප්‍රිය කරවීම සදහා ශ්‍රී ලංකාවේ ඒ පිළිබඳව සමීක්ෂණ පැවැත්වීම වැදගත් වේ. සැළසුම්කරණය, සේවා උසස්වීම්, අලෙවිකරණය වැනි ක්ෂේත්‍ර වලදී තීරණ වලට එළැඹීමේදීත් සංචාරක අංශයන්ට බලපාන ඉදිරි අලෙවිපල ශක්තිමත් කිරීම සඳහා සමීක්ෂණ ප්‍රතිඵල වාර්තා පුද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකටම වැදගත් වේ.

එම 2015 ගුවන්තොටුපල සමීක්ෂණ වාර්තාව මුද්‍රණය කර බෙදා හරින ලදී. 2016 වසර සඳහා වූ ගුවන් තොටුපල පිටවුම් සමීක්ෂණය යටතේ පිටත්ව යන සංචාරකයන් ආසන්න වශයෙන් 6000 ක නියැදියක් ලෙස ගෙනත් සංක්‍රාන්ත වන මගීන් 2000 ක නියැදියක් ඉංග්‍රිසි, ජපන්, ප්‍රංශ, කොරියන්, චින, රුසියන්, හින්දි හා ජර්මන් භාෂාවන්ගෙන් නිපුන සම්මුඛ පරීක්ෂක කණ්ඩායමක් මගින් ව්‍යුහාත්මක ප්‍රශ්ණාවලියක් මගින් වාචිකව පරීක්ෂණයකට ලක් කිරීමට බලාපොරොත්තු වේ. මෙම සමීක්ෂණය 2016 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ දී පැවැත්වේ.

**ජාත්‍යන්තර සබඳතා**

**<u>PATA වාර්ෂික සමුළුව - 2015 අප්‍රේල් 23 සිට 26 තෙක් චීනයේ සිෂුවාන් ලෙෂාන් හි</u>**

PATA වාර්ෂික සමුළුව 2015 චීනයේ සිෂුවාන් හි ලෙෂ්න් හොං ටිෂු හෝටලයේ 2015 අප්‍රේල් මස 23 සිට 26 දක්වා පැවැත්වුනි. පැසිෆික් ආසියානු සංචාරක සංගමය (PATA) විසින් සංවිධනය කළ හා ලෙෂාන් නාගරික ජනතා රජයේ සම අනුග්‍රහය යටතේ පැවති උළෙල සඳහා සිෂුවන් පළාත් සංචාරක පරිපාලන සභාව හා සිෂුවන් පළාත් මහජන රජයේ විදේශ කටයුතු කාර්යාලය සහාය දැක්විය.

ශ්‍රී ලකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති පී.එම්. විතාන මහතා උක්ත සමුළුවට හා පහත දැක්වෙන රැස්වීම් වලට සහභාගී විය.

i. උරුම හා සංස්කෘතික සංචාරක කර්මාන්තයේ නව දිශානතිය පිළිබඳ සමුළුව
ii. PATA රජයේ කමිටු රැස්වීම

iii. PATA අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම
iv. PATA වාර්ෂික මහසභා රැස්වීම (AGM)

**<u>අරාබි හෝටල් ආයෝජන සම්මන්ත්‍රණය (AHIC) - 2015 මැයි 5 සිට 7 දක්වා ඩුබායි හි මැදිනත් ජුමේරියා</u>**

අරාබි හෝටල් ආයෝජන සම්මන්ත්‍රණය (AHIC) 2015 මැයි මස 5 සිට 7 දක්වා ඩුබායි හි දී පැවැත්විනි. කලාපයේ වඩාත් පළපුරුද්දක් සහිත හෝටල් ආයෝජකයන්, සංවර්ධකයන්, මෙහෙයවන්නන් හා උපදේශකවරු සඳහා අරාබි හෝටල් ආයෝජන සම්මන්ත්‍රණය 2015 යනු මැද පෙරදිග වාර්ෂික එකමුතුව ලෙස සැළකේ.

මැද පෙරදිග සිදු වන මෙම කුඩා පරිමාණ උළෙල තුල අපගේ මේ වසරේ න්‍යායපත්‍රය ඉදිරිපත් කරලීමටත් නව උණුසුම් තේමාවන්ගේ සිට මෘදු කරුණු මෙන්ම කලාපීය වෙළඳපලවල් කර්මාන්තය තුල මුහුණ දෙන අභියෝග විසදා ගැනීමට උපකාරී වන්නකි. මේ වසරේ න්‍යාය පත්‍රය තුල අඩංගු ප්‍රධාන කරුණු වන්නේ:

- WASL වත්කම් කළමනාකරණ ප්‍රධාන විධායක නිලධාරී අතිගරු හෙෂාම් අබ්දුල්ලා අල් ක්වසිම් මැතිතුමා සමඟ සම්මුඛ සාකච්ජාවක්
- ට්‍රම්ප් සංවිධානයේ සංවර්ධනය හා අත්පත්කර ගැනීම් පිළිබඳ විධායක උප සභාපතිවරයා වන ඉවන්කා ට්‍රම්ප් සමඟ ගැඹුරින් සාකච්ජා කිරීම
- මැරියට් ඉන්ටර්නැෂනල් හි සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි ආන් එම් සොරෙන්සන් සමඟ පුළුල් සංවාද සැසියක් පැවැත්වීම

සංචාරක හා ක්‍රීඩා අමාත්‍ය ගරු නවීන් දිසානායක මහතා සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති පී.එම්. විතාන මහතා උක්ත සමුළුවට සහභාගී වූහ.

**<u>ආසියා-පැසිෆික් කොමිෂන් ද්විත්වයේ 27 වන ඒකාබද්ධ රැස්වීම ) පුළුල් සමාජ ආර්ථික සන්දර්භයක සංචාරක කර්මාන්තය ඔසවා තැබීම පිළිබඳ UNWTO කලාපීය අමාත්‍යවරුන්ගේ සමුළුව - මාලදිවයින් ජනරජයේ බැන්ඩොස් දිවයිනේ රිසෝට් හා ස්පා හි දී - 2015 ජුනි 3 සිට 5 දක්වා</u>**

සංචාරක කර්මාන්තය පුළුල් සමාජ ආර්ථික සන්දර්භයකට ලක් කිරීම පිළිබඳව එක්සත් ජාතින්ගේ ලෝක සංචාරක සංවිධානය (UNWTO), අග්නිදිග ආසියාව සඳහා වන කොමිසම (CAP) සහ අග්නිදිග ආසියාව සඳහා වන UNWTO කොමිසම (CSA) & UNWTO කලාපීය අමාත්‍යවරුන්ගේ සමුළුවේ 27 වන ඒකාබද්ධ රැස්වීම මාලදිවයිනේ දී 2015 ජුනි 3 සිට 4 දක්වා බැන්ඩොස් දිවයිනේ නිකේතන හා ස්පා හි පැවැත්විනි. අග්නිදිග ආසියානු හා දකුණු අප්‍රිකානු රටවල් කොමිසම් රැස්වීම නියෝජනය කළ අතර ඒ හා සම්බන්ධිත සාමාජිකයන් හා විවිධ ජාත්‍යන්තර සංවිධාන ඊට සහභාගී විය.
මෙහි ශ්‍රී ලාංකික දූත පිරිස වූයේ

1. ගරු වසන්ත සේනානායක මහතා, සංචාරක හා ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා
2. ශිරානි විරකෝන් මිය, අතිරේක ලේකම්, සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය
3. පි.එම්. විතාන මහතා, සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
4. එම්.බී. කිරිඇල්ල මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය





**සංචාරක කර්මාන්තය පිළිබඳ සාක් ක්‍රියාකාරී කණ්ඩායමේ 5 වන රැස්වීම - 2015 නොවැම්බර් 24 සිට 26 දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර දී**

සංචාරක කර්මාන්තය පිළිබඳ සාක් ක්‍රියාකාරී එකමුතුවේ පස් වන රැස්වීම ඉන්දියන් රජය, සංචාරක අමාත්‍යාංශය ඒකාබද්ධව SAARC සංවිධානය විසින් 2006 වසරේ දී නේපාලයේ පැවති අවසාන රැස්වීමට දිගු කාලයකට පසුව 2015 නොවැම්බර් 25 සිට 26 දක්වා නව දිල්ලියේ දී සාර්ථකව සංවිධානය කර තිබුනි. මෙහි ශ්‍රී ලාංකික දූත පිරිස වූයේ

1. ශිරානි වීරකෝන් මිය, අතිරේක ලේකම්, සංචාරක හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය
2. එම්.බී. කිරිඇල්ල මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
3. දේවේන්ද්‍ර සේනාරත්න මහතා, සභාපති, ශ්‍රී ලංකා අභ්‍යන්තරික සංචාරක සංවිධායකයන්ගේ සංගමය (SLAITO)
4. කුමුදු එරමුදුගල්ල මහතා, ශ්‍රී ලංකා සංචාරක නියෝජිත සංගමයේ නියෝජිතයා (TAASL)







**සංස්කෘතික සංචාරක සමුළුව, සෝල් නුවර, දකුණු කොරියාව - 2015 නොවැම්බර් 9 සිට 10 තෙක්**

කොරියාවේ සංස්කෘතික, ක්‍රීඩා සහ සංචාරක අමාත්‍යාංශය සහ කොරියානු සංචාරක සංගමය එක්ව "2015 සංස්කෘතික සංචාරක සම්මන්ත්‍රණය හා කොරියා මිත්‍ර රටවල වල සංචාරක නායකයන් සඳහා පුහුණු වැඩසටහන" සංවිධානය කෙරිනි. පුහුණු වැඩසටහනට පසුව ඇරඹි සමුළුව 2015 නොවැම්බර් 9 සිට 10 තෙක් පැවැත්වුනි.

වැඩසටහන තුල ප්‍රධාන ලෙස "සංස්කෘතික සංචාරක එකමුතුව" ඇතුලත් විය. සමුළුව සියළුම සහභාගීවන්නන් හට විවෘත එකක් වූ අතර පුහුණු වැඩසටහන රාජකාරි වල නිරත නිලධාරීන් හා කාර්මික නිලධාරීන් වෙනුවෙන් පමණක් පැවැත්විනි. ශ්‍රී ලංකා නියෝජිත පිරිසට පහත සඳහන් සාමාජිකයන් ඇතුළත් විය.

i. එම්.බී. කිරිඇල්ල මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - දූත පිරිසේ ප්‍රධානී

ii. බී.එන්. මහවිතානගේ මිය, සහකාර අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

iii. එච්.එම්.පී. පුෂ්පකුමාර මහතා, සහකාර අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

iv. කෝසල ගමගේ මහතා, ජ්‍යෙෂ්ඨ විධායක, සීමා. ඇල්ෆා ට්‍රැවල් ) හොලිඩේස් (පුද්.) සමාගම

v. ඉයන්ත අබේසිංහ මහතා, ආහාර පාන කළමනාකරු, ද කිංග්ස්බරි හෝටලය

මෙම සමුළුවේ අරමුණ සංචාරක සංවර්ධනයට සහාය දැක්වීම හා කොරියානු සංචාරක කර්මාන්තයේ යහපත් අත්දැකීම් බෙදා හදා ගැනීම මගින් සංචාරක විශේෂිත තරගකාරී තත්වයන් ශක්තිමත් කරලීමයි.







**<u>සේද මාවත සංචාරක කර්මාන්තය පිළිබඳ 7 වැනි UNWTO ජාත්‍යන්තර හමුව හා 2015 ජුනි 18 සිට 20 දක්වා චීනයේ ෂියැන් හි පැවති සේද මාවත ආර්ථික තීරුව පිළිබඳ සංචාරක අමාත්‍යවරුන්ගේ 1 වන රැස්වීම</u>**


සේද මාවත සංචාරක කර්මාන්තය පිළිබඳ 7 වන UNWTO ජාත්‍යන්තර රැස්වීම හා සේද මාවතේ ආර්ථික තීරය පිළිබඳ  සංචාරක අමාත්‍යවරුන්ගේ මංගල හමුව 2015 ජුනි 18 සිට 30 දක්වා චීනයේ සියැන් හි දී පැවැත්විනි.   ශ්‍රී ලාංකික දූත පිරිස පහත පරිදි විය.

1. පී. එම්. විතාන මහතා, සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - දූත පිරිසේ ප්‍රධානී
2. උමා නිරන්ජන් මිය, සැළසුම් /අධ්‍යක්ෂ, සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය

සංචාරක, උරුමයන් කළමනාකරණය, අලෙවිය හා සංවර්ධනය යන ක්ෂේත්‍රවල සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා ප්‍රවීනයන් ඒකරාශී කරමින් මෙම රැස්වීම UNWTO, චීන ජාතික සංචාරක පරිපාලනය (CNTA) හා ෂාන්සි පළාතේ මහජන රජය ඒකාබද්ධව සංවිධානය කෙරිනි.

පැවති වැඩසටහනේ ප්‍රධාන අංගයක් වූයේ සේද මාවත ආර්ථික තීරුවේ ඇති රටවල් වල සංචාරක අමාත්‍යවරුන්ගේ මංගල රැස්වීමයි. මෙම අනභිබවනීය උත්සව සභාවට යුරෝපය, ආසියාව හා මැදපෙරදිග රටවල අමාත්‍යවරුන් සේද මාවතේ ආර්ථික තීරුවට අයත් සංචාරක සංවර්ධනයට එල්ල වී ඇති ප්‍රධාන ගැටලු එකට හමු වී සාකච්ඡා කිරීමට අවස්ථාව උදා විය.

**ජගත් සංචාරක දිනය 2015 - 2015 සැප්තැම්බර් 27**



සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානු ආගමික කටයුතු අමාත්‍යාංශය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ඇතුළු වෙනත් සම්බන්ධිත ආයතන සමඟ එක්ව සැප්තැම්බර් 27 යෙදෙන ජගත් සංචාරක දිනය සැමරීමට අවශ්‍ය සියලු කටයුතු සූදානම් කෙරිනි. නව පාලනයත් සමඟ නැවුම් සංචාරක යුගයක අඩහැරය රට වෙලා ගන්නා අවස්ථාවක "සංචාරකයන් බිලියනක්, අවස්ථා බිලියනයක්" යන තේමාව යටතේ ජගත් සංචාරක දිනය සැමරීම ඉතාමත් කාලීන කරුණකි.

ජගත් සංචාරක දිනයේ ආරම්භක උළෙල සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානු ආගමික කටයුතු අමාත්‍ය ගරු ජොන් අමරතුංග මැතිතුමාගේ හා නියෝජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 26 වන සෙනසුරාදා පෙ.ව. 8 ට කොළඹ දී පැවැත්විනි.






මේ අතර, "සංචාරකයන් බිලියනක්, අවස්ථා බිලියනයක්" යන තේමාව යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සංවිධානයකළ සම්මන්ත්‍රණයක් සැප්තැම්බර් 26 දින පෙ.ව. 8.30 ට සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ දී පැවැත්විනි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතා මෙහි ප්‍රධාන දේශනය පැවැත්වූ අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති පී.එම්. විතාන මහතා, සිට්‍රස් ලෙෂර් සමාගමේ සභාපති ප්‍රේමා කුරේ මහතා සහ ජෙට් විං හෝටල් සමූහයේ සභාපති හිරාන් කුරේ මහතා ප්‍රධාන සහභාගීවන්නන් ලෙස කටයුතු කළේය.

ජගත් සංචාරක දිනයට සමගාමීව "සංස්කෘතික උරුම සංචාරක කර්මාන්තය" පිළිබඳ ඡායාරූපමය ප්‍රදර්ශනයක් සැප්තැම්බර් 26 සිට 28 දක්වා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) (ශ්‍රී.ල.සං.හෝ.ක.ආ) බිම් මාලයේ දී පැවැත්විනි.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සහාය ඇතිව ජගත් 2015 සංචාරක දිනය සැමරීමට ප්‍රාදේශීය ලෙස කටයුතු සංවිධානය කෙරිනි.

**"පින්නවල එක්ස්ප්‍රස්" දියත් කෙරේ**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා ඊබට් සිල්වා හොලිඩේස් සමාගම සමඟ එක්ව කොළඹ සිට පින්නවල අලි අනාථාගාරය තෙක් සංචාරක බස් සේවාවක් දියත් කෙරිනි. මෙම සේවාව සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මහතා විසින් සැප්තැම්බර් 26 දින ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ පරිශ්‍රයේ දී සැප්තැම්බර් 27 යෙදන ජගත් සංචාරක දිනය සමරමින් සිදු විය.

අධිවේගී පින්නවල එක්ස්ප්‍රස් යනු කොළඹ සිට දිවයිනේ තෝරාගත් සිත්කලු ස්ථාන හා ගමනාන්තයන් වෙත සුවපහසු ගමන් සේවා සඳහා ඇති දැඩි අවශ්‍යතාවය සාක්ෂාත් කරන එම සේවාවේ පළමුවැන්නයි. පින්නවල අලි අනාථාගාරය යනු වනය තුල අවතැන්වූ හෝ තුවාල ලත් එහෙත් නවාතැන් හා සත්කාර ලබා දෙන විවිධ වයස් වල ආසියානු අලින්ට වාසස්ථානය සපයන දේශිය හා විදේශිය යන දෙවර්ගයේම සංචාරකයන් අතර ජනප්‍රිය සංචාරක ස්ථානයකි.




## 7.2 සංචාරක සැළසුම් හා සංවර්ධනය

(1) කල්පිටිය ඒකාබද්ධ සංචාරක නිකේතනය, කල්පිටිය

කල්පිටියේ ඩච් බේ නිකේතනය අක්කර 4133 ක සමස්ත බිම් ප්‍රමාණයක් පුරා සංචාරක, කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය ආවරණය වන ඒකාබද්ධ සංවර්ධන මූලස්ථානයක් වනු ඇත. නිකේතනය තුල ඕලන්ද බොක්ක, පෘතුගීසි බොක්ක සහ කාරතීවු, ඉපන්තීවු, පෙරියආරච්චි, ඉරමතිව්, සින්නෙරාච්චිල, ඔඩ්ඩකරතීවු, බත්තලන්ගුන්ඩුව, පල්ලියවත්ත, වෙල්ල යනාදී ඉතා අයස්කාන්ත දූපත් අන්තර්ගත වේ. විල්පත්තු අභය භූමිය, මුන්දලම කලපුව, පුත්තලම කලපුව සහ කල්පිටිය කලපුව ඉතාමත් සමීපව පිහිටා ඇති නිකේතනය කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලට ද සමීපව පිහිටා ඇත. එහි ඇති ප්‍රධාන සංචාරක සිත් ඇදගන්නා දෑ අතර මුහුදු වෙරළවල්, ජීවමාන කොරල් පර, තල් මසුන් හා ඩොල්පින් නැරඹීම, කුරුල්ලන් නැරඹීම, වන සතුන් හා නැව්වල සුන්බුන් දැක බලා ගැනීම වැනි දෑ අඩංගු වේ.


කල්පිටියේ කොරල් පර


කල්පිටියේ ඩොල්ෆින් මාළු


කල්පිටියේ කොරල් පර


රළ පැදීම - කල්පිටිය

2015 වසරේ දෙසැම්බර් අවසානය දක්වා පහත දැක්වෙන කාර්යයන් හා ක්‍රියාකාරකම් ඉටු කර ඇත.

**වෙල්ලදිව්යින (සීමා. සන් රිසෝට් ලංකා (පුද්.) සමාගම)**

(a) වෙල්ලදිව්යින තුල ජලජ බංගලා 4 ක ඉදිකිරීමටත් ඒවා එක් වසරක කාලයක් අධීක්ෂණය කිරීමට 2013 දී වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව "සන් රිසෝට්" වෙත අවසර දී ඇත. ඉන් අනතුරුව, පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරයා දිය පිරවූ මෙට්ට සහිත ඇදන් භාවිතා කිරීමට තම අනුමැතිය ලබා දී ඇත.

**ඉප්පන්තිවු දිව්යින (සීමා. ක්යුබ් ලංකා ලෙෂර් (පුද්.) සමාගම)**

(a) ඉප්පන්තිවු දිව්යින තුල ධීවර ප්‍රජාව සඳහා අක්කර 10 ක් බෙදාදීම සිදු වෙමින් පවතී. ගැමි ප්‍රජාවට අවශ්‍ය සියළු දෑ සැපයීමට ආයෝජකයා එකඟ විය.

(b) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය/ සීමා. ක්යුබ් ලංකා (පුද්.) සමාගම හා රජයේ නියෝජිතයා අතර ත්‍රෛපාර්ශ්වීය ගිවිසුම සාච්ඡාවට ලක් කර අවසන් කර ඇත.

(c) 2015 සැප්තැම්බර් මස දී ආයෝජකයෙකු විසින් ලබා දුන් ධීවර ගම්මානය සඳහා සංවර්ධන සැළැස්ම යෝජනා වී ඇත.

(d) ජනයා හා සාකච්ජා කර ඔවුන්ගේ අදහස් ලබා ගැනීම සඳහා 2015 ඔක්තෝබර් 14 දින ගරු මයිකල් පියතුමා වෙත සැළසුම් භාර දෙන ලදී.

(e) ඉදිරියේ දි මෙහි කැමැත්තක් දක්වන පිරිසට රැකියා කිරීමට (දිව්යින තුල ජීවත්වී) හැකි වන ලෙස හෝටල් පාසැලේ පුහුණුවීම සඳහා තරුණයන් හදුනා ගන්නා ලෙස ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් දිස්ත්‍රික් ලේකම්වරයාට දන්වා ඇති වුවද මෙතෙක් ඒ පිළිබඳව කිසිදු ප්‍රතිචාරයක් මෙතෙක් ලැබී නැත.

(f) 2015.05.18 දින පැවති කැබිනට් අනු කමිටුව 2015 වසරේ සිට වසර 50 ක් බදු දීමට එකඟ විය. 99 වසරක කාලයක් ලබා දෙන ලෙස 2015 ඔක්තෝබර් 29 වන දින පැවති රැස්වීමේ දී ආයෝජකයෙකු විසින් ඉල්ලා සිටි අතර රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු කරන ලෙස ද දැනුම් දුනි.

**උච්චමුනි දූපත**

(a) උච්චාමුනි දූපත සඳහා ස්විස් ජාතික ආයෝජකයෙකුගෙන් 2014 අග භාගයේදී ලැබුණු යෝජනාව සඳහා තීරණයක් ගැනීමට මේ වන විට ආර්ථික අනු කමිටුව වෙත යොමු කර ඇත.

**පොදු**

(a) ඉඩම් ලබා ගැනීම සඳහා ආයෝජකයන් විශාල ප්‍රමාණයක් ප්‍රදේශය පරීක්ෂා කර ඇත. සියළුම ආයෝජකයන්ගේ තම යෝජනා පිළිබඳව තීරණ ගැනීමට පෙර යටිතල පහසුකම් පිළිබඳව උනන්දුවෙන් පසුවේ.

**(1) කුච්චවේලි**

කුච්චවේලි සංචාරක නිකේතන සංවර්ධන ව්‍යාපෘතිය යනු උතුරු නැගෙනහිර පළාතේ සාලාපයාරු පාලම හා ඉරක්කන්ඩි පාලම අතර පිහිටා ඇති ඉතාමත් වාසිදායක නිකේතන ව්‍යාපෘතියකි. මෙම නිකේතනයේ මුළු ප්‍රදේශය හෙක්ටයාර් 206.45 (අක්කර 510) ක් වන අතර එහි පිහිටීම අනුව කොටස් නවයකට (09) බෙදා ඇත. 2010 සැප්තැම්බර් 17 දිනැති අංක 1671/29 දරණ ගැසට් නිවේදනය මගින් සංචාරක කලාපයක් ලෙස මෙම ප්‍රදේශය ප්‍රකාශයට පත් කර ඇත.

ත්‍රිකුණාමලයට කිලෝ මීටර් 18 ක් පමණ දුරකින් පිහිටි මෙම ස්ථානය ගිරිහඬුසෑය පුරාවිද්‍යා අංගනය, පුල්මුඩේ ඛණිජ නිධිය, කෝනේස්වරම් හින්දු කෝවිල, කින්නියා උණු දිය උල්පත්, මිනිසා විසින් සැකසූ දිගම පාලම, ස්වභාවික වරාය, මාබල් මුහුදු වෙරළ වැනි ප්‍රධාන සංචාරක මධ්‍යස්ථාන වලට සමීපව පිහිටා ඇත. උක්ත ස්ථාන වලට අමතරව ජීවී කොරල් පර, තල් මසුන් හා ඩොල්ෆින් නැරඹීම වැනි ප්‍රධාන සංචාරක සිත්ග න්නා දෑ මේ අතර වේ. ප්‍රධාන ගුවන් තොටුපල කටුනායක පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල වන අතර අභ්‍යන්තර ගුවන් සේවා මගින් විනාඩි 45 කින් ළඟා වීමේ හැකියාව ඇත.





කුච්චවේලි ඉඩම

2015 දෙසැම්බර් අවසානය වන විට පහත දැක්වෙන කාර්යයන් හා ක්‍රියාකාරකම් අවසන් කර තිබුනි.

(a) පහත නම් සඳහන් ඉඩම් අක්කර 30 (30 A) ක් ආයෝජකයන් දෙදෙනෙකු විසින් වෙන් කර ගෙන ඇත.
  (1) සීමා. ජන්ගල් බීච් රිසෝට් (පුද්.) - අක්කර10
  (2) සීමා. මිෆා හොටෙල් ඇන්ඩ් රිසෝර්ට්ස් - අක්කර 10

- සීමා. ද ජන්ගල් බීච් රිසෝට් (පුද්.) සමාගම විසින් කාමර 40 ක හෝටලයක් ඉදිකර 2012 ජුනි 22 වන දින විවෘත කෙරිනි.

ජංගල් බීච් රිසෝට්

- සීමා. මිෆා හොටෙල් ඇන්ඩ් රිසෝර්ට් මූලික ගෙවීම් කර තිබුනද ඉදිකිරීම් කටයුතු මෙතෙක් අරඹා නොමැත.

(a) දැනට සිටින ආයෝජකයන් හට ප්‍රති ආයෝජන කිරීමේ අවස්ථාවන් පිළිබඳව සළකා බැලීමට කැබිනට් අනුමැතිය ලබා දී ඇත.

(b) සීමා. MJF හෝල්ඩිංස් (පුද්.) සමාගමට අක්කර 11.5 ක බිම් ප්‍රමාණයක් කල් බදු ලෙස ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත.

(c) අසල පිහිටි අක්කර 05 ක භූමිය සීමා, ජන්ගල් බීච් රිසෝට් (පුද්.) සමාගම වෙත භාර දී ඇති අතර ඒ අනුව ව්‍යාපෘතිය කලට වේලාවට නිම කිරීමට කැබිනට් තීරණයක් ලබා දී ඇත.

(d) අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඉල්ලීම පරිදි ඉඩම් වල විස්තර සියල්ල ලබා දි ඇත. තරුණ සභාව විසින් එම ප්‍රදේශයේම ව්‍යාපෘතියක් ඇරඹීමේ අදහසක් ද ඇත. ඉදිරි කටයුතු කිරීමට පෙර ප්‍රගතිය සොයා බලන ලෙස සභාපතිවරයා උපදෙස් දී තිබේ.

ජංගල් බීච් රිසෝට්

**(2) යාල වනජීවී නිකේතනය වැඩිදියුණු කිරීම**

පලටුපාන යනු වන සතුන්ට ඇලුම්කරන්නන්ගේ පාරාදීසයක් යැයි හැඳින්වෙන කුමන, බූන්දල, වීරවිල හා ලුණුගම්වෙහෙර අභයභූමි කිහිපයකින් වටවූ යාල ජාතික උද්‍යානයේම කොටසකි. යාල යනු ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම නරඹනු ලබන හා දෙවන විශාල උද්‍යානය වන අතර එය වසර 1900 දී වන සත්ව අභයභූමියක් ලෙස නම් කෙරිනි. එක් පසකින් ඉන්දියන් සාගරයට සීමාවන එය රටේ අග්නිදිග කලාපයේ පිහිටි කොළඹ සිට ආසන්න වශයෙන් කි.මී. 300 (සැතපුම් 190) ක් නුදුරින් පිහිටා ඇත.

දකුණු පළාතේ අන්තය අසල සහ නැගෙනහිර පළාත ආරම්භයේ පිහිටි මෙය වර්ග කිලෝ මීටර් 979 (වර්ග මීටර් 378) ක ප්‍රදේශයක් පුරා විසිරී ඇති අතර වන ජීවී නිවාඩු නිකේතනය මගින් යෝජනා කර ඇති අක්කර 1107 ඇතුලුව පලටුපාන කලාපය ඇතුළත් වේ.  කතරගම හා සිතුල්පව්ව යන ප්‍රසිද්ධ වන්දනා ස්ථාන සමග අතීත ජනාවාස මධ්‍යස්ථානයක් බවට මෙම ප්‍රදේශය පත් ව තිබේ. 2015 වසරේ දෙසැම්බර් අවසානය වන විට පහත දැක්වෙන කාර්යයන් හා ක්‍රියාකාරකම් අවසන් කර ඇත.

- එක් අයෙකුට ඉඩම් අක්කර 07 බැගින් ආයෝජකයන් 07 දෙනෙකු තෝරා ගෙන ඇත.
- නිකේතනයේ පොදු ප්‍රවේශ මාර්ගයේ 1 වන අදියරේ ඉදිකිරීම් අවසන් වී ඇත.
- I.C.C. හෝටලය වාණිජ කටයුතු අරඹා ඇත.
- නිකේතනයට විදුලිබල සැපයුම ලබා දී ඇත.
- සියළුම ආයෝජකයන්ගෙන් ලැබුණු වැඩපිළිවෙල ක්‍රියාවට නැංවීම.
- ඉතිරි ව්‍යාපෘති කටයුතු ඇරඹීමට වන් ෂොප් ඒකකයේ අනුමැතිය අපේක්ෂාවෙන්



උගා වන නිවාඩු නිකේතනය, යාල



දිවියා, යාල

### (3) දෙද්දුව ලේක් නිවාඩු නිකේතනය

බෙන්තොට නැගෙනහිර කොටසේ පිහිටි දෙද්දුවෙහි ජලාශ, වගුරු බිම් සහ පුරන්වූ කුඹුරු වලින් සමන්විත වේ. ජලාශ්‍රිත විනෝද ක්‍රියාකාරකම් කෙරේ වැඩි අවධානයක් යොමු කරමින් විල් නිවාඩු නිකේතනයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිත මෙහි හදුනා ගෙන ඇති මුලු ඉඩම් ප්‍රමාණය අක්කර 1700 කි. 2015 වසරේ දෙසැම්බර් අවසානය වන විට පහත දැක්වෙන කාර්යයන් හා ක්‍රියාකාරකම් අවසන් කර ඇත.

- වන්දි ගෙවීම 2012 වසරේ දී ඇරඹිනි.
- වන්දි ලෙස ආසන්න වශයෙන් රු. මිලියන 40 ක් ගෙවිය.
- ව්‍යාපෘතිය කරගෙන යාම සඳහා ඉඩම් අත්පත්කර ගැනීම සඳහා මුදල් වෙන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අපේක්ෂා කෙරේ.
- ආයෝජන ව්‍යාපෘතියක් සඳහා ඉන්දියානු ආයෝජකයෙකු හා බ්‍රැන්ඩික්ස් සමාගම උනන්දු වුවද ඉඩම් වන්දි ගෙවීම මෙතෙක් සිදු කර නොමැත.









දෙද්දුව ලේක් නිකේතනය අවට දර්ශනයක්

### (4) ආරුගම්බේ සංචාරක සංවර්ධනය

ආරුගම් බොක්ක (ආරුගම්බේ) ලොව ඇති ඉතා රමනීයතම හා නැවුම් නිවර්තන වෙරළ වලින් එකක් වන දිවයිනේ ගිනිකොන කොටසේ පොතුවිල් වලට ආසන්නව අම්පාර දිස්ත්‍රික්කය තුල පිහිටා ඇත. ගොඩබිම් ප්‍රදේශය කි.මී. 70 ක් පළලැති වන තීරුවකින් සමන්විතය. මුහුදු බඩ තැනිතලා ප්‍රදේශයේ වන අලින් සැරි සරන අතර ප්‍රමාණයෙන් කුඩා වුවද අයස්කාන්ත ලාහුගල ජාතික උද්‍යානය සැතපුම් 10 ක් ගොඩබිමන් පිහිටා ඇත. අදහාගත නොහැකි වර්ග වලට අයත් කුරුළු වර්ග රැසක් තෙත් බිම් වෙත ඇදෙන අතර දැවැන්ත වූ යාල ජාතික වන උද්‍යානය මෙහි දකුණු පසින් සැතපුම් 20 ක පමණ දුරකින් ආරම්භ වේ.

කොළඹ සිට ආසන්න වශයෙන් කිලෝ මීටර් 314 ක් දුරින් පිහිටි ආරුගම්බේ ලොවේ ඇති හොඳම ඔරු පැදීමේ ස්ථාන වලින් එකක් ලෙස ප්‍රසිද්ධිය ලබා ඇත. මෙම නිවර්තන ධීවර ගම්මානයට කොළඹ සිට පොතුවිල් කුඩා නගරයේ දකුණු පසින් ප්‍රවේශ විය හැක. එය සුප්‍රසිද්ධ රැල් පැදීමේ හා සංචාරක නවාතැන්පලකි. ඔරු පැදීමට සුදුසු වන අක්කර එකකට අඩු බිම් ප්‍රමාණයක් ද වෙන් කර තැබිය යුතුය.
2015 වසරේ දෙසැම්බර් අවසානය වන විට පහත දැක්වෙන කාර්යයන් හා ක්‍රියාකාරකම් අවසන් කර ඇත.

i. හදුනාගත් ඉඩම් ප්‍රමාණය වන ජීවී දෙපාර්තමේන්තුවට මුදා හළ යුතුය.

ii. සමීක්ෂණය පවත්වා ආරුගම්බේ සංචාරක කලාපයේ වත්මන් පිහිටීම හා තත්වය හදුනා ගන්නා ලදී.

iii. සංචාරක කර්මාන්තයට උචිත පානම ප්‍රදේශයේ ඇති රජයේ ඉඩම් පානම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් නිලධාරියා සමඟ ගොස් හදුනා ගෙන ඇත.




ආරුගම්බෙ හි රළ පැදීම

## 7.3 "වන් ස්ටොප්" ඒකකය

**සංචාරක කර්මාන්තයේ ආයෝජන**
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වන් ස්ටොප් (OSU) ඒකකය වෙනත් රාජ්‍ය ආයතන හා එක්ව ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලිය පහසු කර දෙමින් හා කඩිනම් කර දීමෙන් නව ආයෝජන ව්‍යාපෘති ඇති කිරීමට පහසුකම් සපයා දේ.

2011- 2016 සංචාරක සංවර්ධන ක්‍රමවේදයට අනුව, සංචාරක ආර්ථිකයට සහාය වෙමින් වසර 2016 වන විට මිලියන 2.5 ක් වන සංචාරක පැමිණීම් සඳහා හෝටල් කාමර 45,000 අවශ්‍ය බව ඇස්තමේන්තු කර ඇත. නව ආයෝජන ව්‍යාපෘති මගින් ජාතික කාමර ධාරිතාවයට නව කාමර සංඛ්‍යාවක් එක් කරමින් ඉලක්කය සපුරා ගැනීමට OSU සක්‍රිය දායකත්වයක් ලබා දී ඇත. ජාතික කාමර ධාරිතාවය වර්ධනය කර ගැනීමට OSU ලබා දුන් දායකත්වය ගත වූ වසර කිහිපය තුල ඉතා වැදගත් ස්ථානයක් ගනී. OSU යටතේ ලියාපදිංචි වී ඇති ඉදිකෙරමින් පවතින ආයෝජන හෝටල් ව්‍යාපෘති අනුව නව හෝටල් කාමර 760 ක් 2015 වසරේ දී එකතු වී ඇති අතර නව කාමර 5855 ක පමණ ප්‍රමාණයක් 2016 දී එකතුවීමට අපේක්ෂිතය. ජාතික කාමර ධාරිතාවය සඳහා OSU ලබා දෙන දායකත්වය පහත දැක්වෙන පරිදි පෙන්වා දිය හැක.

**ජාතික ඉඩ පහසුකම් ධාරිතාව සඳහා නව ආයෝජන ධාරිතාව**





* 2016 වසරේ කාමර ප්‍රමාණය දැනට ඉදිකෙරෙමින් පවතින හෝටල් ව්‍යාපෘති වල තථ්‍ය කාමර සංඛ්‍යාවට අනුව පුරෝකථනය කෙරේ. ආයෝජන ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක් හා ඉහල කාමර ධාරිතාවයක් ඉදිරි වසර වලදී එක් වනු ඇත.

OSU විසින් ක්‍රියාත්මක ආයෝජන ව්‍යාපෘති වල ප්‍රගතිය පහත දැක්වෙන ලෙස වර්ගීකරනය කළ හැක.

2015 දෙසැම්බර් 31 දිනට ලැබුනු මුළු ව්‍යාපෘති ප්‍රමාණය - 468
2015 දෙසැම්බර් 31 දිනට සකසා අවසන් කළ මුළු ව්‍යාපෘති ප්‍රමාණය - 59
2015 දෙසැම්බර් 31 දිනට අවසන් අනුමැතිය පළ කල මුළු ව්‍යාපෘති ප්‍රමාණය - 36

ආයෝජන ප්‍රමාණය අනුව වර්ගීකරණය කළ ව්‍යාපෘති පහත වගුවේ දක්වා ඇත.

| ආයෝජන ප්‍රමාණය ඇඩො මිලියන | සමස්ත ව්‍යාපෘති - 2015 දක්වා | ව්‍යාපෘති සංඛ්‍යාව 2014 | ව්‍යාපෘති සංඛ්‍යාව 2015 | වෙනස % |
|---|---|---|---|---|
| 0.5 ට අඩු | 74 | 8 | 6 | -2.70 |
| 0.50 - 1 | 61 | 12 | 8 | -6.56 |
| 1.10 - 2 | 73 | 15 | 11 | -5.48 |
| 2.10 - 5 | 125 | 16 | 19 | 2.40 |
| 5.10 - 10 | 53 | 5 | 4 | -1.89 |
| 10.10 - 20 | 38 | 4 | 4 | 0.00 |
| 20.1 ට වැඩි | 44 | 8 | 7 | -2.27 |
| එකතුව | 468 | 68 | 59 | -16.5 |





2015 වසර තුලදී නව ආයෝජන ව්‍යාපෘති 59 ක් OSU දියත් කර ඇත. සමස්ථ ව්‍යාපෘති 44 අතුරින් ඇඩො මිලියන 20 ඉක්මවන උසස් තලයේ ආයෝජන හතක් 2015 වසරේ දී ලැබී ඇත.


මෙම ව්‍යාපෘති හත කොළඹ, නුවරඑළිය, ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක අතර විසිරී ඇත. 1632 ක් වු කාමර ප්‍රමාණය ජාතික කාමර සංඛ්‍යාව ශක්තිමත් කරලීමට මෙම ව්‍යාපෘති වලින් බලාපොරොත්තු වේ. ඉදිකිරීම් සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 246.87 ක මුදලක් ආයෝජනය කිරීමට යෝජනා වි ඇත.

**ආයෝජන ව්‍යාපෘති - 2011 සිට 2015 දක්වා**

2014 හා 2015 යන වසර වලදී OSU වෙත ලැබුණු ආයෝජන ව්‍යාපෘති ප්‍රමාණය සැලකිය යුතු වර්ධනයක් ඇති විය. එසේ ආයෝජන ව්‍යාපෘති ලැබීම වර්ධනය වීමේ ප්‍රවනතාවය අනුව, 2016 වසර වන විට ආසන්න වශයෙන් කාමර ප්‍රමාණය 31000 ක් බවට පත් විමට පහසුකම් ලබා දෙන ආයෝජන ව්‍යාපෘති ප්‍රමාණය 550 ක් බවට පත් වනු ඇතැයි අපේක්ෂිතය. 2015 වසරාවසානය වන විට බලාපොරොත්තු වන ව්‍යාපෘති ප්‍රමාණය 450 ක් වු බව පැවසිය යුතුය. කෙසේ වුවද, දෙසැම්බර් අවසානය වන විට ව්‍යාපෘති 468 ක් මෙන්ම 2015 වසරේ දි අපේක්ෂිත කාමර ධාරිතාවය 28000 ක් බවට පත් වී 29682 ක් බවට පත්වන බව වාර්තාවේ.




| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති | 206 | 242 | 298 | 363 | 468 |
| කාමර | 13094 | 15581 | 19853 | 23240 | 28682 |
| ආයෝජන | 2011.32 | 2384.9 | 3492.27 | 4382.57 | 5201.92 |




**අවසන් අනුමැතිය දුන් ව්‍යාපෘති - වසර 2011 සිට 2015 දක්වා**


අවසන් අනුමැතිය ලබා දුන් මුළු ව්‍යාපෘති 224 න් 40 කට 2014 වසරේ දිත් 36 ක් සඳහා 2015 වසරේදීත් අනුමැතිය ලබා දී ඇත. 2014 වසර සමඟ සංසන්දනාත්මකව ගත් කල අවසන් අනුමැතිය දුන් ව්‍යාපෘති සංඛ්‍යාව 17.5% කින් අඩු වී ඇති බව පෙනේ.

අවසන් අනුමැතිය ලබා දුන් ආයෝජන ව්‍යාපෘතිවල ප්‍රගතියේ භූගෝලීය ව්‍යාප්තිය පහත දක්වා ඇත.

**වන් ස්ටොප් ඒකකය විසින් අවසන් අනුමැතිය දී ඇති ආයෝජන ව්‍යාපෘති භූගෝලීය ව්‍යාප්තිය**

| දිස්ත්‍රික්කය | අවසන් අනුමැතිය දුන් 2011 | | | අවසන් අනුමැතිය දුන් 2012 | | | අවසන් අනුමැතිය දුන් 2013 | | | අවසන් අනුමැතිය දුන් 2014 | | | අවසන් අනුමැතිය දුන් 2015 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මුළු ව්‍යාපෘති ප්‍රමාණය | කාමර | ආයෝජනය (ඇඩො) මි. | මුළු ව්‍යාපෘති ප්‍රමාණය | කාමර | ආයෝජනය (ඇඩො) මි. | මුළු ව්‍යාපෘති ප්‍රමාණය | කාමර | ආයෝජනය (ඇඩො) මි. | මුළු ව්‍යාපෘති ප්‍රමාණය | කාමර | ආයෝජනය (ඇඩො) මි. | මුළු ව්‍යාපෘති ප්‍රමාණය | කාමර | ආයෝජනය (ඇඩො) මි. |
| අම්පාර | | | | | | | 1 | 31 | 1.8 | 1 | 10 | 0.58 | 1 | 10 | 0.61 |
| අනුරාධපුර | 1 | 28 | 0.43 | | | | | | | | | | 1 | 50 | 1.54 |
| බදුල්ල | | | | 1 | 12 | 0.69 | | | | | | | | | |
| මඩකලපුව | 7 | 285 | 16.46 | 7 | 132 | 13.78 | | | | 2 | 50 | 8.78 | 1 | 60 | 3.45 |
| කොළඹ | 9 | 1067 | 118.59 | 8 | 874 | 108.31 | 4 | 329 | 24.14 | 7 | 1025 | 235.58 | 5 | 871 | 426.45 |
| ගාල්ල | 7 | 198 | 22.88 | 12 | 722 | 86.2 | 4 | 80 | 10.86 | 5 | 564 | 88.18 | 6 | 144 | 11.646 |
| ගම්පහ | 3 | 293 | 30.81 | 5 | 290 | 38.08 | 3 | 48 | 10.23 | 5 | 495 | 54.01 | 1 | 30 | 0.89 |
| හම්බන්තොට | 3 | 164 | 13.06 | 4 | 168 | 11.19 | 5 | 845 | 171.76 | 2 | 24 | 3.24 | 5 | 128 | 24.7 |
| යාපනය | 3 | 92 | 6.4 | 1 | 18 | 0.58 | 1 | 66 | 6.36 | 1 | 56 | 4.05 | | | |
| කළුතර | 5 | 335 | 33.49 | 7 | 322 | 16.44 | 5 | 712 | 110.89 | | | | 2 | 186 | 11.01 |
| නුවර | 1 | 18 | 0.63 | 2 | 154 | 21 | | | | 1 | 14 | 0.9 | 5 | 172 | 28.442 |
| කුරුණෑගල | | | | | | | 1 | 16 | 0.37 | | | | | | |
| මන්නාරම | | | | | | | 1 | 52 | 1.22 | | | | | | |
| මාතලේ | 2 | 29 | 0.87 | 3 | 118 | 16.55 | 3 | 193 | 17.2 | 5 | 131 | 11.26 | 3 | 120 | 6.492 |
| මාතර | 3 | 54 | 21.9 | 4 | 169 | 21.7 | 3 | 75 | 13.63 | 3 | 54 | 4.36 | 1 | 64 | 4.37 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මොණරාගල | | | | | | | 2 | 42 | 1.37 | | | | | | |
| නුවරඑළිය | | | | 1 | 42 | 3.7 | | | | 2 | 78 | 3.76 | 4 | 417 | 53.36 |
| පොලොන්නරුව | | | | | | | 1 | 33 | 0.63 | | | | | | |
| පුත්තලම | 3 | 104 | 8.4 | 3 | 221 | 12.9 | | | | | | | 1 | 20 | 0.74 |
| රත්නපුරය | | | | | | | | | | 1 | 40 | 2.8 | | | |
| ත්‍රිකුණාමලය | 3 | 116 | 20.76 | 4 | 122 | 10.25 | 1 | 10 | 0.6 | 4 | 106 | 5.528 | | | |
| වවුනියා | | | | | | | 1 | 15 | 1.16 | 1 | 34 | 0.38 | | | |
| එකතුව | 50 | 2783 | 294.68 | 62 | 3364 | 361.37 | 36 | 2547 | 372.22 | 40 | 2681 | 423.408 | 36 | 2272 | 573.7 |





**නොනිම් ව්‍යාපෘති - 2015**

2015 දෙසැම්බර් 31 දිනට ඉදි කෙරෙමින් පවතින දිස්ත්‍රික් තලයේ හෝටල් වර්ගීකරණය පහත පරිදි වේ. මෙය තුල 2015 දෙසැම්බර් 31 දින වන විට කටයුතු අරඹා තිබූ ප්‍රමාණය ඇතුළත් නොවේ.

**නොනිම් ඉදිකිරීම් ව්‍යාපෘති - 2015**


| දිස්ත්‍රික්කය | නොනිම් ව්‍යාපෘති 2015 | | | කටයුතු ඇරඹීමට නියමිත 2015 නොනිම් ඉදිකිරීම් ව්‍යාපෘති | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 | | | 2016 | | | 2017 | | |
| | ව්‍යාපෘති ප්‍රමාණය | කාමර සංඛ්‍යාව | ආයෝජනය ඇ.ඩො. | ව්‍යාපෘති ප්‍රමාණය | කාමර සංඛ්‍යාව | ආයෝජනය ඇ.ඩො. | ව්‍යාපෘති ප්‍රමාණය | කාමර සංඛ්‍යාව | ආයෝජනය ඇ.ඩො. | ව්‍යාපෘති ප්‍රමාණය | කාමර සංඛ්‍යාව | ආයෝජනය ඇ.ඩො. |
| අම්පාර | 3 | 51 | 2.99 | 1 | 31 | 1.8 | 2 | 20 | 1.19 | | | |
| අනුරාධපුරය | 1 | 50 | 1.54 | | | | 1 | 50 | 1.54 | | | |
| මඩකලපුව | 7 | 181 | 17.13 | 2 | 22 | 0.53 | 5 | 159 | 16.6 | | | |
| කොළඹ | 18 | 3063 | 800.81 | 2 | 48 | 3.06 | 11 | 1918 | 551.42 | 4 | 999 | 230.83 |
| ගාල්ල | 16 | 1135 | 129.559 | 2 | 39 | 2.51 | 14 | 1016 | 134.449 | 1 | 178 | 8.1 |
| ගම්පහ | 7 | 685 | 74.29 | 1 | 10 | 0.55 | 5 | 295 | 23.74 | 1 | 380 | 50 |
| හම්බන්තොට | 6 | 576 | 458.37 | 2 | 90 | 6.26 | 4 | 486 | 452.11 | | | |
| යාපනය | 5 | 202 | 14.39 | | | | 4 | 182 | 13.99 | 1 | 20 | 0.4 |
| කළුතර | 9 | 847 | 119.28 | 4 | 221 | 10.93 | 5 | 626 | 108.35 | | | |
| මහනුවර | 3 | 76 | 5.512 | | | | 3 | 76 | 5.512 | | | |
| මන්නාරම | 1 | 52 | 1.22 | 1 | 52 | 1.22 | | | | | | |
| මාතලේ | 6 | 233 | 29.666 | 1 | 6 | 0.96 | 5 | 227 | 28.706 | | | |
| මාතර | 9 | 486 | 46.05 | 2 | 48 | 7.7 | 6 | 374 | 33.98 | 1 | 64 | 4.37 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මොණරාගල | 1 | 25 | 0.98 | 1 | 25 | 0.98 | | | | | | |
| නුවරඑළිය | 6 | 361 | 35.82 | 1 | 65 | 3.34 | 4 | 262 | 31.28 | 1 | 34 | 1.2 |
| පුත්තලම | 1 | 20 | 0.74 | | | | 1 | 20 | 0.74 | | | |
| රත්නපුරය | 1 | 40 | 2.8 | | | | 1 | 40 | 2.8 | | | |
| ත්‍රිකුණාමලය | 5 | 104 | 13.59 | | | | 5 | 104 | 13.59 | | | |
| එකතුව | 105 | 8187 | 1754.737 | 20 | 657 | 39.84 | 76 | 5855 | 1419.997 | 9 | 1675 | 294.9 |




**හෝටල් ව්‍යාපාති කටයුතු ඇරඹීම**

OSU විසින් මෙහෙයවන දැනට විවෘත කර ඇති හෝටල් ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත පරිදි විස්තර කළ හැකිය. 2015 වසර තුල දී සම්පූර්ණ කර ඇති කාමර ලෙස කාමර 760 ක් සංචාරක ආර්ථිකයට එක් කර ඇත. 2016 වසර වන විට, මේ වසරට සාපේක්ෂව කැපී පෙනෙන වර්ධනයක් සනිටුහන් කරමින් තවත් කාමර 5885 ක් එකතු වීමට සූදානමින් පසුවේ. වත්මන් තතු හා අද වන විට ව්‍යාපෘති වල දැකිය හැකි ප්‍රවනතාවය අනුව, ඉදිරි දෙවසර කාලය තුල කාමර ධාරිතාවය 7500 ඉක්මවනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.




* පුරෝකථනය කළ කාමර වර්ධනය

ව්‍යාපෘතිය: ජාතික නිවාඩු නිකේතනය, පාසිකුඩා

**1. ක්‍රියාත්මක සංචාරක යටිතල පහසුකම් සැපයීමේ ව්‍යාපාති**

i. පාසිකුඩා ජාතිත නිවාඩු නිකේතන (NHR) වලට ඉහළ ප්‍රමිතියකින් යුත් ජලය ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය (NWSDB) විසින් සැපයීම



| | |
|---|---|
| කොන්ත්‍රාත්කරු | ජාතික ජල සම්පත් හා ජලාපවාහන මණ්ඩලය |
| ව්‍යාපෘති පිරිවැය | රු. මිලි. 50 |
| ස්ථානය | වෙන්කලඩි ටැංකියේ සිට කි.මී. 14 ක් පමණ බට සැපයුම හා එලීම (මිමී 225 Dia,Upvc, 1000 වර්ගයේ) |
| ආරම්භක දිනය | 2015 ජුනි 1 |
| වෙනත් කරුණු | නල එලීම 95% ක් අවසන් කර ඇත |

## 7.4 දේශීය සංචාරක හා නිකේතන කළමනාකරණය

**2014 හා 2015 වසරේ නවාතැන් සන්සන්දනය**

| මාස | බණ්ඩාරවෙල | | කතරගම | | නුවරඑළිය | | අනුරාධපුරය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 |
| ජන. | 611 | 501 | 1313 | 1257 | 735 | 420 | 702 | 0 |
| පෙබ. | 473 | 676 | 1267 | 1467 | 678 | 678 | 919 | 97 |
| මාර්තු | 614 | 473 | 788 | 1023 | 512 | 631 | 668 | 0 |
| අප්‍රේල් | 1042 | 1054 | 1656 | 1699 | 748 | 835 | 790 | 0 |
| මැයි | 616 | 716 | 1003 | 1206 | 737 | 892 | 749 | 19 |
| ජුනි | 811 | 584 | 1065 | 1002 | 676 | 892 | 675 | 355 |
| ජුලි | 568 | 931 | 1325 | 1499 | 678 | 644 | 919 | 315 |
| අගෝ. | 1099 | 1048 | 2382 | 2066 | 1238 | 1055 | 668 | 633 |
| සැප්. | 1047 | 714 | 1656 | 1465 | 748 | 901 | 374 | 0 |
| ඔක්. | 616 | 962 | 1086 | 1163 | 671 | 763 | 749 | 405 |
| නොවැ. | 239 | 682 | 1088 | 807 | 547 | 647 | 1009 | 224 |
| දෙසැ. | 842 | 1064 | 1936 | 2143 | 626 | 1107 | 517 | 658 |
| එකතුව | 8578 | 9405 | 16565 | 16797 | 8594 | 9465 | 8739 | 2706 |
| නවාතැන් ගැනීම් | 18% | 37% | 40% | 40% | 33% | 37% | 35% | 22% |

**ජාතික නිවාඩු නිකේතනවල අවසන් කළ අලුත්වැඩියාවන්**




ජාතික නිවාඩු නිකේතනය - බණ්ඩාරවෙල




ජාතික නිවාඩු නිකේතනය - නුවරඑළිය




ජාතික නිවාඩු නිකේතනය - අනුරාධපුරය

## 7.5 දේශීය සංචාරක කර්මාන්ත හා ප්‍රජා සබඳතා

### වැඩසටහන් ලැයිස්තුව

1. අනුරාධපුරයේ අටමස්ථාන අතර කෙටි දුර බස් සේවාවක් ඇරඹීම
2. වන සත්වාරක්ෂකයන් හා ආරක්ෂක නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන
3. අනවසර සංචාරක මාර්ගෝපදේශකයන් හා සංචාරක රියදුරන් පරීක්ෂා කිරීම
4. අලුත්ගම, කලුතර හා බෙන්තොට ව්‍යාපාරික හමු
5. බෙන්තොට මලාපවාහන පිරිසිදු කිරීමේ ස්ථානයක් පිළිබඳ වාර්තාවක් සැකසීම පරීක්ෂා කිරීම
6. ජගත් සංචාරක දිනය 2015 කාරක සභාව සංවිධානය
7. ජගත් සංචාරක දිනය 2015
    - පළාත් උත්සවය - උතුරු පළාත
    - පළාත් උත්සවය - මධ්‍යම පළාත
    - පළාත් උත්සවය - දකුණු පළාත
    - පළාත් උත්සවය - වයඹ පළාත
    - පළාත් උත්සවය - සබරගමුව පළාත
8. ගලපාත පෙරහැර

### විශේෂ අවස්ථා

| ව්‍යාපෘතිය | දිනය | අරමුණ | ක්‍රියාකාරකම | ප්‍රතිඵලය |
|---|---|---|---|---|
| අනුරාධපුරයේ අටමස්ථාන අතර කෙටිදුර ගමන් සේවාව ඇරඹීම | 2015 අගෝස්තු 1 | දේශීය සංචාරකයන් සඳහා පහසුකම් වැඩි කිරීම | පෙ.ව. 7.30, පෙ.ව. 11.30 හා ප.ව. 3 ට දිනපතා නගර සං-චාර පිළිවෙල කිරීම | දේශීය හා විදේශීය සංචාරකයන්ගේ පහසුකම් වැඩිකිරීම |
| වන ජීවි සංරක්ෂක-යන් හා ආර-ක්ෂක නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 2015 අගෙ ාස්තු 3 වන දින ලුණුග මිවෙහෙර | කොටස්කරුවන් හා පහ-සුකම් සපයන්නන් විධිමත් කිරීම | සංචාරක කර්මාන්තය පිළිබඳ දේශණය - ඉතිහාසය, වර්තාමානය හා අනාගතය - සංචාරකර ප්‍රවනතා පිළිබඳ දේශණය | වගකීමක් සහිත සේවාවක් ලබා දීම සඳහා පහසුකම් සපයන්නන් බලාත්මක කිරීම |
| අනවසර සංචාරක මාර්ගෝපදේශක-යන් හා සංචාරක රියදුරන් පරීක්ෂා කිරීම | 2015 අගෙ ්ස්තු 3-5 දක්වා උණාවටුන | සංචාරක ක්ෂේත්‍රයේ සිටින අනවසර පහසුකම් සප-යන්නන් හඳුනා ගැනීම හා ඔවුන්ව නිසිමගට ගෙනඒම | පරීක්ෂා කිරීම | කොටස්කරුවන් හා පහසුකම් සපය-න්නන් නිසි මගට ගෙනඒම |
| ව්‍යාපාරික හමු අලුත්ගමදී | 2015 අගෝස්තු 4, 9, 16 දිනවල | උනන්දුවක් දක්වන්නන් හඳුනා ගැනීම | සංචාරක කර්මාන්තය පිළිබඳ සාකච්ජා | ▪ ෂසංචාරක උනන්දුවක් දක්වන්නන්ගේ ගැටලු හඳුනා ගැනීම හා ඒවාට ක්ෂණික විසඳුම් ලබාදීම<br>▪ ෑවගකිවයුතු සේවාවක් ලබා දීමට පහසුකම් සපයන්නන්ව බලගැන්වීම<br>▪ ෂසංචාරක උනන්දුවක් දක්වන්නන්ගේ ගැටලු හඳුනා ගැනීම හා ඒවාට ක්ෂණික විසඳුම් ලබාදීම |
| වාර්තාවක් සඳහා මලාපවාහන කර්මාන්තශාලාව අධ්‍යයනය - බෙන්තොට | 2015 අගෝස්තු 9 | කර්මාන්තශාලාව පිළිබඳව අදහසක් ඇති කර ගැනීමට | ක්ෂේත්‍ර පරීක්ෂාව | පහසුකම් වැඩිකිරීම සඳහා වාර්තාවක් සැකසීම |

| | | | | |
|---|---|---|---|---|
| ජගත් සංචාරක දිනය සඳහා කමිටු රැස්වීමක් සංවිධානය කිරීම | 2015 අගෝස්තු 27 දින අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේ දී | උක්ත තේමාව පිළිබඳව ජනයා දැනුවත් කිරීම | දැනුවත් කිරීමේ වැඩසටහන් කලා තරග පොත් එළිදැක්වීම් පිරිසිදු කිරීමේ ) පැලසිටුවීමේ ව්‍යාපාර | "සංචාරකයන් මිලියනයක්, අවස්ථා මිලියනයක්" තේමාව සමඟ 2015 ජගත් සංචාරක දිනය සැමරීම |

## 7.6 ප්‍රමිති හා තත්ත්ව ආරක්ෂණය

අවසරලත් සංචාරක ආයතන ලියාපදිංචි කිරීම

සංචාරක ආයතන ලියාපදිංචි කිරීම හා බලපත්‍ර ලබාදීම යනු ප්‍රමිති හා තත්ව ආරක්ෂණ අංශයේ ප්‍රධානතම වගකීමයි. මේ සඳහා අඛණ්ඩ පිරික්සුම් සිදු කෙරේ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ද හෝටල්, අමුත්තන්ගේ නිවාස හා ආපනශාලා වලට බීම බලපත්‍ර නිකුත් කිරීමේ දී සුරාබදු දෙපාර්තමේන්තුවට නිර්දේශ ලබා දෙන අතර සංචාරක ආයතන වල සිටින විදේශීය කාර්ය මණ්ඩලයේ වීසා සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නිර්දේශ ලබා දේ.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය ලබා ඇති සංචාරක ආයතන සංඛ්‍යාව පහත දැක්වේ.

| වර්ගය | 2015 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 | | 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|
| | ආයතන සංඛ්‍යාව | කාමර සංඛ්‍යාව | ආයතන සංඛ්‍යාව | කාමර සංඛ්‍යාව |
| හෝටල් වර්ගීකරණය | | | | |
| තරු එක | | | 34 | 1,330 |
| තරු දෙක | - | - | 33 | 1,725 |
| තරු තුන | - | - | 15 | 1,469 |
| තරු හතර | - | - | 18 | 2,084 |
| තරු පහ | - | - | 13 | 2,744 |
| වර්ගීකරණය නොකළ හෝටල් | 19 | 738 | 217 | 9,593 |
| කඩපිල් හෝටල් | | | 24 | 432 |
| කඩපිල් විලා | 2 | 17 | 34 | 221 |
| අමුත්තන්ගේ නිවාස | | | | |
| A ශ්‍රේණිය | 29 | 312 | 391 | 4,922 |
| B ශ්‍රේණිය | 11 | 121 | 357 | 3,189 |
| C ශ්‍රේණිය | 1 | 6 | 34 | 278 |
| සංචාරක සත්කාරක නිවාස | | | | |
| සාමාන්‍ය | 18 | 37 | 101 | 158 |
| සුපිරි | 23 | 63 | 103 | 297 |
| ඉතා අනර්ඝ | 1 | 5 | 44 | 142 |
| බංගලා | | | | |
| සාමාන්‍ය | 7 | 22 | 39 | 158 |
| සුපිරි | 18 | 68 | 73 | 279 |

| | | | | |
|---|---|---|---|---|
| ඉතා අනර්ඝ | 33 | 129 | 131 | 556 |
| උරුම බංගලා | | | | |
| ඉතා අනර්ඝ | 2 | 10 | 4 | 19 |
| උරුම නිවාස | | | | |
| උරුම නිවාස | | | 1 | 7 |
| කුලී අනුනිවස් | | - | - | |
| සාමාන්‍ය | 3 | 4 | 13 | 26 |
| සුපිරි | 4 | 7 | 25 | 66 |
| ඉතා අනර්ඝ | 2 | 4 | 5 | 12 |
| කුලී නිවාස | | | | |
| සාමාන්‍ය | 2 | 9 | 5 | 13 |
| සුපිරි | - | - | 2 | 9 |
| | | | | |

**විශේෂිත සංචාරක සේවා**

| වර්ගය | 2015 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා | 2015 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| අවන්හල් | | |
| A ශ්‍රේණිය | 15 | 361 |
| B ශ්‍රේණිය | 12 | 78 |
| ප්‍රවාහන ඒජන්සි | 75 | 762 |
| ස්පා & සුවතා මධ්‍යස්ථාන | 7 | 28 |
| සංචාරක සාප්පු | 3 | 66 |
| කුළුබඩු උයන් | 1 | 33 |
| ජල ක්‍රීඩා මධ්‍යස්ථාන | 2 | 23 |
| එකතුව | 115 | 1,351 |

| වර්ගය | 2015 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා | 2015 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| ජාතික සංචාරක මාර්ගෝපදේශකයන් | 81 | 1,171 |
| රියදුරු සංචාරක මාර්ගෝපදේශකයන් | 107 | 1.044 |
| ප්‍රාදේශීය සංචාරක මාර්ගෝපදේශකයන් | 16 | 474 |
| පරිශ්‍ර සංචාරක මාර්ගෝපදේශකයන් | - | 89 |
| එකතුව | 204 | 2,778 |

**වසරේ වැඩසටහන් විස්තරය**

**1. නව ක්‍රමවේද / මාර්ගෝපදේශ ඇති කිරීම**

තල් මසුන්/ ඩොල්ෆින් නැරඹීම, කරත්තවල ගමන් කිරීම, හරිත නවාතැන් පලවල්, කඳවුරු බැඳීම්, අනු නිවාසැති හෝටල්, අලි සපාරි යනාදී නව සංචාරක සේවා 23 ක් සඳහා නව ක්‍රමවේද/ මාර්ගෝපදේශ සැදු ලෙස තොරතුරු ලබා ගැනීම පිණිස සංචාරක සේවා සපයන්නන් හට උපදේශාත්මක රැස්වීම් පැවැත්විනි.

## 2. "ටුවරිස්ම් ෆෙස්ට්" 2015 සැමරීම

නත්තල් ප්‍රීතිය කැටිකරගත් "ටුවරිස්ම් ෆෙස්ට්" 2015 දෙසැම්බර් 19 සිට 23 දක්වා කොළඹ නිදහස් ආකේඩ් හි පැවැත්විය.




මෙම උත්සවයේ ප්‍රධාන අරමුණ වූයේ නත්තලේ හා නව අවුරුදු සමය සැමරීමට හා ප්‍රීතිමත්ව ගත කිරීමට සංචාරකයන්ට හා ප්‍රදේශවාසී ජනතාව යන දෙපක්ෂයටම අවස්ථා පාදා දෙමින් අසමසම ශ්‍රී ලාංකික රුචිකත්වයන් විදහා දක්වමින් උත්සවශ්‍රීයක් මවා පෑමයි.




උත්සවයේ ප්‍රධාන අංග අතර ශ්‍රී ලංකා සංස්කෘතික උරුමයන්, හස්ත කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරන, වන සතුන් සහ සත්ව/ උද්භිද උද්‍යාන විදහා දක්වන ප්‍රදර්ශනයක් පැවැත්වීමයි.



පහසු මිලගණන් වලට ජාත්‍යන්තර ආහාර වර්ග ලබා දුන් වීදි ආහාර උත්සවයට ප්‍රධාන පෙලේ හෝටල් හා අවන්හල් සහභාගී විය.



සම්ප්‍රදායික සංස්කෘතික සංදර්ශණ හා line සංගීතය මගින් ස්ථානයේ සිටි අමුත්තන් පිනවීම සිදු විය.

**3. සංචාරකයන්ගේ ආපන ශාලා වල ස්වස්ථාමය සනීපාරක්ෂාව පිළිබඳ ප්‍රමිතිය සහතික කිරීම සඳහා "සංචාරක මිතුරු ආපන ශාලා" සඳහා සහතිකපත්‍ර යෝජනා ක්‍රමයක් හඳුන්වා දුන් තර එහි නියාමන ව්‍යාපෘතිය උණවටුනේ දී ඇරඹිනි.**

ආපනශාලා ලියාපදිංචිය සඳහා වූ මාර්ගෝපදේශ වලට අනුගත නොවන ප්‍රමිතියෙන් හා ස්වස්ථා ප්‍රමිතියෙන් බාල ආපන ශාලා විශාල ප්‍රමාණයක් රට පුරා ඇත. මේ සඳහා අවම අවශ්‍යතා 40 ක් වෙනත් ප්‍රමිති සපුරා තිබිය යුතුය. එමෙන්ම, සංචාරකයන්ට සේවා සපයන සංචාරක ප්‍රදේශවල පිහිටා ඇති ඉතා බාල ප්‍රමිති වලින් යුතු ආපනශාලා පිළිබඳ වාර්තා අප සතුව තිබේ. තම දිවා සංචාර වලදී කදිම හා සෞඛ්‍යානුකූල ස්ථාන වලින් ආහාර ගැනීමට සංචාරකයන් සාමාන්‍යයෙන් ප්‍රිය කරති. බාල තත්වයෙන් යුතු ආහාර හා සේවා පිළිබඳව සංචාරකයන් පර්යේෂණ සමීක්ෂණ තොරතුරු මගින් ද අදහස් පල කර ඇත.

සහතික කිරීමේ ක්‍රමයක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ, සීමා. ඉන්ද් එක්ස්පෝ සහතික කරලීමේ සමාගමේ (ශ්‍රීලංසංසංඅ හා END - EXPO අතර එළැඹි අවබෝධතා ගිවිසුම පරිදි) සහ අදාළ පළාත් පාලන ආයතන වල සහාය ඇතිව හඳුන්වා දීමට හා ක්‍රියාත්මක කිරීමට නියමිතය. එහි පළමු පියවර ලෙස, උණවටුන, සීගිරිය හා අනුරාධපුරය යන සංචාරක කලාප තුනක එය ක්‍රියාවට නැංවීමටත් එහි සාර්ථකත්වය මත රටේ අනෙක් ප්‍රදේශ වලටත් දියත් කිරීමට නියමිතය.

**පරමාර්ථ**

i. සංචාරක සම්පාරක්ෂක ප්‍රදේශ වල ඇති ආපන ශාලාවන්හි ප්‍රමිතිමය තත්වය ඉහළ නැංවීම සහ අවශ්‍ය කරන ආහාර සනීපාරක්ෂක තත්වයන් හා ප්‍රමාණවත් පහසුකම් වලින් යුතු සංචාරකයන්ට ආහාර පාන ගැනීමට ස්ථාන සැකසීම

ii. සංචාරකයන්ට ආහාර ස්වස්තා හා පහසුකම් වලට අදාල මූලික මාර්ගෝපදේශ වලට අනුගත වෙන එකී ස්ථාන කිහියකට සහතික කරලීමේ ලාංඡනය ප්‍රදානය කිරීම මගින් ප්‍රදේශයේ ඇති එවැනි ආපනශාලා අතර තරඟයක් නිර්මාණය කිරීම සහ ඔවුන්ගේ තත්වයත් වර්ධනය කර ගැනීමට හා සහතිකය ලබා ගැනීම සඳහා උනන්දු කෙරේ.

මාර්ගෝපදේශ සකසා ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත.

TOURIST FRIENDLY EATING PLACE

TOURIST FRIENDLY EATING PLACE





"සංචාරක මිතුරු" ආපන ශාලා සඳහා සහතික ලබා දීමේ ක්‍රමවේදයේ සමාරම්භක උත්සවය - උණවටුන

දිනය : 2015 ඔක්තෝබර් 19
වේලාව : ප.ව. 3.00 - ප.ව. 4.30
ස්ථානය : BB කැෆෙ, මාතර පාර, හබරාදුව

"සංචාරක මිතුරු" ආපන ශාලා සඳහා සහතික ලබා දීමේ ක්‍රමවේදය සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් හා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මහතාගේ සහභාගීත්වයෙන් උණවටුනේ දී නිල වශයෙන් ඇරඹිනි.

දිවයිනේ අනෙක් සංචාරක කලාප වලද වැඩසටහන ඉදිරියේ දී පැවැත්වීමට කටයුතු කෙරේ.

**4. සංචාරක තේමා ගම්මාන සැකසීම**

කන්නෙලිය, සීලෝගම, පදවිගම්පොල, හිල්ඔය, පානම, ලාහුගල හා යාපහුගම යන ස්ථාන වල සත්කාරක නිවාස ගම්මාන 7 ක් ඉදි කිරීමට පළාත් සභා හා සංචාරක සංවර්ධන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය හා පහසුකම් ඇති කිරීම සිදු වේ. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ දේශීය සංස්කෘතිය, සම්ප්‍රදායන්, ආහාර පිළිබඳව සංචාරකයන්ට අත්දැකීම් ලබා ගැනීම නිවැස් ලැගුම් පහසුකම් ඒකකය මගින් සංචාරක තේමා ගම්මාන සැකසීමත් සමඟ ගැමි ප්‍රජාවට එමගින් ප්‍රතිලාභ ලැබීමක් වේ.

ගම තුලම නිවාස ස්ථානවල නවාතැන් ලබාදීම මගින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජීවන රටාවේ අත්දැකීම් වල රසය පැමිනෙන සංචාරකයන් හට උකහා ගැනීමට අවස්ථාව තුලින් තිරසාර ප්‍රජා සංචාරක ව්‍යාපාරයක් ලෙස සංචාරක තේමා ගම්මාන වැඩිදියුණු කිරීම සිදුවේ.

නියාමන ව්‍යාපෘති ලෙස පහත දැක්වෙන ගම්මාන අදාළ පළාත් සංචාරක බලධාරීන් විසින් ස්ථාපිත කර ඇති අතර ඒවායේ සංවර්ධන කටයුතු කෙරෙමින් පවතී. උක්ත ගම්මාන ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පහසුකම් සැපයේ. අදාළ ගම්වල සංස්කෘතික වටිනාකම් හා අනන්‍යවූ ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් නිවැස් ලැගුම් ස්ථාන වල පහසුකම් වල හා සංචාරකයන්ගේ පොදු පහසුකම් අවශ්‍ය ප්‍රමිතිය පවත්වාගෙන යාමට හා උසස් කිරීමට අදාළ නීති රෙගුලාසි සකස් කෙරමින් පවතී. මෙම ප්‍රයත්නයේ ප්‍රධාන අරමුණ වන්නේ සංචාරක ප්‍රතිලාභ රටේ ග්‍රාමීය ප්‍රජාව එනම් බිම් මට්ටමට ලගා කර දීමට කටයුතු කිරීමයි.

| | | | |
|---|---|---|---|
| 01. | පදවිගම්පොල | - | සබරගමුව පළාත් සභාව |
| 02. | සීලෝගම | - | සබරගමුව පළාත් සභාව |
| 03. | කන්නෙලිය | - | රුහුණු සංචාරක කාර්යාංශය - දකුණු පළාත් සභාව |
| 04. | හිල්ඔය | - | වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත |
| 05. | යාපහුගම | - | වයඹ පළාත් අධිකාරිය --වයඹ පළාත් සභාව |
| 06. | පානම | - | නැගෙනහිර පළාත - අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අනුමැතිය ඇතිව රාජ්‍ය නොවන සංවිධාන විසින් අරමුදල් සපයනලද |
| 07. | ලාහුගල | - | වත්මන් තත්වය |

**ගම් වලට අරමුදල් සැපයීම**

ගම් වල මූලික පහසුකම් දියුණු කිරීම සඳහා අදාළ ගම්මාන වලට අරමුදල් සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ අදාළ පළාත් සංචාරක අධිකාරීන් මගින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ලබා දීමට දැනටමත් කටයුතු කර ඇත.

**ගැමියන් දැනුවත් කිරීම**

සංකල්පය, අවශ්‍ය ප්‍රමිති හා සංචාරකයන්ට සැපයෙන සේවා පිළිබඳව ගම්වැසියන් අතර දැණුම වර්ධනය කිරීම සඳහා සියලු ගම්මාන වල මූලික දැනුවත් කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පවත්වා ඇත.

### සංචාරක තේමා ගම්මාන සඳහා මාර්ගෝපදේශ

මීට අමතරව, සංචාරක සත්කාරක නිවාස ගම්මාන වල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මාර්ගෝදේශය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සකසා ඇත.

### ගම්වල ප්‍රජා පාදක සංවිධානය පිහිටුවීම

මිට අතිරේකව, මධ්‍යම පළාතේ වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව සමග එක්ව සංචාරක ගම්මාන පාලනය කිරීම අපේක්ෂා කෙරන ප්‍රජා පාදක සංවිධානය (CBO) සඳහා ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහාය වි ඇත.

තවද, උක්ත ගම් වලින් ඇතැම් ඒවායේ ඇති නිවැස් නවාතැන් පරීක්ෂා කිරීම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අරඹා ඇති අතර එම ක්‍රියාදාමය හදුනාගත් සියලුම ගම්වලට එලෙසම අඛන්ඩව ක්‍රියාත්මක කෙරේ. මෙමගින්, සංචාරකයන්ට නවාතැන් ගැනීමට සුදුසු යැයි හදුනාගෙන ඇති නිවාස වල සිදු කළ යුතුව ඇති වැඩිදියුණු කිරීම් හදුනා ගැනීමටත් අවශ්‍ය ප්‍රමිතීන් පිළිබදව නිවැසියන් දැනුම්වත් කිරීමට සැළසුම් කර ඇත.

### ඉදිරි සැලසුම්

#### කෙටුම්පත් කළ මාර්ගෝපදේශ සඳහා අනුමැතිය

සංචාරක ගම්මාන සඳහා කෙටුම්පත් කළ මාර්ගෝපදේශ වැඩිදුරටත් සාකච්ජා කර අදාල අනුමැති ලබා ගැනීමට නියමිතය. එම මාර්ගෝපදේශ පදනම් කරගෙන නිවාස වල තත්වය උසස්කර සුදුසු ගම් පමණක් ලියාපදිංචි කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය බලාපොරොත්තු වේ.

#### බැංකු මගින් සුළු හා මධ්‍ය ව්‍යාවසායික ණය යෝජනා ක්‍රමයක් හදුන්වාදීම

සත්කාරක නිවාස ගම්මාන හිමිකරුවන්ට තම නිවාස අවශ්‍ය පරිදි දියුණු කර ගැනීමට මුදල් සැපයීමක් ලෙස විශේෂ ණය යෝජනා ක්‍රමයක් ඇති කිරීම සඳහා රාජ්‍ය හා පුද්ගලික බැංකු සමඟ සාකච්ජා කිරීමට නියමිතය.

#### පාරිභෝගික සේවා පිළිබඳ පුහුණු වැඩසටහන්

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් මෙකී ගම්මාන වල ගැමියන් සූදානම් කිරීම සඳහා පාරිභෝගික සේවා පිළිබඳව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට නියමිතය.

#### අලෙවිකරණ සැලැස්මක්

ගම්වල පහසුකම් ඇති කරමින් සංචාරක ගම්මාන සඳහා නිසි අලෙවි ක්‍රමවේදයක් සැලසුම් කිරීමට ද බලාපොරොත්තු වන අතර පුහුණුව ලබා දීම් අවසන් කර ඇත.

■ **ක්ෂේත්‍ර චාරිකාව - හීල් ඔය සංචාරක ග්‍රාමය**









දිනය : 2015 ජනවාරි 25

සහභාගිත්වය :

1. ශිරානි වීරකෝන් මිය, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානු ආගමික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්
2. මල්රාජ් කිරිඇල්ල මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
3. ආචාර්ය අස්ලම් මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - සබරගමුව විශ්ව විද්‍යාලව
4. ඇටම්පාවල මහතා, අධ්‍යක්ෂ, වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත
5. භාග්‍යා මහවිදානගේ මිය, සහකාර අධ්‍යක්ෂ, ප්‍රමිති හා තත්ව ආරක්ෂණ අංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

නකල්ස් කදු වැටිය අද්දර අසල පිහිටි සංචාරක ගම්මානයක් ලෙස සංවර්ධනය කෙරෙමින් පවතින හීල් ඔය ග්‍රාමයට චාරිකාවක් මධ්‍යම පළාත් වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කර තිබුනි. නිලධාරීන් එහි ගම්වැසියන් හා ගමේ නායකයන් හමු වී සංවර්ධන කටයුතු වල ප්‍රගතිය හා ඉදිරියේ

දී සිදු කිරීමට අවශ්‍ය කටයුතු පිළිබඳවත් සාකච්ඡා කෙරිනි. ඉදිකෙරෙමින් පවතින ප්‍රජා ශාලාව එම පිරිස විසින් නිරීක්ෂණයට ලක් කෙරිනි.

- මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන සහ එම පළාතේම වෙළඳ, වාණිජ හා සංචාරක කටයුතු වලට අදාළ නිලධාරීන්ව දැනුවත් කිරීමේ වැඩසටහන

දිනය : 2015 මාර්තු 27
වේලාව : පෙ.ව. 9 සිට ප.ව. 3.30 දක්වා
ස්ථානය : වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව - ගැටඹේ, මහනුවර

මධ්‍යම පළාතේ වෙළඳ, වාණිජ හා සංචාරක අංශ වල ඉල්ලීම පරිදි, සංචාරක සත්කාරක නිවාස වැඩසටන සහ සත්කාරක නිවාස ගම්මාන ඇති කිරීම පිළිබඳව එක් දින දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමිති හා තත්ව ආරක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ භාග්‍යා මහවිතානගේ විසින් පැවැත්විනි. නිවැස් ලැගුම් ලියාපදිංචිය පිළිබඳ තොරතුරු විමසන පිරිස් හට මගපෙන්වීම් කළ හැකි වන ලෙස නිවැස් ලැගුම් ලියාපදිංචිමේ ක්‍රියාදාමය මෙන්ම අදාළ මාර්ගෝපදේශ නිලධාරීන් හට විස්තරාත්මකව පැහැදිලි කර දුනි.

මීට අමතරව, සංචාරක ගම්මානයක් ඇති කිරීමේ දී සළකා බැලිය යුතු ප්‍රමිතීන් හා වැදගත් සාධක ද කලාපයේ වෙනත් තරගකාරී සංචාරක ස්ථාන වල ඒ හා සමාන කුඩා ගම්මාන සංකල්ප සමඟ සන්සනාදනාත්මක ලෙස ගනිමින් විස්තරාත්මක ව තේරුම් කර දුනි. සත්කාරක නිවාස සංකල්පය ප්‍රාදේශීය ලෙස සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා ඉතා අගනා පියවරක් ලෙස මෙය ප්‍රශංසාවට ලක් වී ඇත.

## දැනුවත් කිරීමේ වැඩසටහන සහ පරිශ්‍ර චාරිකා 2015

**■ මිරිස්සේ පැවැති දැනුවත් කිරීමේ වැඩසටහන**

දිනය : 2015 ජුලි 24
වේලාව : පෙ.ව. 9 - ප.ව. 12.30 දක්වා
ස්ථානය : මිරිස්ස



ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ප්‍රමිති හා තත්ව ආරක්ෂණ අංශය විසින් එක් දින දැනුවත් කිරීමේ වැඩසටහනක් මිරිස්ස සංචාරක මධ්‍යස්ථානයේ සත්කාරක නිවාස පවත්වාගෙන යන්නන් සඳහා පවත්වා සංචාරක නවාතැනක් ලෙස නිවසක් සකස් කර ගන්නා ආකාරය හා සංචාරක සේවාව පිළිබඳව මූලික කරුණු පිළිබඳව ඔවුන් දැනුවත් කර ඇත. ප්‍රදේශයේ ගමක් දියුණු කිරීමේ විභවතාවය ද මෙම වැඩසටහන මගින් ප්‍රදර්ශනය කෙරුනි. රුහුණු සංචාරක කාර්යාංශය මගින් වැඩසටහන සංවිධානය කර තිබුනි.

**■ දැන්වත් කිරීමේ වැඩසටහන - යාපහුගම**

දිනය : 2015 ඔක්තෝබර් 06
වේලාව : පෙ.ව. 9 - ප.ව. 2.00
ස්ථානය : යාපහුගම ප්‍රජා ශාලාව









යාපහුව ඓතිහාසික ස්ථානයට ඉතා ආසන්නයේ පිහිටා ඇති යාපහුගම නමැති ග්‍රාමය එහි ඇති සාම්ප්‍රදායී අංග ලක්ෂණ වල ප්‍රතිඵලයක් ලෙසත් විශේෂයෙන් දුම්රිය මගින් නම් මහඔය දුම්රිය ස්ථානයේ සිටත් පහසු මහාමාර්ග පහසුකම් නිසාත් සංචාරකයන් ආකර්ශනය කර ගැනීමේ හැකියාවක් ඇත. වයඹ පළාත් සභාවේ වයඹ සංවර්ධන අධිකාරය මගින් මෙම ගම හදුනාගෙන සංවර්ධනය කෙරේ.

වයඹ සංවර්ධන අධිකාරිය මගින් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කෙරුනු අතර එය ප්‍රමිති හා තත්ව ආරක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ භාග්‍ය මහවිතානගේ විසින් මෙහෙයවනු ලැබිනි. ගමේ ඇති හරිත හිතවාදී ප්‍රජා මධ්‍යස්ථානය තුල මෙම වැඩසටහන ගැමියන්ගේ සහභාගිත්වයෙන් සිදු විය. මෙම වැඩසටහනේ පරමාර්ථය වූයේ තම නිවසේ එක් කාමරයක් අවශ්‍ය සියළු පහසුකම් සහිතව සංචාරක නවාතැනක් බවට පත් කිරිම පිළිබඳව දැනුවත් කිරිමයි. සංචාරකයන් හට සැහීමකට පත්විමට හැකි සේවයක් ලබා දීමේ ඇති වැදගත්කම වැඩසටහනේ දී අවධාරණය විය.

■ **දැනුවත් කිරීමේ වැඩසටහන - කන්නෙලිය**

කන්නෙලිය යනු සිංහරාජ වැසි වනාන්තර සීමාවේ ලොව ඉහළම ජෛව විවිධත්වය සහිත ඉතා වටිනා ප්‍රදේශයක් ලෙස හදුනාගෙන ඇති විවිධ ආවේනික ගස් වැල් වලට තිඹිරිගෙය වූ ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි රුහුණු සංචාරක කාර්යාංශය මගින් හදුනාගත් හා පවත්වාගෙන සංචාරක ග්‍රාමයකි. සංවර්ධනයට පියවර තබමින් සිටින කන්නෙලිය සංචාරක ග්‍රාමය තුල සංචාරකයන් සඳහා නිවැසි ලැගුම් පහසුකම් මෙන්ම හරිත වර්ගයේ විෂ්මයජනක ක්‍රියාකාරකම් සඳහාත් දොරගුළු විවරව ඇත.









දිනය : 2015 ඔක්තොබර් 30
වේලාව : පෙ.ව. 9 සිට ප.ව. 2.30 දක්වා
ස්ථානය : කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ප්‍රමිති හා තත්ව ආරක්ෂණ අංශය මගින් කන්නෙලිය ග්‍රාමයේ නිවැස් නවාතැන් පවත්වාගෙන යාමට අපේක්ෂා කරන පුද්ගලයන් සඳහා එක් දින දැනුවත් කිරීමේ වැඩසටහනක් හා ගමේ ක්ෂේත්‍ර සංචාරයක් පවත්වා ඇත. තෘප්තිමත් සංචාරක සේවාවක් සඳහා අවශ්‍ය කරන සුදානමක් ලෙස මූලික ප්‍රමිති හා සංචාරක සේවාවන් පිළිබඳව ගම්වැසියන් දැනුවත් කෙරිනි. ගම්වැසියන් මෙන්ම රුහුණු සංචාරක කාර්යාංශයේ නිලධාරීන් ද එකී වැඩසටහනට උද්යෝගීමත්ව සම්බන්ධ විය.

## 5. අවිධිමත් අංශයේ සංචාරක ආයතන වැඩසටහන සැකසීම.

අවිධිමත් අංශයේ සංචාරක ආයතන එක්කාසු කර ගැනිම සඳහා කඩිනම් වැඩසටහනක් හදුන්වා දී ඇත. අවිධිමත් අංශය පිළිබඳ තොරතුරු සීගිරිය, උණවටුන, හික්කඩුව, හම්බන්තොට, ඇල්ල, මීගමුව, ආරුගම්බේ, පොතුවිල්, යාපනය, අම්පාර, ගිරිතලේ, පොළොන්නරුව, හබරණ. අනුරාධපුරය හා ත්‍රිකුණාමලය වැනි ප්‍රධාන සංචාරක කලාප වල ප්‍රාදේශිය සභාව, පළාත් පාලන ආයතනය සහ ඇනවුම් කරන ආයතනය මගින් ඒකරාශී කර ඇත.

අවිධිමත් ආයතන 1248 කින් ලබා ගත් දත්ත වලට අනුව, ආයතන 464 ක් පරීක්ෂාවට ලක් කර, ඉන් 116 ක් ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ කර ඇත. විවිධ වර්ග වලට අයත් ආයතන 46 ක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කරන ලදී.

### අන්තර්ග්‍රාහිත අවිධිමත් අංශයේ සංචාරක ආයතන සඳහා ලියාපදිංචි සහතික ප්‍රදානය

එම සමාරම්භක උත්සව අවස්ථාවේ දිම, වැඩසටහන යටතේ ලියාපදිංචියට සුදුසුකම් ලබන උණවටුන ප්‍රදේශයේ අවිධිමත් අංශයේ අන්තර්ග්‍රහණ වැඩසටහන යටතේ පරීක්ෂාවට ලක් කළ ස්ථාන අතරින් පහත විස්තර කර ඇති සංචාරක ආයතන හයට ලියාපදිංචි සහතික ලබා දිමට කටයුත කර තිබුනි.

| අං. | ව්‍යාපාරයේ නම | ලිපිනය | වර්ගය |
|---|---|---|---|
| 01 | නේචර් ටිරේයිල්ස් | 144ඊ, මාතර පාර, උණවටුන | අමුත්තන්ගේ නිවාස |
| 02 | රිටාස් හෝටලය හා වෙරළබඩ අවන්හල | අංක 29, වේවැල්ගොඩ පාර, නාරිගම, හික්කඩුව | අමුත්තන්ගේ නිවාස |
| 03 | විලා අමාෂෙ | අංක 28/ඊ, මධ්‍යම පාර, උතුරු තල්පිටිය, වාද්දුව | බංගලා |
| 04 | මිහිරි බීච් හවුස් | සනුක් හෝල්ඩිංස්, මිහිරි බීච් හවුස්, මාතර පාර, තල්පේ | බංගලා |
| 05 | ස්පා සිලෝන් | ගාලු කොටුව, ගාල්ල | ස්පා ) සුවතා |
| 06 | ග්ලොරියා ග්‍රෑන්ඩ් හෝටලය | යද්දෙහිමුල්ල පාර, උණවටුන | ස්පා ) සුවතා |





ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල්වරයා, සීමා. ඉන්ද එක්ස්ෆෝ සර්ටිෆිකේෂන්හි සභාපති හා අධ්‍යක්ෂ, ගාල්ල (සෞඛ්‍ය අමාත්‍යාංශය) දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා කාර්යාලයේ අධ්‍යක්ෂ, හබරාදුව ප්‍රාදේශිය සභාවේ ලේකම් සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිලධාරීන් උත්සවයට සහභාගී විය.

**උණවටුන සංචාරක ආයතන වලට ගරු අමාත්‍යතුමා පැමිණිම**

නිල උත්සවයෙන් අනතුරුව, ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා ඇතුළු අනෙතුත් සම්භාවනීය අමුත්තන් උත්සවයේ දි ලියාපදිංචිය ලත් සංචාරක ආයතන කිහිපයක් නැරඹිය.





## 7.7 මානව සම්පත් හා පරිශ්‍ර කළමනාකරණය

2015 දෙසැම්බර් 31 දිනට අනුමත හා දැනට සේවයේ නිරත සේවක සංඛ්‍යාව

**සේවක ප්‍රමාණය**

| අං. | වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය කාර්ය මඩුල්ල |
|---|---|---|---|
| | | | 2015 |
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 01 | - |
| 03 | අධ්‍යක්ෂ | 07 | 04 |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 24 | 06 |
| 05 | සහකාර අධ්‍යක්ෂ | | 17 |
| 06 | කණිෂ්ඨ කළමනාකරු | 30 | 22 |
| 07 | කළමනාකරණ සහායක | 50 | 51 |
| 08 | රියදුරු | 13 | 13 |
| 09 | කාර්යාල කාර්ය සහායක /කම්කරු | 26 | 22 |

| | | | |
|---|---|---|---|
| 11 | වේටර් කාමර සේවක | 25 | 24 |
| 11 | අරක්කැමි | 13 | 13 |
| 12 | බහුකාර්ය තාක්ෂණවේදී | 02 | 01 |
| 13 | ජීවිතාරක්ෂක භට | 04 | 03 |
| 14 | පොම්ප ක්‍රියාකරු | 03 | 04 |
| 16 | නිකේතන නිලධාරි - කොන්ත්‍රාත් | | 01 |
| එකතුව | | 199 | 182 |

**නව බඳවාගැනීම් - 2015**

පහත දැක්වෙන තනතුරු වලට 2015 වසරේ දී බඳවා ගැනීම් සිදු විය.

| තනතුර | සංඛ්‍යාව | දිනය |
|---|---|---|
| කාර්යාල සහායක (අනියම් පදනම) | 06 | 2015 මැයි 15 |
| රියදුරු (අනියම් පදනම) | 03 | 2015 මැයි 15 |
| වේටර් කාමර සේවක (අනියම්) | 03 | 2015 මැයි 15 |
| පොම්ප ක්‍රියාකරු (අනියම්) | 01 | 2015 ජූනි 01 |
| සහකාර අධ්‍යක්ෂ | 09 | 2015 ජූලි 02 |
| කළමනාකරණ සහකාර (අනියම්) | 14 | 2015 අගෝස්තු 24 |
| සහකාර අධ්‍යක්ෂ | 01 | 2015 දෙසැම්බර් 01 |

**විශ්‍රාම ලැබූ නිලධාරීන් - 2015**

| අං. | නම | තනතුර |
|---|---|---|
| 01 | කේ. ඒ. පොඩිරාළහාමි මයා | කණිෂ්ඨ කළමනාකරු 2 ශ්‍රේණිය |
| 02 | එච්. ගුණතිලක මයා | අරක්කැමි |
| 03 | එස්. ගෝවින්දරාජා මයා | කම්කරු |

**සේවනේ ඉල්ලා අස්වූ නිලධාරීන් - 2015**

| අං. | නම | තනතුර |
|---|---|---|
| 01 | රන්ජිත් බණ්ඩාර මයා | අධ්‍යක්ෂ |
| 02 | අනුෂ්කා කහදගම මිය | සහකාර අධ්‍යක්ෂ |

**අභ්‍යන්තර උසස්වීම්**

<table>
<tr><th>අං.</th><th>නම</th><th>උසස්වීම ලද තනතුර</th><th>උසස්වීම දුන් දිනය</th></tr>
<tr><td>01</td><td>චන්දන විජේරත්න මයා</td><td>වැඩබලන අධ්‍යක්ෂ</td><td>ඔක්තෝබර් 15</td></tr>
<tr><td>02</td><td>ඉනෝකා පුංචිහේවා මිය</td><td>නියෝජ්‍ය අධ්‍යක්ෂ</td><td>මැයි 01</td></tr>
<tr><td>03</td><td>සංජීව රත්නකුමාරි මිය</td><td rowspan="5">කණිෂ්ඨ කළමනාකරු</td><td rowspan="5">මැයි 01</td></tr>
<tr><td>04</td><td>චන්ද්‍රිමා ගමගේ මිය</td></tr>
<tr><td>05</td><td>රම්‍යා සමරසිංහ මිය</td></tr>
<tr><td>06</td><td>සුගන්දි දොඩවත්ත මිය</td></tr>
<tr><td>07</td><td>ටී.ඩී.එන්. රේණුකා මිය</td></tr>
</table>

## පුහුණු සහ සංවර්ධන

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය පහත දැක්වෙන දේශීය පුහුණුවීම් වලට සහභාගී වී ඇත.

| අං. | සහභාගීවූවන් | වැඩසටහන | කාලය |
|---|---|---|---|
| 01 | චන්දිම ගමගේ මිය නදීකා<br>සෙනෙවිරත්න මිය<br>අනුප රණවීර මයා | ධනාත්මක චින්තනය හා ස්වයං උත්ප්‍රේරණය - කම්කරු අධ්‍යයන ජාතික ආයතනය | 23.03.2015 |
| 02 | ඉනෝකා පුංචිහේවා මිය | විනය ක්‍රියාමාර්ග හා සේවක දුක්ගැණවිලි - සීමා. කෙයා රෙන්ස් ඇන්ඩ් ජෝන්ස් (පුද්.) සමාගම | 31.03.2015 |
| 03 | කේ.එම්. නහීම් මිය<br>සංජීවා රත්නකුමාරි මිය | මූලික ප්‍රසම්පාදන ක්‍රමවේදය - සීමා. ප්‍රාග් සර්විස් (පුද්.) සමාගම | 31.03.2015 |
| 04 | එස්. ප්‍රේමකුමාර් මිය | පරිසර දූෂණය වැලැක්වීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව - මධ්‍යම පරිසර අධිකාරිය | 09.05.2015<br>සිට 11.07.2015<br>(සෙනසුරාදා පමණි) |
| 05 | ඩී.පී. නන්දන මයා | ISO 9001 :2008 ප්‍රමිති කළමනාකරණ පද්ධතිය අනුකුල අභ්‍යන්තර විගණනය - ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය | 2015 මැයි 19 -20 . |
| 06 | එම්.ආර්.වී.එස්. පීරිස් මයා<br>ආර්.වී. ප්‍රේමචන්ද්‍ර මයා<br>ආර්.ඩී.එම්. පද්මලතා මිය<br>වී.යූ. අනුරාධා මිය<br>ටී.ඩී.එන්. රේනුකා මිය | බඳවාගැනිමේ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව - සීමා. ප්‍රාග් සර්විස් (පුද්.) සමාගම | 13.05.2015 |
| 07 | දීපා මුණසිංහ මිය<br>එස්.පී. හදපාන්ගොඩ මිය<br>ජීවන්ති කුමාරිහාමි මිය | මිල ගණන් ඇගයුම්හි ප්‍රායෝගික පැතිකඩ පිළිබඳ වැඩමුළුව - භාෂා, තාක්ෂණය ) පුහුණු සහ සංවර්ධනය සඳහා වු ඔලන්වේ ආයතනය | 2015 ජූනි 18-19 |
| 08 | පී. ජයසිංහ මිය<br>කේ.එම්. නහීම් මිය<br>ඩබ්.සී.එන්.කේ.<br>තෙන්නකෝන් මයා<br>වී.යූ. ගමගේ මිය<br>ජේ.සී. ගුරුගේ මිය | වියදම් ) ගෙවුම් ක්‍රමවේදය - සීමා. ප්‍රාග් සර්විස් (පුද්.) සමාගම | 23.07.2015 |
| 09 | ජීවන්ති කුමාරිහාමි මිය<br>අනුරාධා පෙරේරා මිය<br>ශාලිකා සිංහාරගේ මිය | විගණන විමසුම් පිළිබඳව දැනුවත් කිරිමේ වැඩසටහන | 2015 ඔක්තෝබර් 01--02 |
| 10 | කේ.එම්. නහීම් මිය<br>ජයනි ගුරුගේ මිය | 2015 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන (අවසන් ගිණුම්ඡ) සැකසීම - සීමා. ප්‍රාග් සර්විස් (පුද්.) සමාගම | 29.09.2015 |
| 11 | 08 දෙනෙකු | සංචාරක කර්මාන්තයේ අනාගතය ) ආදායම් ඉපයීම සඳහා වගකිවයුතු ප්‍රවාහනය පිළිබඳ සම්මන්ත්‍රණය | 28.09.2015 |
| 12 | එච්.එල්.එස්. අමරසිංහ මිය<br>වී.වී. ප්‍රසංජීව මයා | එක්ස්චල් හි උසස් මෙවලම් විමර්ශනය - ෆෙ ඇඩමිස් | 09.10.2015 |

| | | | |
|---|---|---|---|
| 13 | ජීවන්ති කුමාරිහාමි මිය<br>ශ්‍රීනා වීරකෝන් මිය<br>අනුරාධා පෙරේරා මිය<br>ශාලිකා සිංහරාජ මිය<br>නිල්මිනී සේරසිංහ මිය<br>සාගරිකා විජේරත්න මිය | 2016 සඳහා ප්‍රසම්පාදන සැළැස්ම සැකසීම - සීමා. ප්‍රාග් සර්විස් (පුද්.) සමාගම | 13.10.2015 |
| 14 | කේ.එම්. නහීම් මිය | අභ්‍යන්තර විගණනය | 04.11.2015 |
| 15 | නිල්මිනි සේරසිංහ මිය<br>සාගරිකා විජේරත්න මිය | වාර්ෂික තොග ගණනය ) අලුත්වැඩියා කළනොහැකි අයිතම ඉවත් කිරීම | 02.12.2015 |
| 16 | ඉන්ද්‍රජිත් සේනානායක මයා<br>සුසිල් තොටගමුව මයා<br>එම්.ඒ.සී.ටී. මුනසිංහ මයා | එක්ස්චල් හි උසස් මෙවලම් විමර්ශනය | 16.12.2015 |

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා අභිප්‍රේරණ සම්මන්ත්‍රණ**

ස්ථානය : අවන්හල පෙදෙස, සමුද්‍රා හෝටලය, SLITHM

- **දිවියට කුසලතා**
  සම්මන්ත්‍රණය ඉන්දික ක්‍රිශාන්ත පෙරේරා මහතා විසින් 2015 පෙබරවාරි 20 වන දින පවත්වන ලදී.

- **ඉදිරිපත් කිරීම - 21 වන ශතවර්ෂයේ කළමනාකරණ සම්මුති**
  ආචා. අජිත් රෝහණ කොලොන්න මහතා විසින් 2015 මාර්තු මස 03 වන දින පැවැත්විය.

- **ආවේගශීලී ආරංචි පිළිබඳ සමුළුව**
  මෙම සම්මන්ත්‍රණය කළමනාකරණ හා ක්‍රමෝපාය පිළිබඳ උපදේශක ට්‍රවෝ මෙන්ඩිස් මහතා විසින් 2015 මාර්තු 19 වන දින පැවැත්වීය.

- **සම්මන්ත්‍රණය - "සිහිකල්පනාව හා ආතතියෙන් තොර දිවි පෙවතක්"**
  2015 මාර්තු 31 වන දින මෙම සම්මන්ත්‍රණය අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික ආශා ඩයස් මිය විසින් පවත්වනු ලැබිනි.

- **"අපේ වන ජීවී සම්පත - ලොවේ ආශ්චර්යයක්" පිළිබඳ වැඩමුළුව**
  මෙම වැඩමුළුව 2015 මැයි 06 වන දින ශ්‍රී ලාල් මෛත්‍රිපාල මහතා විසින් පවත්වන ලදී.

- **ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රයේ විකල්ප මාවත්**
  සීමා. ඉකො ටෙක් පුද්. සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ අනුරුද්ධ බණ්ඩාර මහතා විසින් 2015 ජුනි මස 17 වන දින වැඩමුළුව මෙහෙයවන ලදී.

- **"දැක්ම සමාජ වගකීම්"**
  ආචා. අජිත් රෝහන කොළොන්න මහතා විසින් 2015 ජුලි 29 දින මෙහෙයවන ලදී.

- **පාරිභෝගික සේවා අනුග්‍රහයන්**
  සම්මන්ත්‍රණය ප්‍රීති ගුණරත්න මිය විසින් 2015 අගෝස්තු 25 වන දින මෙහෙය විය.

## 7.8 තොරතුරු හා සංනිවේදන තාක්ෂණය

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සඳහා තුන් අවුරුදු (2015-2019) තොරතුරු තාක්ෂණ විහිදුම් ක්‍රමවේදයක් (දල කෙටුම්පත) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ICT අංශය විසින් සකසා ඇත. දල කෙටුම්පතක් ලෙස සළකා සංචාරක ක්ෂේත්‍රයේ නිරත සංවිධාන වලට පොදු තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමටත් පිරිවැය අවම කර ගැනීමට සම්පත් බෙදාහදා ගැනීමේ දී උපකාරි වන හා සමස්ත නිෂ්පාදිතය හා කාර්යක්ෂමතාවය වැඩි කිරීමට තාක්ෂණ යෙදවුම් වල ස්ථිරතාවය ආයතන වලට අත් වන තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කිහිපයක් දියත් කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සැළසුම් කරමින් සිටි. මෙම සැළැස්ම මගින් සංවිධානමය කාර්යක්ෂමතාවය, සේවාදායක අත්දැකීම් දියුණුකර ගැනීම සහ අලෙවිකරණය / ප්‍රවර්ධන සහ ශ්‍රී ලංකා සංචාරක උනන්දුවක් දක්වන්නන් හට සේවා සැපයීම යනාදීයට අදාළව තාක්ෂණයන් පුළුල් ලෙස ආවරණය කිරීමක් සිදු වේ.

සංචාරක මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයට (ඉදිරි පරම්පරාවන් තෙක් සංචාරක කර්මාන්තය ගෙනයාම) කලාපයේ හා ලෝකයේ වෙනත් ස්ථාන අභිබවා තාක්ෂණ දියුණුව සමපාත කරමින් තරඟකාරී තත්වය අත්පත් කර ගැනීමට හා එය රඳවා ගැනීමට මෙම ව්‍යාපෘති වලට හැකි වනු ඇත.

2015 වසරේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති වලින් කිහිපයක් පහත දක්වා ඇත.

- ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය සඳහා ඇමතුම් මධ්‍යස්ථානය
- සම්පත් සැළසුම්කරණය සංවිධානය
- සංචාරකමය ප්‍රවේශ සියල්ල නවීකරණය කිරීම
- ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය නංවන ඩිජිටල් අලෙවි සැළැස්ම
- ශ්‍රී ලංකා සංචාරක දත්ත ගබඩාව

මීට අතිරේකව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ දත්ත මධ්‍යස්ථානය දත්ත ගබඩාවක් (Cloud platform) ක් වෙත ගෙන යාමට ICT අංශය සැළසුම් කර ඇත. එමගින් ශ්‍රී ලංකා ටෙලිකොම් විසින් ලබා දෙන දත්ත ගබඩාවෙහි තම තොරතුරු තාක්ෂණ පහසුකම් ගෙන යන පළමු රාජ්‍ය ආයතන වලින් එකක් බවට පත් වනු ඇත.

## 7.9 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණය යනු කිසියම් ආයතනයක වටිනාකම් එක් කරන හා මෙහෙයුම් වැඩිදියුණු කරවීමට සැළසුම් කර ඇති ස්වාධීන, විෂය මූලික සහතික කිරීමක් සහ උපදෙස් හා මුසුවන කටයුත්තකි.

පහත සඳහන් ක්‍රම මගින් කාර්යසාධනත්වය වර්ධනය කිරීමට හා වටිනාකම් නිශ්චය කර ගැනීමට හැකි ක්‍රමවත් සංවිධානාත්මක ප්‍රවේශයක් එක් කරන ආයතනයකට තම පරමාර්ථ සපුරා ගැනීමට අභ්‍යන්තර විගණනය උපකාරී වේ.

- අවදානම් කළමනාකරණය
- පාලනය
- රාජ්‍ය පාලන ක්‍රමවේද

අභ්‍යන්තර විගණනයේ විෂය පථය සැළකිල්ලට ලක් කළ විට එය කළමනාකරණයේ “දෑස්” ලෙස පොදුවේ සැළකේ. තොරතුරුවල විශ්වාසනීයත්වය තහවුරු කර ගැනීම, නීති හා රෙගුලාසි අනුගමනය කිරීම, ආයතනයක වත්කම් ආරක්ෂා කර ගැනීම සහ කාර්යසාධනය රැකගැනීම සඳහා මූල්‍ය විගණනයන් හා කාර්යසාධන විගණන අභ්‍යන්තර විගණනය මගින් සිදු කෙරේ. මේ සඳහා අනුකූලතා පිරික්සුම්, ස්වාධීන පරීක්ෂා කිරීම්, මුදල් වටිනාකම විගණනය වැනි විගණන ශිල්පීය ක්‍රම අභ්‍යන්තර විගණනය සඳහා යොදා ගැනේ.

### ඉලක්ක හා ජයග්‍රහණ

වාර්ෂික අභ්‍යහන්තර විගණන සැළැස්මට අනුව, අභ්‍යන්තර විගණන වාර්තා 8 ක් ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා යෝජනා හා නිර්දේශ සමඟ කළමනාකාරීත්වය වෙත ලබා දී ඇත. ලබා දී ඇති නිර්දේශ වලට අනුව අදාළ නිලධාරීන් විසින් පියවර ගෙන ඇති බැවින් පිරිවැය අවම කිරීමට මෙන්ම වඩා යහපත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වාදීම මගින් ඇතැම් ක්ෂේත්‍ර වල ක්‍රමවේදය ක්‍රමවත් කිරීමට එය හේතු වී ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිවාඩු නික්තන හා ලැගුම්හල් වල වෙන්දේසි කිරීම් වලදී අභ්‍යන්තර විගණන අංශය සහාය වී ඇති අතර පවතින සීමිත මානව සම්පත යොදාගෙන මෙම කාල සීමාව තුලදී පරීක්ෂණ කිහිපයක් සිදු කිරීමට සහයෝගය දීමට හැකි විය.

වසර තුලදී විගණන හා කළමනාකරණ කමිටුවල කාර්තුමය ලෙස රැස්වීම් හතරක් කැඳවීමට ද කටයුතු කෙරිනි.

### පූර්ව විගණනය

පාඩු, වංචා හා ප්‍රමාදදෝෂ අවම කිරීම සඳහා ගෙවීම් කිරීමට පෙර පූර්ව විගණන වවුචර සැකසීමට විගණන හා කළමනාකරණ කමිටුව තීරණය කර ඇත. අද වන විට අභ්‍යන්තර විගණන විසින් පූර්ව විගණන වැඩසටහන (රු. 100,000 ට වඩා වැඩි වටිනාකම ඇති වවුචර් ගෙවීම) 2015 ජූනි මස සිට AMC හි උපදෙස් අනුව 100 කට ආසන්න වවුචර්පත් ප්‍රමාණයක් පරීක්ෂා කර පූර්ව විගණන අවසන් කර ඇත.

## 7.10 විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම

මූල්‍ය කළමනාකරණ අංශයේ 2015 වර්ෂය තුල කාර්යසාධනය පහත දක්වා ඇත.

| | 2015 | % | 2014 | % | 2013 |
|---|---|---|---|---|---|
| EL | 1,968,541,098.67 | 11 | 1,779,76,146.71 | 11 | 1,604,887,048.67 |
| TDL | 1,014,773,185.20 | 1 | 1005,566,833.24 | (1) | 1,014,153,899.71 |
| **අනෙකුත්** | 10,239,483.91 | (79) | 52,099,002.02 | 754 | 6,099,936.95 |
| | 2,994,153,767.78 | 6 | 2,837,431,961.97 | 8 | 2,625,140,885.33 |
| **නැව් නැගීමේ බදු** | 275,595,753.85 | 11 | 249,167,260.56 | 11 | 224,684,186.81 |
| **සංචාරක සංවර්ධන බදු** | 142,824,736.75 | (3) | 147,343,871.55 | 4 | 142,107,586.11 |
| **ගාස්තු සහ බලපත්‍ර** | 111,758,601.17 | 2 | 109,480,303.69 | 8 | 101,269,882.49 |
| **සංචාරක නිවාස මෙහෙයුම් අතිරික්තය (ඌනතාවය)** | (12,392,516.17) | (910) | 1,529,200.76 | (67) | 4,642,129.21 |
| **අනෙකුත් ආදායම්** | 26,849,438.59 | (30) | 38,327,329.021 | 26 | 30,530,590.45 |
| | 544,636,014.19 | (0) | 545,847,965.58 | 8 | 503,234,375.07 |
| **පුනරාවර්තන වියදම්** | 236,323,490.04 | 7 | 220,818,704.05 | (3) | 227,175,587.48 |
| **ප්‍රාග්ධන වියදම්** | 131,231,433.24 | 94 | 67,510,086.50 | (36) | 105,047,499.21 |
| | 367,554,923.28 | 27 | 288,328,790.55 | (13) | 332,223,086.69 |

## 7.11 නීති අංශය

### නීති අංශයේ ප්‍රධාන කාර්යභාරයන්

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ඕනෑම අවස්ථා වලදී නීති උපදෙස් සැපයීම.
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සහ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සහ අධ්‍යක්ෂ මණ්ඩල මහලේකම් කාර්යාලය ලෙස කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට එරෙහිව එළැඹි නෛතික පියවර හා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පැවරූ නඩු වලට අදාළව නීතිමය ලේඛණ සැකසීම සහ අධිකරණ, කම්කරු විනිශ්චය සභා, මානව හිමිකම් කොමිසම සහ කම්කරු කොමසාරිස් හා වෙනත් විනිශ්යාධිකරණ ඉදිරියේ පෙනී සිටීම

- නීතිපති දෙපාර්තමේන්තුව සහ පුද්ගලික නීතිඥවරු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙනුවෙන් එහි නෛතික කටයුතු වලදී සම්බන්ධීකරණය කිරීම හා සාකච්ඡා පැවැත්වීම
- සේවා ගිවිසුම්, රැකියාගත කොන්ත්‍රාත්, කල් බදු ගිවිසුම් යනාදි ගිවිසුම් සැකසීම හා ක්‍රියාවට නැංවීම
- අවශ්‍යතාවයක් ඇති වන්නා අවස්ථාවලදී සභාපතිවරයාට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ මානව සම්පත් දෙපාර්තමේන්තුවට විනය ක්‍රියාමාර්ග වලදී උපදෙස් දීම සහ විනය ක්‍රියාමාර්ග වලට අදාළව ගත යුතු පියවර වල ලේඛණ කෙටුම්පත් කිරීම

2015 වසර තුලදී නීති අංශය මගින් පහත දැක්වෙන කාර්යභාරයන් ඉටු කර ඇත.

**කල්බුදු ගිවිසුම්**

| ගිවිසුම් වර්ග | පාර්ශ්වයන් | කාල සීමාව |
|---|---|---|
| අංක 126 ) 127 දරණ කල්බදු ගිවිසුම | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ මංගලිකා අමරසිංහ නොහොත් අබේකෝන් සහ ආචා. සරත්චන්ද්‍ර අමරදාස අබේකෝන් අතර - බෙන්තොට වරාහේන ලිං පරිශ්‍රය සඳහා | වසර පහක (05) කාලයක් සඳහා |
| අංක 128 බද්ද ) අංක 129 දරණ කල්බදු ගිවිසුම අහෝසි කිරීම | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා සීමා. ක්වික්ෂෝස් (පුද්,) සමාගම නුවරඑළිය තානායම | වසර 30 කාලයක් සඳහා |
| සේවා ගිවිසුම | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා ජාතික ජල සම්පත් හා ජලාපවාහන මණ්ඩලය අතර - පාසිකුඩා නිකේතනයට වෙත මනා ප්‍රමිතියක් ඇති අඛණ්ඩ ජල සැපයුම ලබා දීම | මාස 08 ක කාලයක් සඳහා |
| | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ටෙක්ස්පර්ට්ස් පාරිසරික ඉංජිනේරුවන් අතර - බෙන්තොට නිකේතනයෙහි හි පොදු මල පිරිසිදු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | වසරක කාලයක් සඳහා |
| | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ සීමා. ටොප් ෂයින් එන්වයරන්මන්ටල් සර්විසස් පුද්. සමාගම අතර - පිරිසිදු කිරීමේ සේවා සම්බන්ධව | වසරක කාලයක් සඳහා |
| | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ සීමා. ටාගට් එන්වයරන්මන්ටල් සර්විසස් සමාගම අතර - පිරිසිදු කිරීමේ සේවා සම්බන්ධව | |
| කොන්ත්‍රාත් පත්වීම් | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා පාසිකුඩාහි නිකේතනයෙහි නිකේත නිලධාරි ලෙස මොහමඩ් මහීර් මහතා අතර | වසරක කාලයක් සඳහා |

## ශ්‍රී ලංකා සංචාරක නාමාවලිය

| නිලධාරියාගේ නම | | දුර. අංකය | අභ්‍යන්තර දුර. අංකය | ෆැක්ස් අංකය | වි-ලිපිනය |
|---|---|---|---|---|---|
| සභාපති | පි.එම්. විතාන මයා | 2437759 | 100 | 243 7953 | chairman@srilanka.travel |
| අධ්‍යක්ෂ ජනරාල් | එම්.බී. කිරිඇල්ල මයා | 2426907 | 207 | 244 4165 | dg@srilanka'travel |
| අධ්‍යක්ෂ - මානව සම්පත් හා පරිශ්‍ර කළමනාකරණය | තරංගා රූපසිංහ මිය | 2423120 | 308 | 234 8716 | tharangar@srilanka.travel |
| අධ්‍යක්ෂ - දේශීය සංචරණය හා ප්‍රජා සබඳතා | එම්. ලියනාරච්චි මයා | 2329000 | 335 | | mihira@srilanka.travel |
| අධ්‍යක්ෂ - මූල්‍ය කළමනාකරණය | සම්පත් ගනේපලආරච්චි මයා | 2437063 | 200 | 244 8740 | sampathk@srilanka.travel |
| අධ්‍යක්ෂ - නිකේතන කළමනාකරණය | කේ.ඩී.එස්.එස්. වීරසේකර මයා | 2440006 | 340 | 242 3447 | sisiraw@srilanka.travel |
| අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | උදාන වික්‍රමසිංහ මයා | 2436321 | 223 | | udana@srilanka.travel |
| අධ්‍යක්ෂ - ප්‍රමිති හා තත්ත්ව ආරක්ෂණය | චන්දන විජේරත්න මයා | | 401 | 238 2623 | chandana@srilanka.travel |
| අධ්‍යක්ෂ - සැලසුම් හා සංවර්ධන | පී.යු. රත්නායක මයා | 2437062 | 203 | 238 2622 | rath@srilanka.travel |
| නීති නිලධාරී | ඉනෝකා පුංචිහේවා මිය | 3135943 | 290 | 243 3640 | inoka@srilanka.travel |
| අභ්‍යන්තර විගණක | කේ.එම්. නහීම් මිය | 2335000 | 304 | 233 5000 | karthiv@srilanka.travel |

| | |
|---|---|
| ශ්‍රීලංසංසංඅ හා ශ්‍රීලංසංප්‍රකා හි පොදු දුර. අංක | 2426800 /2426900 |

| ශ්‍රී ලකා සංචාරක සංවර්ධන අධිකාරිය සතු නිකේතන | |
|---|---|
| නුවරඑළිය | 052 2222943 |
| බණ්ඩාරවෙල | 057 2222 209 |
| කතරගම | 047 2235 227 |
| අනුරාධපුරය | 025 2222 188 |
| බෙන්තොට | 034 2275 212 |

| | |
|---|---|
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 2440002 / 4865050 |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 2382201 -14 |



# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
# වාර්ෂික ගිණුම් - 2015



ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



# පටුන

පිටු අංකය


මූල්‍ය තත්ව ප්‍රකාශය 01

ආදායම් ප්‍රකාශය 02

හිමිකම් ප්‍රකාශයේ වෙනස්වීම 03

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 04

ගිණුම් සටහන් 05 - 19

**ඇමුණුම:**

**දේශීය සංචාරක නිකේතන තානායම් කටයුතු**

නිකේතන මෙහෙයුම් සාරාංශය 20

**දේශීය සංචාරක හා නිකේතන**

කතරගම 21

නුවරඑළිය 22


බණ්ඩාරවෙල 23

අනුරාධපුරය 24

**ජාතික නිවාඩු නිකේතන**

බෙන්තොට 25

පොළොන්නරුව / කල්කුඩා 26

# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
## මූල්‍ය තත්ව ප්‍රකාශනය
## 2015 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| තථ්‍ය වත්කම් | | | |
| අතැති හා බැංකුගත මුදල් | 03 | 1,017,291,721.07 | 789,981,437.58 |
| අලෙවි හා වෙනත් ලැබීමට නියමිත දෑ | 04 | 315,202,351.04 | 234,346,225.77 |
| තොග | | 2,387,481.30 | 2,129,190.42 |
| පූර්ව ගෙවීම් | | 2,156,756.72 | 11,682,858.43 |
| අත්තාකාරම් | 05 | 165,968,311.32 | 147,489,692.50 |
| ලැබිමට නියමිත රඳවා ගැනීමේ බදු/ වැට් | | 7,959,006.05 | 6,845,638.35 |
| ලැබිමට නියමිත තැන්පත් | | 9,084,923.78 | 8,683,970.60 |
| අවිනිශ්චිත පොලි | | 2,535,794.85 | 4,913,594.82 |
| ජංගම වත්කම් එකතුව | | 1,522,586,346.13 | 1,206,072,608.47 |
| | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල, පිරියත හා උපකරණ | 02 | 2,523,592,343.16 | 2,449,036,195.95 |
| අඩු කළා : ක්ෂය ප්‍රතිපාදන | | 375,905,248.55 | 315,230,854.66 |
| ලිහා හැරි අගය | | 2,147,687,094.61 | 2,133,805,341.29 |
| එකතු කළා: නොනිමි වැඩ | 06 | 226,565,525.02 | 175,831,995.29 |
| අස්පෘශ්‍ය වත්කම් (සංවර්ධන පිරිවැය ශුද්ධ) | | 35,089,485.68 | 44,377,176.16 |
| පුස්තකාල පොත් | | 1,880,781.06 | 1,880,781.06 |
| දිගු කාලීන ආයෝජන | 07 | 78,408,709.30 | 77,482,122.85 |
| ජංගම නොවන වත්කම් එකතුව | | 2,489,631,595.67 | 2,433,377,416.65 |
| වත්කම් එකතුව | | 4,012,217,941.80 | 3,639,450,025.12 |
| | | | |
| බැරකම් | | | |
| | | | |
| ජංගම බැරකම් | | | |
| ණයගැතියෝ | | 7,035,258.07 | 6,952,517.06 |
| ඉඩම් කල් බදු - ගෙවිය යුතු | | 61,398,750.00 | 61,398,750.00 |
| තැන්පත් /වෙනත් ගෙවීමට ඇති දෑ | | 101,145,996.05 | 64,864,194.70 |
| ගෙවිය යුතු වැට් බදු | | 2,291,429.57 | 1,659,935.25 |
| අත්තිකාරම් ආදායම | | 29,125,940.26 | 27,574,908.88 |
| උපචිත වියදම් | | 62,017,216.75 | 39,742,720.99 |
| විශ්‍රාම පාරිතෝෂිත ප්‍රතිපාදන | 08 | 52,288,318.07 | 42,827,463.25 |
| ජංගම බැරකම් එකතුව | | 315,302,908.77 | 245,020,490.13 |
| | | | |
| දිගුකාලීන බැරකම් | | 19,221,086.80 | 27,343,046.80 |
| ශුද්ධ වත්කම් | | 3,677,693,946.23 | 3,367,086,488.19 |

| | | |
|---|---|---|
| ශුද්ධ වත්කම්/සමකොටස් | | |
| රජයේ ගිණුම | 14,272,174.41 | 14,272,174.41 |
| ප්‍රාග්ධන සංචිත | (243,736,884.06) | (243,736,884.06) |
| කල්පිටිය සමකොටස් | 91,073,378.19 | 88,797,590.98 |
| ප්‍රතිඇගයුම් සංචිතය | 945,835,503.71 | 945,835,503.71 |
| ප්‍රාග්ධන දායකත්වය | 1,636,043,832.98 | 1,636,043,832.98 |
| ආදායම් ගිණුම | 1,232,516,919.55 | 924,185,248.72 |
| ක්ෂයවීමේ අරමුදල | 759,021.45 | 759,021.45 |
| සංචාරක අරමුදල | 930,000.00 | 930,000.00 |
| ශුද්ධ වත්කම්/ සමකොටස් එකතුව | 3,677,693,946.23 | 3,367,086,488.19 |

පිටු අංක 05 සිට 10 ඇති ගිණුම් ප්‍රතිපත්ති හා 11 පිටුවේ සිට 25 පිටුව දක්වා ඇති සටහන් යනු මෙම මූල්‍ය ප්‍රකාශන වලට සම්බන්ධ කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඒ වෙනුවෙන් අත්සන් තබන ලදී.

**එම්.බී. කිරිඇල්ල**
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**පී.එන්. දිසානායක**
අධ්‍යක්ෂ/මූල්‍ය කළමනාකාරිත්වය
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**පී.එම්. විතාන**
සභාපති
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ආදායම් ප්‍රකාශනය
2015 දෙසැම්බර් 31 අවසන් වන කාලසීමාව සඳහා

| | සටහන | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|
| ආදායම | | | |
| අපගමන බදු | 09 | 275,595,753.85 | 249,167,260.56 |
| සංචාරක සංවර්ධන බද්ද | 10 | 142,824,736.75 | 147,343,871.55 |
| ගාස්තු හා බලපත්‍ර | 11 | 111,758,601.17 | 109,480,303.69 |
| අතිරික්තය/(හිගය) - නිකේතන මෙහෙයුම් | 12 | (12,392,516.17) | 1,529,200.76 |
| වෙනත් ආදායම් | 13 | 26,849,438.59 | 38,327,329.02 |
| මුළු ආදායම | | 544,636,014.19 | 545,847,965.58 |
| වියදම් | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | 14 | 96,388,133.54 | 78,959,923.57 |
| සැපයුම් හා භාවිතාකළ පාරිභෝජ්‍ය දෑ | 15 | 54,427,440.86 | 64,371,234.09 |
| වෙළඳාමට අදාළ වියදම් | 16 | 42,564,788.62 | 38,762,326.64 |
| ක්ෂයවීම හා ක්‍රමක්ෂය - වියදම් | | 38,259,525.48 | 35,276,601.00 |
| වෙනත් වියදම් | 17 | 1,320,111.84 | 593,664.27 |
| මූල්‍ය වියදම් | 18 | 3,363,489.70 | 2,854,954.48 |
| මුළු වියදම | | 236,323,490.04 | 220,818,704.05 |
| ලාභය / (පාඩුව) - අදාළ කාලසීමාව | | 308,312,524.15 | 325,029,261.53 |
| ලාභය/ (පාඩුව) - ඉදිරියට ගෙනා | | 924,185,248.72 | 599,155,987.19 |
| කලින් සිදුවූ ප්‍රමාදදෝෂයක් නිවැරදි කිරීම | | 19,146.68 | |
| එකතුව | | 924,204,395.40 | 599,155,987.19 |
| ලාභය/ (පාඩුව) පොදු අරමුදලට ඉදිරියට ගත් | | 1,232,516,919.55 | 924,185,248.72 |

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය - 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා

| | රාජ්‍ය ගිණුම | ප්‍රාග්ධන සංචිත | කල්පිටිය සමකොටස් | ප්‍රතිඇගයුම් සංචිතය | ප්‍රාග්ධන දායකත්වය | ආදායම් ගිණුම | ක්ෂයවීමේ අරමුදල | සංචාරක අරමුදල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2014 දෙසැම්බර් 31 ට ශේෂය | 14,272,174.41 | (243,736,884.06) | 88,797,590.98 | 945,835,503.71 | 1,636,043,832.98 | 924,185,248.72 | 759,021.45 | 930,000.00 | 3,367,086,488.19 |
| පෙර වසරේ ගැලපුම් ( අංක 1.21 සටහන බලන්න ) | - | - | - | - | - | 19,146.68 | - | - | 19,146.68 |
| 2015 ජනවාරි 01 ට ශේෂය | 14,272,174.41 | (243,736,884.06) | 88,797,590.98 | 945,835,503.71 | 1,636,043,832.98 | 924,204,395.40 | 759,021.45 | 930,000.00 | 3,367,105,634.87 |
| වසරේ ලාභය | - | - | - | - | - | 308,312,524.15 | - | - | 308,312,524.15 |
| පොලී ආදායම | - | - | 2,275,787.21 | - | - | - | - | - | 2,275,787.21 |
| 2015 දෙසැම්බර් 31 ට ශේෂය | 14,272,174.41 | (243,736,884.06) | 91,073,378.19 | 945,835,503.71 | 1,636,043,832.98 | 1,232,516,919.55 | 759,021.45 | 930,000.00 | 3,677,693,946.23 |

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා

| | | |
|---|---|---|
| මුදල් ප්‍රවාහ - මෙහෙයුම් ක්‍රියාකාරකම් | | |
| ශුද්ධ අතිරික්තය/(හිගය) - බදු පෙර හා අතිවිශේෂ අයිතම | | **308,312,524.15** |
| ගැලපුම් කර ඇත්තේ | | |
| ක්ෂයවීම් | 70,626,326.20 | |
| වැඩිවීම /(අඩුවීම) අඩමාන ණය සඳහා ප්‍රතිපාදන | 1,159,988.35 | |
| සේවක ණය හා තැන්පතු පොලි | (536,598.44) | |
| (වාසි)/ පාඩුව - වත්කම් විකිණීම | (338,332.00) | |
| ලත් බැංකු පොලි | (14,419,451.35) | |
| පාරිතෝෂිත ප්‍රතිපාදන | 11,201,709.82 | **67,693,642.58** |
| මෙහෙයුම් අතිරික්තය /(හිගය) - කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර | | **376,006,166.73** |
| | | |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම් - ගලාඒම්/ (ගලායාම) | | |
| | | |
| (වැඩිවීම)/අඩුවීම - තොග | (258,290.88) | |
| (වැඩිවීම)/අඩුවීම - ලැබීමට ඇති වෙළඳ | (82,016,113.62) | |
| (වැඩිවීම)/අඩුවීම - පූර්ව ගෙවීම් | 9,526,101.71 | |
| (වැඩිවීම)/අඩුවීම - අත්තිකාරම් | (18,478,618.82) | |
| (වැඩිවීම)/ අඩුවීම - ලැබිය යුතු රැඳවුම් බද්ද/ වැට් බදු | (1,113,367.70) | |
| (වැඩිවීම)/අඩුවීම - ලැබීමට නියමිත තැන්පතු | (400,953.18) | |
| (වැඩිවීම)/ අඩුවීම - අඩමාන පොලී | 2,377,799.97 | |
| වැඩිවීම/(අඩුවීම) - අලෙවි ගෙවීමට ඇති දෑ | 82,741.01 | |
| වැඩිවීම/(අඩුවීම) - තැන්පත් / වෙනත් ගෙවිය යුතු දෑ | 36,281,801.35 | |
| වැඩිවීම/ (අඩුවීම) - ගෙවිය යුතු වැට් බදු | 631,494.32 | |
| (වැඩිවීම)/අඩුවීම - අත්තිකාරම වල ආදායම | 1,551,031.38 | |
| (වැඩිවීම)/අඩුවීම - උපචිත වියදම | 22,274,495.76 | **(29,541,878.70)** |
| ශුද්ධ මුදල - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් | | **346,464,288.03** |
| | | |
| මුදල් ප්‍රවාහ - ආයෝජන ක්‍රියාකාරකම් වලින් | | |
| ගෙවූ පරිතෝෂිත | (1,740,855.00) | |
| කාර්ය මණ්ඩල ණය තැන්පත් පොලි | 536,598.44 | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම | (131,231,433.24) | |
| දේපල, පිරියත හා උපකරණ විකිණීම | 338,332.00 | |
| අයකළ හැකි පිරිවැය - ප්‍රාග්ධන වත්කම් (භජකබ) | 5,296,661.15 | |
| දිගුකාලීන ආයෝජන වැඩිවීම | (926,586.45) | |
| ලත් බැංකු පොලි | 14,419,451.35 | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලට යෙදවූ ශුද්ධ මුදල | | **(113,307,831.75)** |
| | | |
| මුදල් ප්‍රවාහ - මූල්‍ය ක්‍රියාකාරකම් වලින් | | |
| කල්පිටියේ හිමිකම් කොටස් වැඩිවීම | 2,275,787.21 | |
| දිගුකාලීන බැරකම් අඩුවීම - | (8,121,960.00) | |
| මූල්‍ය ක්‍රියාකාරකම් හි යෙදූ ශුද්ධ මුදල | | **(5,846,172.79)** |
| ශුද්ධ වැඩිවීම - මුදල් හා මුදල් වලට සමාන දෑ | | **227,310,283.49** |
| මුදල් හා මුදල් වලට සමාන දෑ - කාලසීමාව ආරම්භයේ දී (20 සටහන ) | | **789,981,437.58** |
| මුදල් හා මුදල් වලට සමාන දෑ - කාල සීමාව අවසානයේදී (19 සටහන ) | | **1,017,291,721.07** |
| | | **1,017,291,721.07** |

# ගිණුම් සටහන්

## 1.0 ගිණුම් ප්‍රතිපත්ති

### 1.01 ගිණුම් අවශ්‍යතා:

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති වලට අනුව සකසා ඇත. ගිණුම් වලට බලපාන උද්ධමනීය කරුණු කිසිවක් ගැලපුම් කර නොමැත.

### 1.02 දන්වා සිටින දිනට පසු සිදුවීම්:

දක්වා සිටින දිනට පසුව සිදුවන සිදුවීම් වල භෞතිකබව සැලකිල්ලට ලක් කර අවශ්‍ය පරිදි ගිණුම් වල අදාළ ගැලපුම් සිදු කර ඇත.

### 1.03 බඩු වට්ටෝරු /තොග:

පිරිවැයට හෝ ශුද්ධ ලබාගත හැකි අගය යන දෙකෙන් අඩු අගයට තොග තක්සේරු කර ඇත.

### 1.04 ක්ෂයවීම්

ක්ෂයවීම් පිරිවැයට හෝ වත්කවම් අගයට සෘජු රේඛිය ක්‍රමය මත පහත ආකාරයට දක්වා ඇත.

| | | | |
|---|---|---|---|
| ඉඩම් | - | කිසිදු ක්ෂයවීමක් නොමැත | |
| ගොඩනැගිලි | - | 5% | (වසර 20) |
| මාර්ග ) සම්බන්ධිත වැඩ | - | 12.5% | (වසර 08) |
| ජල සැපයුම් ) පලාපවාහන | - | 12.5% | (වසර 08) |
| විදුලි සවිකිරීම් | - | 12.5% | (වසර 08) |
| දුරකථන සවිකිරීම් | - | 12.5% | (වසර 08) |
| සවිකිරීම් ) උපාංග | - | 10% | (වසර 10) |
| ලිබඩු | - | 10% | (වසර 10) |
| විවිධ උපකරණ | - | 10% | (වසර 10) |
| පිරියත ) යන්ත්‍රෝපකරන | - | 20% | (වසර 05) |
| මෝටර් වාහන | - | 20% | (වසර 05) |
| දත්ත සැකසුම් උපකරණ | - | 20% | (වසර 05) |
| වීදුරු භාණ්ඩ ) පිඟන් භාණ්ඩ | - | 33 1/3% | (වසර 03) |
| හැදි ගෑරුප්පු ) රිදී භාණ්ඩ | - | 25% | (වසර 04) |
| රෙදි | - | 50% | (වසර 02) |
| සංවර්ධන වියදම් | - | 10% | (වසර 10) |

උක්ත සඳහන් වත්කම් සඳහා ඒවා මිලදී ගත් / අත්පත් කර ගත් වසරට අදාළව ක්ෂය සපයා ඇත.

### 1.05 බොල් ණය ප්‍රතිපාදන

බොල් ණය ප්‍රතිපාදන ඇතැම් පාරිභෝගිකයන්ගේ කුලී තැන්පත් අඩු කර ණයගැති ශේෂයට ඇස්තමේන්තු කර ඇති අතර පහත දැක්වෙන පදනම අනුව ලැබීම් ආකාරය කෙරේ අවධානය යොමු කර ඇත.

| | | |
|---|---|---|
| වසරකට වැඩි එහෙත් වසර 2 ට අඩු | - | ප්‍රතිපාදන සළසා නැත |
| වසර 2 ට වැඩි එහෙත් වසර 3 ට අඩු | - | 05% |
| වසර 3 ට වැඩි එහෙත් වසර 4 ට අඩු | - | 25% |
| වසර 4 හෝ ඊට වැඩි | - | 50% |

### 1.06 හදිසි බැරකම්

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 8 ට අනුව හෙලිදරවු කිරීම සඳහා හදිසි බැරකම් කිසිවක් තිබී නැත.

**1.07 බදු අයකිරීම**

1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ 8(අ)(෴) වගන්තිය යටතේ මණ්ඩලය ආදායම් බද්දෙන් නිදහස් කර ඇත. එසේ වුවද, 2002 අංක 10 දරණ දේශීය ආදායම් සංශෝධන පනත අනුව ලේඛන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුව ඇත.

**1.08 විදේශ මුදල් ගණුදෙනු**

මෙම ගණුදෙනු පහත අනුපාත වලට හරවා ඇත.

| | | |
|---|---|---|
| ලැබීම් ) ගෙවීම් | - | තථ්‍ය |
| සම්ප්‍රේෂණ | - | තථ්‍ය |

**1.09 වත්කම් ප්‍රාග්ධණිකරණය**

2015 වසර තුල ප්‍රාග්ධනිත කිරීමට කිසිදු අයිතමයක් තිබි නොමැත.

**1.10 අත්තිකාරම්**

පහත දැක්වෙන අත්තිකාරම් ජංගම වත්කම් යටතේ දක්වා ඇත.

| | | මුදල (රු./මිලි.) |
|---|---|---|
| 1. | ඉඩම් අත්පත් කර ගැනීම - දෙද්දූව ව්‍යාපෘතිය | 30.00 |
| 2. | ඉඩම් අත්පත් කර ගැනීම - කල්පිටිය ලන්දේසි බොක්ක | 41.00 |

පුද්ගලික පාර්ශ්ව වලින් ඉඩම් පවරා ගැනීම සඳහා රු. මිලියන 30 ක අත්තිකාරම් මුදලක් බෙන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත මුදා හැර ඇත. ඉඩම් අත්පත් කර ගැනිමේ ක්‍රියාවලිය ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් අමාත්‍යාංශය හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා එක්ව සිදු කර ඇත.

රු. මිලියන 41 ක් වූ අනෙක් අත්තිකාරම් මුදල පුද්ගලික පාර්ශ්ව වලින් ඉඩම් පවරා ගැනීම සඳහා මුදා හැර ඇත. කල්පිටිය ප්‍රාදේශීය ලේකම්වරයා ඉඩම් අමාත්‍යාංශය හා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගැනීමෙන් පසුව පුද්ගලික පාර්ශ්ව වලින් ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

සටහන: උක්ත අත්තිකාරම් දෙකේ වත්මන් තත්වය

**(අ) දෙද්දුව ව්‍යාපෘතිය**

| | |
|---|---|
| මූලික අත්තිකාරම | 30,000,000.00 |
| සමුච්චිත පොලිය | 39,124,674.54 |
| මුළු අත්තිකාරම | 69,124,674.54 |

ප්‍රාදේශීය ලේකම් අත්පත් කර ගැනීම් කර ගෙන ගොස් හිමිකාරත්වය ඔප්පු කළ කුලිකරුවන්ට වන්දි ගෙවා ඇති අතර ඉතිරි කොටසට අදාළ ඉතිරි ඉඩම් වලට ගෙවිය යුතුව ඇත. කටයුතු අවසන් වූ පසුව ශ්‍රීලංසංසංඅ වෙත ඉඩම පැවරෙන නියෝගයක් ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කෙරෙනු ඇත.

එතෙක් ඉඩමේ පැවරීමේ අයතිය අපට ලැබී ඇති අතර මුළු අත්තිකාරම අත්තිකාරම් ගිනුම තුල හදුනා ගෙන ඇත.

**(ආ) කල්පිටිය ව්‍යාපෘතිය**

2015 දෙසැම්බර් 31 දිනට බැංකු සනාථ කිරීමට අනුව, අත්තිකාරමේ අගය පහත ආකාරයට වැඩි වී ඇත.

| | |
|---|---|
| මූලික අත්තිකාරම | 41,000,000.00 |
| සමුච්චිත පොලිය | 17,908,227.96 |
| මුළු අත්තිකාරම | 58,908,227.96 |

මූලික අත්තිකාරමේ අගයට එකතු වූ පොලිය වන රු. 17,908,227.96 ක් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා භාවිතා කෙරෙනු ඇත.

### 1.11 ආයෝජන

මණ්ඩලය රු. මිලියන 4 ක් (රු/ 10/- කොටස් 400,000) ක් 1991 දී සීමා. ටාජ් එක්සෝටිකා හි ආයෝජනය කර ඇති අතර සමාගමේ කොටස් ලැයිස්තු කර නොමැත. කොටසක ශුද්ධ පොත් අගය සමාගමේ 2015 මූල්‍ය ප්‍රකාශන අනුව රු. 10.63 ක් විය.

මීට අමතරව, ලංකා සංචාරක මණ්ඩලය රු. 750, 000/- ක් මේ වන විට අක්‍රිය වී ඇති සීමා. ශ්‍රී ලංකා හොටෙල් ටුවරිස්ම් ට්‍රයිනිං (පුද්.) සමාගමේ ආයෝජනය කර ඇත. එකී පුහුණු ආයතනය ලැබී ඇති තොරතුරු වලට අනුව ඈවර කිරීමට නියමිතව ඇත.

### 1.12 අදාළ පාර්ශ්වීය ගනුදෙණු

ශ්‍රී ලංකා ගිණුම් පිරිවිතර 24 ට අනුව හෙළිකළ යුතු වන කිසිදු සම්බන්ධිත පාර්ශ්ව ගණුදෙනුවක් සිදු වී නොමැත.

### 1.13 නොනිමි කාර්යය

නොනිමි ව්‍යාපෘති තුල රු. 226, 565,525.03 (කරු. 6 සටහන බලන්න) ක් වන අවසන් නොවූ කාර්යය වල අගය ලෙස දක්වා ඇත.

### 1.14 ගිණුම් සැසඳීම

ගත වූ වසරේ මූල්‍ය ප්‍රකාශන සමඟ සාපේක්ෂිත මූල්‍ය තොරතුරු දක්වා ඇත.

### 1.15 ඉඩම් තක්සේරු කිරීම

මූල්‍ය වර්ෂය තුලදී, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් සියළුම ඉඩම් තක්සේරු කිරීමේ කාර්යය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ එක්ව දියත් කර ඇත. සමස්ත ඉඩම් පංති වත්කම් තක්සේරු කිරීම අවසන් වූ පසුව නව අගයන් ගිණුම් පොත්වල හදුනා ගැනෙනු ඇත.

### 1.16 කල්බදු දේපල

2014 මූල්‍ය වසර තුලදී, ලංකා බැංගුව මගින් ලබා දුන් මූල්‍ය කල්බදු පහසුකම් මගින් මෝටර් රථ පහක් අධිකාරිය ලබා ගෙන ඇත. ඒවායේ කල්බදු කාල සීමාව වසර හතරකි (මාස 48). කල්බදු දේපල වල මූලික පිරිවැය ඓතිහාසික පිරිවැය මත හදුනා ගෙන ඇත.

2015 දෙසැම්බර් 31 දිනට කල්බදු වාහන වල ශුද්ධ ධාරන අගය පහත දක්වා ඇත.

| වාහනය | වියදම | සමු. ක්ෂයවීම් | 31/12/2015 දිනට ශුද්ධ ධාරන අගය |
|---|---|---|---|
| මිට්ෂුබිසි ඩබල් කැබ්රථය | 6,962,441.43 | 2,901,017.26 | 4,061,424.17 |
| ටොයොටා හයිඒස් වෑන්රථ - 03 | 21,155,643.09 | 7,051,881.06 | 14,103,762.03 |
| ටොයොටා කොරොල්ලා කාර් රථය | 6,961,311.43 | 2,320,437.14 | 4,640,874.29 |

2015 දෙසැම්බර් 31 දිනට කල්බදු දේපල වලට අදාළ සමස්ත අවම කල්බදු ගෙවීම් පහත දක්වා ඇත.

| වාහනය | ඉදිරි අවම කල්බදු ගෙවීම |
|---|---|
| මිට්ෂුබිසි ඩබල් කැබ්රථය | 3,527,156.80 |
| ටොයොටා හයිඒස් වෑන්රථ - 03 | 11,828,433.00 |
| ටොයොටා කොරොල්ලා කාර් රථය | 3,865,497.00 |
| එකතුව | 19,221,086.80 |

**1.17 කල්පිටිය ව්‍යාපෘතිය**

සියළුම මාර්ග වලින් ව්‍යාපෘතියට ලැබුණු මුදල් හා ව්‍යාපෘති කටයුතු වල වියදම් හා ව්‍යාපෘති කාර්යාලයේ පරිපාලනය පහත දැක්වෙන ප්‍රකාශනයේ දක්වා ඇත. සියළු වියදම් නොනිමි ව්‍යාපෘති වැඩ ලෙස ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරි ලෙජරයේ ප්‍රගති ගිණුමේ වර්ගීකරණය කර ඇත. ලැබුණු අරමුදල් ව්‍යාපෘති සමකොටස් යටතේ වර්ග කර ඇති අතර රු.1,743,000/- ක් වූ විකුණන ලංසු ලේඛනයෙන් ලැබුනු ආදායම හා රු.1,500,000/- ක් වූ කොන්ත්‍රාත් මිලෙන් සියයට එකක් සමකොටස් ගිණුමේ සෘජුව හදුනා ගෙන ඇත. ඉතුරු වියදම් උපචිත පදනම මත හදුනා ගෙන ඇත.

**ලැබීම්**

| විස්තරය | මුදල /රු. |
|---|---:|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 45,680,602.80 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය | 47,500,000.00 |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 1,800,000.00 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 600,000.00 |
| සීමා. කියුබෙ ලංකා ලෙෂර් ප්‍රොපටීස් (පුද්.) සමාගම - ලංසු මිලෙන් 1% | 1,000,000.00 |
| සීමා. සන් රිසෝට් ඉන්වෙස්ට්මන්ට් (පුද්) සමාගම - ලංසු මිලෙන් 1% | 500,000.00 |
| ලංසු ගාස්තුව රු. 2,000/- | 18,000.00 |
| ලංසු මුදල රු. 25,000/- | 1,725,000.00 |
| එකතුව | 98,823,602.80 |

**වියදම්**

| ක්ෂයවීම් | මුදල /රු. |
|---|---:|
| ගෙවීම් වැඩසටහන/ ව්‍යාපෘති වියදම් | 66,306,641.53 |
| පරිපාලන වියදම් | 32,427,616.48 |
| ප්‍රාග්ධන වියදම | 1,807,049.33 |
| එකතුව | 100,541,307.34 |

**1.18 ණයගැති මුදල රු. 315,202,351.04**

| විස්තරය | ණයගැති මුදල (රු.) |
|---|---:|
| වෙළඳ ණයගැතියෝ | 34,898,458.47 |
| සුළු ණයගැතියෝ | 6,460,645.08 |
| අනු එකතුව | 41,359,103.55 |
| අඩු කළා: බොල් ණය ප්‍රතිපාදන | (3,566,261.50) |
| ශුද්ධ - වෙළඳ හා සුළු ණයගැතියන් | 37,792,842.05 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 13,559,157.04 |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 5,059,699.53 |
| කල්පිටිය ව්‍යාපෘතිය | 83,681.75 |
| ඔෘප ජංගම ගිණුම | 156,595,836.90 |
| මලාපවාහන පිරියත - ලැබීමට නියමිත | 65,124,651.20 |
| ජල සේවා - පාසිකුඩා | 11,166,093.25 |
| ණයගැති - හජකබ | 7,889,140.70 |
| ජංගම ගිණුම - ප්‍රධාන කාර්යාලය | 42,630.65 |

| | |
|---|---|
| ප්‍රතික්ෂේපිත චෙක්පත් | 709,198.75 |
| උත්සව අත්තිකාරම් | 75,000.00 |
| විශේෂ ණය | 1,771,979.99 |
| ආපදා ණය | 15,332,439.23 |
| එකතුව | 315,202,351.04 |

**1.19 ණයහිමි මුදල රු. 7,035,258.07**

පහත දැක්වෙන මුදල් ණයහිමි මුදලට ඇතුළත් කර ඇත.

| ක්ෂයවීම | ණයහිමි ගිණුම් රු. |
|---|---|
| සුළු ණයගැතියෝ | 190,566.18 |
| SLTPB | 47,905.74 |
| SLITHM | 6,512,810.19 |
| SLCB | 103,045.92 |
| පාරිතෝෂිත ගෙවීමට ඇති | 67,101.75 |
| TDF C/A (ගෙවීමට ඇති) | 7,636.85 |
| ගෙවීමට ඇති දෑ - කල්පිටිය ව්‍යාපෘතිය | 106,191.44 |
| එකතුව | 7,035,258.07 |

**1.20 ඉඩම් බදු කුලී ගෙවීමට ඇති රු. 61,398,750.00**

භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමේ ලැබුණු ඉඩම් කුලි ගෙවීම් දක්වා ඇත.

**1.21 රඳවාගත් ඉපයීම්**

ස්ථාවර වත්කමක් සාවද්‍ය ලෙස වර්ගීකරණය කිරීම නිසා 2014 වසරේ රු. 19,146.68 අධි ක්ෂයවීමක් ඇති වී ඇත. එබැවින්, මෙම මුදල පහත දැක්වෙන පරිදි ආරම්භක සමකොටස් ශේෂයට ගලපා ඇත.

| වසරාම්භක රඳවා ගත් ඉපයීම් | 924,185,248.72 |
|---|---|
| පෙර කාලීන දෝෂයක් නිවැරදි කිරීම | 19,146.68 |
| වසරාරම්භක ගැලපූ රදවාගත් ඉපයීම් | 924,204,395.38 |
| වසරේ ලාභය | 308,312,524.15 |
| වසරාවසානයේ රදවා ගත් ඉපයීම් | 1,232,516,919.55 |

**1.21 සටහන ඉදිරියටත්**

| 2014 වසරේ දැක්වූ අගය | ක්ෂයවීම (රු.) |
|---|---|
| රෙදි | 17,416.67 |
| පිරියත හා යන්ත්‍ර | 10,426.67 |
| අනු එකතුව | 27,843.34 |
| නිවැරදි කිරීම් | |
| ලී බඩු | 5,213.33 |
| විවිධ උපකරණ | 3,483.33 |
| අනු එකතුව | 8,696.66 |
| ශුද්ධ බලපෑම | |

2015 ගිනුම් ප්‍රතිප්‍රකාශ කර නොමැත.

10. දේපල, පිරියත හා උපකරණ
සටහන අංක. 02

| සටහන | ශීර්ෂය | විස්තරය | 01.01.2015 දිනට ශේෂය | එකතුවීම් 2015 | මාරු කිරීම් /ගැලපුම් | 31.12.2015 දිනට ශේෂය | 01.01.2015 දිනට ගිණුම් ක්‍රමක්ෂය | ක්ෂයවීම් 31.12.2015 | මාරු කිරීම් /ගැලපුම් | 31.12.2015 දිනට ගිණුම් ක්‍රමක්ෂය | 31.12.2015 දිනට ශුද්ධ පොත් අගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 02.01 | 101 | ඉඩම් | 1,581,748,537.48 | 66,014,138.02 | - | 1,647,762,675.50 | - | - | - | - | 1,647,762,675.50 |
| 2.02 | 102 | ගොඩනැගිලි | 449,903,499.06 | 3,705,462.33 | - | 453,608,961.39 | 107,919,363.03 | 21,267,125.75 | - | 129,186,488.78 | 324,422,472.61 |
| 2.03 | 102A | මාර්ග හා ඉදිකිරීම් | 38,165,186.37 | 857,617.57 | - | 39,022,803.94 | 19,674,065.59 | 2,808,714.94 | - | 22,482,780.53 | 16,540,023.41 |
| 2.04 | 102B | ජල සැපයුම හා ජලාපවාහන | 146,076,683.74 | 30,500.00 | 5,296,661.15 | 140,810,522.59 | 59,215,813.87 | 15,078,063.80 | - | 74,293,877.67 | 66,516,644.92 |
| 2.05 | 102C | විදුලි සවිකිරීම් | 21,850,786.78 | 45,000.00 | - | 21,895,786.78 | 7,941,305.13 | 408,910.96 | - | 8,350,216.09 | 13,545,570.69 |
| 2.06 | 102D | දුරකථන සවිකිරීම් | 16,968,046.32 | 55,255.00 | - | 17,023,301.32 | 4,884,630.42 | 1,773,700.79 | - | 6,658,331.21 | 10,364,970.11 |
| 2.07 | 103 | සවිකිරීම් හා මෙවලම් | 10,433,920.81 | 1,089,849.54 | 6,370.00 | 11,517,400.35 | 5,342,603.00 | 1,143,593.12 | 6,370.00 | 6,479,826.12 | 5,037,574.23 |
| 2.08 | 104 | ලී බඩු | 25,855,191.94 | 630,955.09 | 122,160.00 | 26,363,987.03 | 9,188,663.61 | 2,378,190.15 | 116,946.67 | 11,449,907.09 | 14,914,079.94 |
| 2.09 | 105 | විවිධ උපකරණ | 26,733,826.00 | 3,346,497.75 | 10,710.00 | 30,069,613.75 | 9,944,023.49 | 3,021,365.88 | 7,226.67 | 12,958,162.69 | 17,111,451.06 |
| 2.1 | 106 | පිරියත යන්ත්‍ර | 10,380,833.75 | - | 36,800.00 | 10,344,033.75 | 7,998,402.20 | 514,637.50 | 10,426.67 | 8,502,613.03 | 1,841,420.72 |
| 2.11 | 110 | වාහන | 59,503,267.63 | - | - | 59,503,267.63 | 30,343,810.31 | 8,189,378.65 | - | 38,533,188.96 | 20,970,078.67 |
| 2.12 | 111 | දත්ත සැකසුම් උපකරණ | 50,533,473.89 | 2,022,840.00 | - | 52,556,313.89 | 45,211,408.66 | 2,815,390.30 | - | 48,026,798.96 | 4,529,514.93 |
| 2.13 | 107 | වීදුරු භාණ්ඩ හා පිඟන් කෝප්ප | 1,372,459.11 | 15,766.97 | 24,359.00 | 1,363,867.08 | 953,155.70 | 9,828.33 | 24,359.00 | 938,625.03 | 425,242.05 |
| 2.14 | 108 | හැදිගෑරුප්පු හා රිදී භාණ්ඩ | 858,713.56 | 380,561.01 | 9,540.00 | 1,229,734.57 | 507,826.49 | 182,059.98 | 9,540.00 | 680,346.47 | 549,388.10 |
| 2.15 | 109 | රෙදි | 8,651,769.51 | 1,941,848.08 | 73,544.00 | 10,520,073.59 | 6,105,783.17 | 1,327,263.42 | 68,960.67 | 7,364,085.92 | 3,155,987.67 |
| | | අනු එකතුව | 2,449,036,195.95 | 80,136,291.36 | 5,580,144.15 | 2,523,592,343.16 | 315,230,854.66 | 60,918,223.57 | 243,829.68 | 375,905,248.55 | 2,147,687,094.61 |
| 2.16 | 211L | සංවර්ධන පිරිවැය | 175,802,353.34 | 547,780.00 | 127,367.85 | 176,222,765.49 | 131,425,177.18 | 9,708,102.63 | - | 141,133,279.81 | 35,089,485.68 |
| | | එකතුව | 2,624,838,549.29 | 80,684,071.36 | 5,707,512.00 | 2,699,815,108.65 | 446,656,031.84 | 70,626,326.20 | 243,829.68 | 517,038,528.36 | 2,182,776,580.29 |

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
මූල්‍ය ප්‍රකාශන සටහන්
2015 දෙසැම්බර් 31 අවසන් වනකාලසීමාව සඳහා

| 03 අතැති මුදල් හා බැංකුගත මුදල් | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| අතැති මුදල් - සුළු මුදල් | 83,837.91 | 19,952.80 |
| බැංකුගත මුදල් - ප්‍රධාන කාර්යාලය හා නිකේතන | 530,762.10 | 18,422,340.83 |
| බැංකුගත මුදල් - අරමුදල් කළමනාකරණ ගිණුම෴ | 1,016,645,425.77 | 771,507,198.66 |
| අතැති මුදල් - සුළු මුදල් (කල්පිටිය ව්‍යාපෘතිය) | 15,000.00 | 15,000.00 |
| බැංකුගත මුදල් - (කල්පිටිය ව්‍යාපෘතිය) | 16,695.29 | 16,945.29 |
| අතැති මුදල් හා බැංකු ශේෂ වල එකතුව | 1,017,291,721.07 | 789,981,437.58 |
| ෴ බැංකු ගිණුමේ ඇති අරමුදල් දෛනික පදනම මත ලංකා බැංකුවේ අරමුදල් කළමනාකරණ ගිණුමක ආයෝජනය කර ඇත. උපයා ගත් පොලී මුදල සඳහා කරුණාකර අංක 13 සටහන බලන්න. | | |

| 04 වෙළඳ සහ වෙනත් ලැබීමට නියමිත දෑ | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| ලැබීමට ඇති වෙළඳ | 34,898,458.47 | 30,592,714.81 |
| ලැබමට ඇති - වෙනත් | 268,449,174.85 | 188,996,092.89 |
| ණය හා අත්තිකාරම් - සේවක | 15,420,979.22 | 17,163,691.22 |
| අනු එකතුව | 318,768,612.54 | 236,752,498.92 |
| අඩු කළා: බොල් ණය හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන | (3,566,261.50) | (2,406,273.15) |
| එකතුව | 315,202,351.04 | 234,346,225.77 |
| අඩමාන ණය සඳහා ප්‍රතිපාදන | | |
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| ආරම්භක ශේෂය | 2,406,273.15 | 2,094,707.64 |
| වසරේ (අධි)/ ඌණ ප්‍රතිපාදන | 1,159,988.35 | 311,565.51 |
| අවසාන ශේෂය | 3,566,261.50 | 2,406,273.15 |

| 05 අත්තිකාරම් | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| අත්තිකාරම් - වියදම් | 40,152,376.11 | 23,949,544.50 |
| අත්තිකාරම් - ඉඩම් පවරා ගැනීම (දෙද්දූව) | 69,124,674.54 | 69,124,674.54 |
| අත්තිකාරම් - ඉඩම් පවරා ගැනීම (කල්පිටිය) | 56,691,260.67 | 54,415,473.46 |
| එකතුව | 165,968,311.32 | 147,489,692.50 |
| | | |

| 06 නොනිම් වැඩ | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| ත්‍යසෘ - බණ්ඩාරවෙල (උපදේශන ගාස්තු) | 62,955.00 | 62,955.00 |
| යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය - පාසිකුඩා | 45,661,667.25 | 45,661,667.25 |
| පස් පිරවීම - පාසිකුඩා | 27,741,703.57 | 24,572,140.33 |
| අනුරාධපුරය | 200,000.00 | 200,000.00 |
| සුලන්කා බෙන්තොට | 250,000.00 | 250,000.00 |
| සංචාරක පොලිස් තොරතුරු මධ්‍යස්ථානය | 2,553,668.28 | 2,553,668.28 |

| | | |
|---|---|---|
| ඊැබඑදව් -ඕිහසබට්චය්කඑ කදබජරුඑැ | 2,376,805.02 | 2,376,805.02 |
| ජෙනරේටර් කාමරයක් ඉදිකිරීම - කතරගම | 304,762.00 | 304,762.00 |
| කැලිඩෝ වෙරළ සංවර්ධන ව්‍යාපෘතිය | 1,247,205.90 | 1,247,205.90 |
| Laying Water Line at NHR Passikudah | 47,432,500.00 | - |
| කල්පිටිය සංවර්ධන ව්‍යපෘතිය | 98,734,258.00 | 98,602,791.51 |
| එකතුව | 226,565,525.02 | 175,831,995.29 |

| 07 දිගුකාලීන ආයෝජන | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| ආයෝජන ක්ෂයවීම් - සංචාරක කාර්යාංශය | 976,508.99 | 976,508.99 |
| ආයෝජන ක්ෂයවීම් - සංචාරක මණ්ඩලය | 52,154,737.54 | 52,154,737.54 |
| ක්ෂයවන අරමුදල් ආයෝජනය | 759,021.45 | 759,021.45 |
| සීමා. ශ්‍රී ලංකා හොටෙල් ටුවරිස්ම් (පුද්.) සමාගම | 750,000.00 | 750,000.00 |
| සීමා. එක්ඕටිකා රිසෝට්ස් - රු. 10/- සාමාන්‍ය කොටස් (එකක්) | 4,000,000.00 | 4,000,000.00 |
| පාරිතෝෂිත ආයෝජන | 19,768,441.32 | 18,841,854.87 |
| එකතුව | 78,408,709.30 | 77,482,122.85 |

| 08 විශ්‍රාම පාරිතෝෂිත ප්‍රතිපාදන | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| ගෙවීමට ඇති පාරිතෝෂිත - ඉදිරියට ගත් | 42,827,463.25 | 36,440,908.46 |
| අඩු කළා: 2015 වසරේ පාරිතෝෂිත ගෙවීම් | 1,740,855.00 | 1,367,790.00 |
| අනු එකතුව | 41,086,608.25 | 35,073,118.46 |
| එකතු කළා : පාරිතෝෂිත ප්‍රතිපාදන - 2015 | 11,201,709.82 | 7,754,344.79 |
| 31/12/2015 දිනට ගෙවිය යුතු පාරිතෝෂිත එකතුව | 52,288,318.07 | 42,827,463.25 |

| 09 ගොඩබෑමේ බද්ද | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| වසරේ ගොඩබෑමේ බදු | 275,595,753.85 | 249,167,260.56 |
| එකතුව | 275,595,753.85 | ඃසෘඍත්! |

| 10 සංචාරක සංවර්ධන බද්ද | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| වසරේ සංචාරක සංවර්ධන බද්ද | 150,403,573.24 | 147,343,871.55 |
| අඩු කළා : අධි ප්‍රතිපාදන (ඇස්තමේන්තු වෙනස) | (7,578,836.49) | - |
| එකතුව | 142,824,736.75 | 147,343,871.55 |

| 11 ගාස්තු හා බලපත්‍ර | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| ඉඩම් කුලී බදු ආදායම - ප්‍රධාන කාර්යාලය | 36,919,858.89 | 35,467,372.10 |
| බලපත්‍ර ගාස්තුව/පරිපාලන ගාස්තුව /වීසා ගාස්තු | 61,847,962.78 | 59,720,841.78 |
| ජාතික සංචාරක ආයෝජන ඒකකය | 7,862,756.74 | 9,204,027.78 |
| TDF පරිපාලන ගාස්තුව | 5,128,022.76 | 5,088,062.03 |
| එකතුව | 111,758,601.17 | 109,480,303.69 |

| 12 අතිරික්තය / (හිගය) - දේශීය සංචාරක නිකේතන කටයුතු | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| කතරගම | (3,067,262.17) | (578,466.59) |
| නුවරඑළිය | (5,997,379.28) | (4,286,092.63) |
| බණ්ඩාරවෙල | (870,483.30) | 58,913.79 |
| අනුරාධපුරය | (6,485,628.49) | (4,180,237.05) |
| බෙන්තොට | 16,927,929.06 | 28,542,091.79 |
| පොළොන්නරුව /ගිරිතලේ | 3,021,835.66 | 2,612,710.69 |
| කල්ගුඩා | (15,921,527.65) | (20,639,719.24) |
| අතිරික්තය / (හිගය) - ජාතික නිවාඩු නිකේතන මෙහෙයුම් | (12,392,516.17) | 1,529,200.76 |

| 13 වෙනත් ආදායම් | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| පොලී ආදායම - සේවක ණය | 536,598.44 | 508,992.09 |
| බැංකු පොලි | 963,476.14 | 919,053.05 |
| බැංකු පොලිය - අරමුදල් කළමනාකරණ ගිණුම ෆ | 13,455,975.21 | 23,212,606.37 |
| වත්කම් විකුණුම් | 338,332.00 | 1,109,967.70 |
| වෙනත් ආදායම් | 2,800,941.88 | 673,993.92 |
| උපචිත වියදම - ආපසු ලිහා හැරී | 8,754,114.92 | 11,902,715.89 |
| එකතුව | 26,849,438.59 | 38,327,329.02 |

| 14 පඩි, වැටුප් හා සේවක සුහසාධන | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| වැටුප් හා දීමනා | 58,814,502.13 | 46,552,329.26 |
| නිවාඩප පඩි හා වෙනත් දීමනා | 535,926.78 | 101,866.35 |
| අතිකාල | 2,964,193.28 | 2,809,040.23 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේඅඅ | 4,115,286.40 | 3,942,893.54 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේභාඅ | 823,057.29 | 788,579.13 |
| සේවක සුහසාධන | 15,170,759.25 | 14,329,259.94 |
| කාර්ය මණ්ඩල නිල ඇඳුම් | 290,393.66 | 265,798.21 |
| ගමන් විදයම් - දේශිය | 631,191.00 | 656,326.46 |
| පාරිතෝෂිත | 11,469,688.82 | 7,903,184.29 |
| පැමිණීමේ දිරිදීමනා | 1,573,134.93 | 1,610,646.16 |
| එකතුව | 96,388,133.54 | 78,959,923.57 |

| 15 සැපයුම් හා භාවිත පාරිභෝජ්‍ය භාණ්ඩ | | |
|---|---|---|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| සංග්‍රහ - දේශීය | 1,325,074.45 | 1,351,877.96 |
| විවිධ සැපයුම් | 1,288,454.42 | 1,553,730.71 |
| ආරක්ෂක වියදම් | 5,560,079.46 | 4,252,121.73 |
| පිරිසිදු කිරීමේ වියදම් | 3,018,464.51 | 3,423,823.88 |
| ලිපිද්‍රව්‍ය | 3,421,091.93 | 4,827,038.02 |
| දුරකථන | 6,339,932.23 | 7,777,712.43 |

| | | |
|---|---:|---:|
| තැපැල් ගාස්තු හා මුද්දර බදු | 2,522,824.23 | 2,848,321.76 |
| විදුලි බිල් | 8,930,247.27 | 11,437,437.98 |
| වරිපනම් හා බලපත්‍ර | 873,051.33 | 906,935.04 |
| රක්ෂණ - ස්ථාවර වත්කම් | 1,355,141.44 | 1,291,280.83 |
| නඩත්තුව - ගොඩනැගිලි | 1,117,541.85 | 1,944,465.38 |
| නඩත්තුව - උපකරණ | 3,971,707.70 | 2,533,812.17 |
| පොදු ප්‍රචාරනය ක | 1,504,396.64 | 796,510.89 |
| නෛතික වියදම් | 1,094,650.00 | 2,035,216.00 |
| වාහන කුලී | 1,972,428.20 | 5,764,112.00 |
| වාහන නඩත්තුව හා අලුත්වැඩියා | 8,107,426.50 | 10,621,804.40 |
| ජලය | 864,940.35 | 693,467.40 |
| බොල් හා අඩමාන ණය ප්‍රතිපාදන | 1,159,988.35 | 311,565.51 |
| එකතුව | 54,427,440.86 | 64,371,234.09 |

| **16 අලෙවි සම්බන්ධිත වියදම්** | | |
|---|---:|---:|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| සංඛ්‍යමය සමීක්ෂණ | 1,177,099.99 | 1,189,973.72 |
| හෝටල් වර්ගීකරණය | 8,681,779.72 | 4,047,961.50 |
| විදෙස් සංචාර | 2,436,145.31 | 887,538.89 |
| මුද්‍රණය කිරීම් හා ප්‍රකාශන | 1,544,192.98 | 991,358.28 |
| සමුළු හා විශේෂ උත්සව අවස්ථා | 4,776,165.57 | 3,365,613.82 |
| උප ජාත්‍යන්තර සංවිධානය | 9,610,058.17 | 10,169,345.99 |
| ප්‍රජා සබඳතා | 1,303,575.19 | 6,390,880.88 |
| ජාතික සංචාරක ආයෝජන ඒකකය | 1,273,924.77 | 2,362,703.92 |
| සේවක පුහුණුව / උපදේශන සේවා | 763,856.32 | 870,821.98 |
| පොත් හා වාරසඟරා | 643,072.50 | 202,100.00 |
| ෂක්ඕ නඩත්තුව | 9,201,882.85 | 7,437,069.69 |
| | 795,420.41 | 846,957.97 |
| යාල වන නිකේතන ව්‍යාපෘති වියදම | 329,547.84 | - |
| කුච්චවේලි ව්‍යාපෘති වියදම | 28,067.00 | - |
| එකතුව | 42,564,788.62 | 38,762,326.64 |

| **17 වෙනත් වියදම්** | | |
|---|---:|---:|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 329,500.00 | 202,500.00 |
| විගණක ගාස්තු | 699,890.46 | 277,000.00 |
| ආර්ථික සේවා ගාස්තු | 289,446.38 | 114,164.27 |
| විනිමය වාසි | 1,275.00 | - |
| එකතුව | 1,320,111.84 | ඃසෘඇත්! |

| **18 මූල්‍ය පිරිවැය** | | |
|---|---:|---:|
| අයිතමය | 2015 (රු.) | 2014 (රු.) |
| FALSE | 3,271,215.57 | 2,779,819.48 |

| | | |
|---|---|---|
| බැංකු ගාස්තු | 92,274.13 | 75,135.00 |
| එකතුව | 3,363,489.70 | 2,854,954.48 |

**මුදල් ගලන ප්‍රකාශනයේ සටහන්**

| 19 මුදල් හා මුදල් වලට සමාන දෑ හි සංයුතිය - කාලසීමාව අවසානයේදී | |
|---|---|
| අතැති හා බැංකුගත මුදල් - (ශ්‍රී.ලං.සං.සං.අ.) | 1,017,260,025.78 |
| අතැති හා බැංකුගත මුදල් - කල්පිටිය ව්‍යාපෘතිය | 31,695.29 |
| | 1,017,291,721.07 |

| 20 ආරම්භක මුදල් ශේෂය | |
|---|---|
| මුදල් ශේෂය - 2015.01.01 දිනට ශ්‍රී.ලං.සං.සං.අ. | 789,949,492.29 |
| මුදල් ශේෂය - 2015.01.01 දිනට කල්පිටිය ව්‍යාපෘතිය | 31,945.29 |
| 2015.01.01 දිනට මුදල් ශේෂය | 789,981,437.58 |

නිකේතන මෙහෙයුම් සාරාංශය
2015 දෙසැම්බර් 31 අවසන් වන කාල සීමාව සඳහා

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| දේශීය සංචාරක ව්‍යාපාර - නිකේතන | | |
| කතරගම | (3,067,262.17) | (578,466.59) |
| නුවරඑළිය | (5,997,379.28) | (4,286,092.63) |
| බණ්ඩාරවෙල | (870,483.30) | 58,913.79 |
| අනුරාධපුරය | (6,485,628.49) | (4,180,237.05) |
| අනු එකතුව | **(16,420,753.24)** | **(8,985,882.48)** |
| ජාතික නිවාඩු නිකේතන | | |
| බෙන්තොට | 16,927,929.06 | 28,542,091.79 |
| පොළොන්නරුව / ගිරිතලේ | 3,021,835.66 | 2,612,710.69 |
| කල්කුඩා | (15,921,527.65) | (20,639,719.24) |
| අනු එකතුව | 4,028,237.07 | 10,515,083.24 |
| අතිරික්තය /(හිගය) | **(12,392,516.17)** | **1,529,200.76** |

**තානායම - කතරගම**

**ආදායම් ප්‍රකාශනය**

**2015 දෙසැම්බර් 31 අවසන් වන කාලසීමාව සඳහා**

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| භෝජනාගාර අලෙවිය | 8,286,472.15 | 8,215,240.20 |
| අඩු කළා: අලෙවි පිරිවැය | 5,436,363.08 | 4,525,168.94 |
| **දළ ආදායම** | **2,850,109.07** | **3,690,071.26** |
| කාමර අලෙවිය | 13,016,184.33 | 12,463,572.50 |
| වෙනත් ආදායම් | 8,324.00 | 840.00 |
| **දළ ලාභය** | **15,874,617.40** | **16,154,483.76** |
| අඩුකළා: පරි. ආය. වියදම් | 15,145,027.75 | 12,924,115.95 |
| ක්ෂයවීම් | 3,796,851.82 | 3,808,834.40 |
| **අතිරික්තය/(හිගය)** | **(3,067,262.17)** | **(578,466.59)** |
| පරිපාලන හා ආයතනික වියදම | | |
| වැටුප් හා දීමනා | 6,748,309.02 | 4,915,201.95 |
| අතිකාල ගෙවීම් | 432,616.65 | 401,571.78 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේඅඅ | 431,380.63 | 443,891.09 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේභාඅ | 86,276.12 | 88,777.82 |
| සේවක සුබසාධන /සංග්‍රහ දේශීය | 366,853.00 | 339,000.00 |
| සේවක ආහාර | 213,500.25 | 423,234.80 |
| ගමන් වියදම් - දේශීය | 3,060.00 | - |
| සේවක නිල ඇඳුම් | 103,317.56 | 129,296.50 |
| පිරිසිදු කිරීම් සැපයුම් | 185,786.00 | 221,218.00 |
| විවිධ සැපයුම් | 171,860.16 | 160,121.00 |
| ආරක්ෂක වියදම් | 1,002,309.82 | 940,111.02 |
| පිරිසිදු කිරීමේ ගාස්තු | 1,446,105.84 | 787,311.19 |
| දුරකථන | 137,093.71 | 134,493.21 |
| ලිපිද්‍රව්‍ය | 94,632.20 | 86,353.72 |
| තැපැල් ගාස්තු හා මුද්දර | 57,355.00 | 61,090.00 |
| විදුලිය | 1,396,620.36 | 1,691,618.86 |
| වරිපනම් හා බලපත්‍ර | 35,657.43 | 37,339.75 |
| රක්ෂන ස්ථාවර වත්කම් | 3,501.21 | 2,119.86 |
| රෙදි සේදීම් | 485,350.49 | 380,244.28 |
| නඩත්තුව - ගොඩනැගිලි | 213,954.50 | 188,162.80 |
| නඩත්තුව - උපකරණ | 112,787.10 | 98,560.80 |
| ප්‍රවාහනය හා භාණ්ඩ පැටවීම | 300.00 | 1,550.00 |
| බැංකු ගාස්තු | 6,500.00 | 4,750.00 |
| වාහන නඩත්තුව හා අලුත්වැඩියා | 57,580.95 | 100,013.35 |
| පොත් හා වාරසගරා | 9,772.00 | 11,119.00 |
| පැමිණීමේ දිරිගැන්වීම් | 224,740.00 | 249,775.00 |
| ආර්ථික සේවා ගාස්තුව | 42,482.59 | 11,444.63 |
| ජලය | 1,075,325.16 | 1,015,745.54 |
| **එකතුව** | **15,145,027.75** | **12,924,115.95** |

**ජාතික නිවාඩු නිකේතනය - නුවරඑළිය**

**ආදායම් ප්‍රකාශනය**

**2015 දෙසැම්බර් 31 අවසන් වන කාලසීමාව සඳහා**

| | 2015 රු | 2014 රු |
|---|---|---|
| භෝජනාගාර අලෙවිය | 5,608,922.35 | 4,376,888.30 |
| අඩු කළා: අලෙවි පිරිවැය | 3,589,343.12 | 2,666,428.26 |
| **දළ ආදායම** | **2,019,579.23** | **1,710,460.04** |
| කාමර අලෙවිය | 7,184,487.39 | 7,171,796.55 |
| වෙනත් ආදායම් | 168,124.40 | 113,989.60 |
| **අනු එකතුව** | **7,352,611.79** | **7,285,786.15** |
| **දළ ලාභය** | **9,372,191.02** | **8,996,246.19** |
| අඩු කළා: පරි. හා ආය. වියදම් | 14,379,455.20 | 11,480,007.31 |
| ක්ෂයවීම් | 990,115.10 | 1,802,331.51 |
| **අතිරික්තය/(හිඟය)** | **(5,997,379.28)** | **(4,286,092.63)** |
| පරිපාලන හා ආයතනික වියදම් | | |
| වැටුප් හා දීමනා | 6,782,192.81 | 4,554,547.12 |
| අතිකාල ගෙවීම් | 452,289.95 | 355,974.78 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේඅඅ | 458,188.85 | 415,024.86 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේභාඅ | 91,637.77 | 83,004.97 |
| සේවක සුබසාධන | 376,500.00 | 312,084.50 |
| සේවක ආහාර | 271,836.80 | 336,922.95 |
| සේවක නිල ඇඳුම් | 90,813.33 | 254,767.50 |
| පිරිසිදු කිරීම් සැපයුම් | 250,480.00 | 193,322.00 |
| විවිධ සැපයුම් | 244,466.00 | 281,812.00 |
| ආරක්ෂක වියදම් | 801,461.68 | 714,937.42 |
| පිරිසිදු කිරීමේ ගාස්තු | 1,398,961.56 | 729,752.17 |
| දුරකථන | 25,189.14 | 63,268.19 |
| ලිපිද්‍රව්‍ය | 182,701.44 | 141,002.16 |
| තැපැල් ගාස්තු හා මුද්දර | 54,260.00 | 56,170.00 |
| විදුලිය | 1,658,297.56 | 1,788,063.52 |
| වරිපනම් හා බලපත්‍ර | 163,283.13 | 120,291.20 |
| රක්ෂන ස්ථාවර වත්කම් | 10,904.89 | 6,602.52 |
| රෙදි සේදීම් | 196,634.00 | 216,334.00 |
| නඩත්තුව - ගොඩනැගිලි | 114,959.83 | 143,226.00 |
| නඩත්තුව - උපකරණ | 192,765.00 | 166,975.70 |
| ප්‍රවාහන හා භාණ්ඩ රැගෙනවීම | 81,746.00 | 12,850.00 |
| බැංකු ගාස්තු | 4,250.00 | 3,200.00 |
| නඩත්තුව හා අළුත්වැඩියා - වාහන | 2,530.00 | 50,815.80 |
| පොත් හා වාර සඟරා | 9,310.00 | 9,340.00 |
| පැමිණීමේ දිරිදීමනා | 217,545.00 | 208,758.00 |
| ජලය | 227,929.40 | 253,209.20 |
| ආර්ථික සේවා ගාස්තුව | 18,321.06 | 7,750.75 |
| **එකතුව** | **14,379,455.20** | **11,480,007.31** |

**ජාතික නිවාඩු නිකේතනය - බණ්ඩාරවෙල**

**ආදායම් ප්‍රකාශනය**

**2015 දෙසැම්බර් 31 අවසන් වන කාලසීමාව සඳහා**

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| භෝජනාගාර විකුණුම් | 9,605,699.50 | 7,412,403.05 |
| අඩු කළා : අලෙවි පිරිවැය | 5,043,406.18 | 3,806,050.45 |
| **දළ ආදායම** | **4,562,293.32** | **3,606,352.60** |
| කාමර අලෙවිය | 7,847,300.05 | 7,672,187.00 |
| වෙනත් ආදායම් | 410,650.00 | 261,505.50 |
| **අනු එකතුව** | **8,257,950.05** | **7,933,692.50** |
| **දළ ලාභය** | **12,820,243.37** | **11,540,045.10** |
| අඩු කළා: පරි. හා ආය. වියදම් | 12,406,770.62 | 9,781,472.65 |
| ක්ෂයවීම් | 1,283,956.05 | 1,699,658.66 |
| **අතිරික්තය/(හිඟය)** | **(870,483.30)** | **58,913.79** |
| පරිපාලනය හා ආයතනික වියදම් | | |
| වැටුප් හා දීමනා | 5,644,927.10 | 3,985,957.84 |
| අතිකාල ගෙවීම් | 358,808.50 | 297,088.70 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේඅඅ | 336,718.82 | 320,695.79 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේභාඅ | 67,343.76 | 64,139.15 |
| සේවක සුබසාධන /සංග්‍රහ දේශීය | 272,958.00 | 299,000.00 |
| සේවක ආහාර | 3,586.00 | 5,635.00 |
| ගමන් වියදම් - දේශීය | 263,667.31 | 489,834.23 |
| සේවක නිල ඇඳුම් | 68,576.96 | 122,883.00 |
| පිරිසිදු කිරීම් සැපයුම් | 161,177.00 | 197,536.40 |
| විවිධ සැපයුම් | 171,063.00 | 61,146.00 |
| ආරක්ෂක වියදම් | 1,005,309.82 | 928,883.79 |
| පිරිසිදු කිරීමේ ගාස්තු | 1,470,943.12 | 589,344.69 |
| දුරකථන | 48,012.00 | 75,839.27 |
| ලිපිද්‍රව්‍ය | 108,313.50 | 74,234.40 |
| තැපැල් ගාස්තු හා මුද්දර | 48,010.00 | 52,685.00 |
| විදුලිය | 1,400,923.67 | 1,309,102.10 |
| වරිපනම් හා බලපත්‍ර | 17,785.87 | 41,428.80 |
| රක්ෂණ ස්ථාවර වත්කම් | 5,423.04 | 3,283.46 |
| රෙදි සේදීම් | 245,309.00 | 241,796.00 |
| නඩත්තුව - ගොඩනැගිලි | 306,027.50 | 180,219.00 |
| නඩත්තුව - උපකරණ | 66,790.00 | 72,120.00 |
| ප්‍රවාහනය හා භාණ්ඩ පැටවීම | 4,710.00 | - |
| බැංකු ගාස්තු | 14,250.00 | 6,015.00 |
| වාහන නඩත්තුව හා අලුත්වැඩියා | 96,235.00 | 114,714.00 |
| පොත් හා වාරසඟරා | 8,980.00 | 10,920.00 |
| පැමිණීමේ දිරිගැන්වීම් | 165,380.00 | 173,095.00 |
| ජලය | 22,331.64 | 54,887.76 |
| ආර්ථික සේවා ගාස්තුව | 23,210.01 | 8,988.27 |
| **එකතුව** | **12,406,770.62** | **9,781,472.65** |

**තානායම - අනුරාධපුරය**

**ආදායම් ප්‍රකාශනය**

**2015 දෙසැම්බර් 31 අවසන් වන කාලසීමාව සඳහා**

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| භෝජනාගාර විකුණුම් | 1,922,546.78 | 4,949,126.05 |
| අඩු කළා : අලෙවි පිරිවැය | 1,283,203.42 | 3,135,697.93 |
| **දල ආදායම** | **639,343.36** | **1,813,428.12** |
| කාමර අලෙවිය | 2,583,065.68 | 6,160,773.39 |
| වෙනත් ආදායම් | - | 6,688.00 |
| **අනු එකතුව** | **2,583,065.68** | **6,167,461.39** |
| **දල ලාභය** | **3,222,409.04** | **7,980,889.51** |
| අඩු කළා: පරි. හා ආය. වියදම් | 8,425,904.80 | 11,014,930.41 |
| ක්ෂයවීම් | 1,282,132.73 | 1,146,196.15 |
| **අතිරික්තය /(හිඟය)** | **(6,485,628.49)** | **(4,180,237.05)** |
| පරිපාලන හා ආයතනික වියදම | | |
| වැටුප් හා දීමනා | 3,650,597.15 | 4,319,607.64 |
| අතිකාල ගෙවීම් | 37,175.15 | 179,886.38 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේඅඅ | 246,247.48 | 383,654.67 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේභාඅ | 49,249.50 | 76,730.93 |
| සේවක සුබසාධන /සංග්‍රහ දේශීය | 258,060.03 | 678,119.29 |
| සේවක ආහාර | 21,450.00 | - |
| ගමන් වියදම් - දේශීය | 3,700.00 | - |
| සේවක නිල ඇඳුම් | 64,155.60 | 137,092.50 |
| පිරිසිදු කිරීම් සැපයුම් | 43,481.00 | 242,389.00 |
| විවිධ සැපයුම් | 97,180.55 | 225,679.73 |
| ආරක්ෂක වියදම් | 1,064,807.30 | 901,465.93 |
| පිරිසිදු කිරීමේ ගාස්තු | 1,484,741.93 | 754,153.07 |
| දුරකථන | 56,194.70 | 92,204.49 |
| ලිපිද්‍රව්‍ය | 94,929.64 | 181,658.53 |
| තැපැල් ගාස්තු හා මුද්දර | 38,075.00 | 86,620.00 |
| විදුලිය | 575,843.00 | 1,489,762.60 |
| වරිපනම් හා බලපත්‍ර | 95,184.75 | 143,081.37 |
| රක්ෂණ ස්ථාවර වත්කම් | 4,191.39 | 7,420.80 |
| රෙදි සේදීම් | 69,562.00 | 245,148.00 |
| නඩත්තුව - ගොඩනැගිලි | 44,403.00 | 184,983.50 |
| නඩත්තුව - උපකරණ | 23,224.00 | 56,429.11 |
| ප්‍රවාහනය හා භාණ්ඩ පැටවීම | 29,933.00 | 14,360.00 |
| බැංකු ගාස්තු | 9,375.00 | 7,826.25 |
| වාහන නඩත්තුව හා අලුත්වැඩියා | 41,049.49 | 104,729.00 |
| පොත් හා වාරසඟරා | 13,880.00 | 14,010.00 |
| පැමිණීමේ දිරිගැන්වීම් | 94,455.00 | 228,403.00 |
| ජලය | 203,108.57 | 251,826.65 |
| ආර්ථික සේවා ගාස්තුව | 11,650.57 | 7,687.97 |
| **එකතුව** | **8,425,904.80** | **11,014,930.41** |

**ජාතික නිවාඩු නිකේතනය - බෙන්තොට**

**ආදායම් ප්‍රකාශනය**

**2015 දෙසැම්බර් 31 අවසන් වන කාලසීමාව සඳහා**

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| කාමර අලෙවිය | 7,500.00 | 313,000.00 |
| කුලී ආදායම (ඉඩම්/ ගොඩනැගිලි බදුදීම්) | 29,934,687.62 | 31,137,613.48 |
| වෙනත් ආදායම් | 4,194,183.82 | 13,484,578.15 |
| **අනු එකතුව** | **34,136,371.44** | **44,935,191.63** |
| අඩු කළා: පරි. හා ආය. වියදම් | 12,754,438.38 | 10,795,668.78 |
| ක්ෂයවීම් | 4,454,004.00 | 5,597,431.06 |
| **අතිරික්තය/(හිඟය)** | **16,927,929.06** | **28,542,091.79** |
| පරිපාලන හා ආයතනික වියදම | | |
| වැටුප් හා දීමනා | 6,213,446.60 | 4,247,741.06 |
| අතිකාල ගෙවීම් | 133,659.80 | 194,222.05 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේඅඅ | 421,929.83 | 386,951.13 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේභාඅ | 84,385.97 | 77,390.23 |
| සේවක සුබසාධන /සංග්‍රහ දේශීය | 451,525.00 | 411,825.00 |
| සේවක ආහාර | 200.00 | 3,530.00 |
| ගමන් වියදම් - දේශීය | 3,042.88 | 6,716.00 |
| සේවක නිල ඇඳුම් | 84,385.59 | 83,620.50 |
| පිරිසිදු කිරීම් සැපයුම් | 69,396.00 | 221,899.34 |
| විවිධ සැපයුම් | 1,464,015.49 | 2,091,600.13 |
| ආරක්ෂක වියදම් | 31,879.00 | 47,974.15 |
| පිරිසිදු කිරීමේ ගාස්තු | 99,433.78 | 129,388.24 |
| දුරකථන | 47,393.00 | 58,950.00 |
| ලිපිද්‍රව්‍ය | 2,589,167.44 | 1,897,614.25 |
| තැපැල් ගාස්තු හා මුද්දර | 106,205.98 | 155,519.20 |
| විදුලිය | 3,177.07 | - |
| රක්ෂන ස්ථාවර වත්කම් | 120,000.00 | 135,000.00 |
| රෙදි සේදීම් | 392,473.50 | 298,042.41 |
| නඩත්තුව - ගොඩනැගිලි | 98,980.00 | 106,097.60 |
| නඩත්තුව - උපකරණ | 7,586.00 | 14,850.00 |
| ප්‍රවාහනය හා භාණ්ඩ පැටවීම | 3,750.00 | 3,945.00 |
| බැංකු ගාස්තු | 5,080.00 | 6,839.00 |
| වාහන නඩත්තුව හා අලුත්වැඩියා | 20,020.00 | 18,141 |
| පොත් හා වාරසගරා | 218,539.00 | 173,980.00 |
| පැමිණීමේ දිරිගැන්වීම් | - | 5,000.00 |
| ජලය | 84,766.45 | 18,832.49 |
| ආර්ථික සේවා ගාස්තුව | | |
| **එකතුව** | **12,754,438.38** | **10,795,668.78** |

**ජාතික නිවාඩු නිකේතනය - පොළොන්නරුව**
**ආදායම් ප්‍රකාශනය**
**2015 දෙසැම්බර් 31 අවසන් වන කාලසීමාව සඳහා**

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| කුලී ආදායම | 2,991,089.68 | 2,578,498.32 |
| වෙනත් ආදායම (ජලය හා අපද්‍රව්‍ය) | 36,000.00 | 36,000.00 |
| **දළ ලාභය** | **3,027,089.68** | **2,614,498.32** |
| ආර්ථික සේවා ගාස්තුව | 5,254.02 | 1,787.63 |
| ක්ෂයවීම් | - | - |
| **අතිරික්තය/(හිඟය)** | **3,021,835.66** | **2,612,710.69** |

**ජාතික නිවාඩු නිකේතනය - කල්කුඩා**
**ආදායම් ප්‍රකාශනය**
**2015 දෙසැම්බර් 31 අවසන් වන කාලසීමාව සඳහා**

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| කුලී ආදායම | 5,979,794.01 | 4,421,972.00 |
| වෙනත් ආදායම් | 707,663.13 | 78,926.70 |
| **අනු එකතුව** | **6,687,457.14** | **4,500,898.70** |
| අඩු කළා: පරි. හා ආය. වියදම් | 2,180,460.26 | 2,962,681.16 |
| ක්ෂයවීම් | 20,428,524.53 | 22,177,936.78 |
| **අතිරික්තය /(හිඟය)** | **(15,921,527.65)** | **(20,639,719.24)** |
| පරිපාලන හා ආයතනික වියදම් | | |
| වැටුප් හා දීමනා | 1,130,443.07 | 1,218,377.33 |
| අතිකාල ගෙවීම් | 170,572.20 | 214,306.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේඅඅ | 58,262.05 | 84,374.25 |
| අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වය - සේභාඅ | 11,652.41 | 16,874.85 |
| සේවක සුබසාධනය | 88,350.00 | 70,850.00 |
| ගමන් වියදම් - දේශිය | 10,800.00 | 6,150.00 |
| සේවක නිලඇඳුම් | 12,181.62 | 21,830.50 |
| විවිධ සැපයුම් | 53,847.61 | 20,582.15 |
| ආරක්ෂක | 453,452.24 | 326,953.00 |
| ලිපිද්‍රව්‍ය | 7,802.50 | 7,680.00 |
| දුරකථන | 45,268.45 | 26,080.42 |
| තැපැල් ගාස්තු හා මුද්දර | 11,345.00 | 4,010.00 |
| විදුලිය | 70,490.16 | 65,734.10 |
| නඩත්තුව - වාහන | 4,625.00 | - |
| නඩත්තුව - උපකරණ | 12,000.00 | 854,192.33 |
| ප්‍රවාහන හා භාණ්ඩ ගෙනවීම | 6,000.00 | - |
| බැංකු ගාස්තු | 750.00 | - |
| පැමිනීමේ දිරිදීමනා | 22,495.00 | 22,495.00 |
| ආර්ථික සේවා ගාස්තු | 10,122.95 | 2,191.23 |
| **එකතුව** | **2,180,460.26** | **2,962,681.16** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } ටීඅයිපී/ඒ/එස්එල්ටීඩීඒ/1/15/06 මබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2016 දෙසැම්බර් 24 දින

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2016 දෙසැම්බර් 07 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම් ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරන්නේ නම් අදාල වත්කම අයත් කාණ්ඩයේ සියලුම දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, අධිකාරිය සතු සියලුම ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමකින් තොරව ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල පමණක් 2008 වර්ෂයේදී රු.මිලියන 1,378 කට ප්‍රත්‍යාගණනය කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

දිගුකාලීන හා කෙටිකාලීන බදු පදනම මත ලබාදී ඇති ඉඩම් හා ගොඩනැගිලිවලින් අය කරනු ලබන බදු අනුපාතය තීරණය කිරීමට අදාල ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ආයෝජන | 55,540,267 | ශේෂ තහවුරු කිරීමේ ලිපි |
| ණයගැතියෝ | 125,539,987 | ශේෂ සනාථන ලිපි |
| ස්ථාවර වත්කම් | 2,276,873,583 | හිමිකම් ඔප්පු, වත්කම් ලේඛය |
| කළුගල් සැපයීම සඳහා ගෙවන ලද මුදල | 1,067,580 | සැපයුම්කරු තෝරා ගැනීමේ ලියවිලි, ඉන්වොයිසි, ද්‍රව්‍ය ප්‍රවාහනයට යොදාගත් වාහන පිළිබඳ විස්තර, කළමනාකරණ වාර්තා, භාණ්ඩ භාරගැනීම් විස්තර |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 ඉක්මවා අයනොවී පැවති ණයගැති ශේෂය රු.5,979,605 ක් වූ අතර වසර 03 ඉක්මවූ ණයගැති ශේෂය රු. 8.023,660 ක් විය.

(ආ) වසර 01 ත් 03 ත් අතර කාලයක සිට පාසිකුඩා පල්දෝරු සේවා නඩත්තු අයකිරීම් සඳහා ලැබිය යුතු රු.17,223,705 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිටත් අයනොවී පැවතුණි.

(ඇ) වසර 01 ත් 03 ත් අතර කාලයක සිට පාසිකුඩා ජල පරිභෝජන ණයගැතියන්ගෙන් අය විය යුතු රු.4,429,753 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිටත් අයනොවී පැවතුණි.

(ඇ) විවිධ ණයහිමියන්ට ගෙවිය යුතු රු.190,566 ක ශේෂයෙන් වර්ෂ 3 ක් ඉක්ම වූ ණය හිමි ශේෂය රු.146,063 ක් විය.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත | |
| (i) IV පරිච්ඡේදයේ 26(1) උප වගන්තිය | ප්‍රකාශිත සහ සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත කරගෙන යා හැකි සංචාරක කටයුතු, වාණිජ්‍ය සහ වෙනත් කටයුතු නියම කරමින් නියෝග සාදා නොතිබුණි. |
| (ii) VII පරිච්ඡේදයේ 3 ඡේදය | අධිකාරියේ යම් රැස්වීමක ගණපූරණය අධිකාරිය විසින් අන්‍යාකාරයකින් එකඟ වන්නේ නම් මිස සාමාජිකයින් පස්දෙනෙක් විය යුතු වුවත් අනුමැතිය ලබා දුන් සමහර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සඳහා එකී අවශ්‍යතාවය සපුරා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත | ආයතනයේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය සෑම වර්ෂයකම වත්කම් බැරකම් ප්‍රකාශ අමාත්‍යාංශ ලේකම්වරයා ට භාර දිය යුතු අතර අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් ආයතනයේ සභාපතිවරයාට එකී ප්‍රකාශ භාර දිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 : 1 උප වගන්තිය | 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් නිකුත් කරන ලද විගණකාධිපති වාර්තාවලින් අනාවරණය වන නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු නොකිරීම් හෝ අක්‍රමිකතාවයන් හා විෂමාචාරයන් සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට විරුද්ධව අදාල විනය බලධාරියා විසින් විධිමත් විනය පියවර සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ගෙන නොතිබුණි. |
| (ඈ) | 2010 සැප්තැම්බර් 28 දිනැති අංක 1673/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය | අධිකාරියට පවරා ඇති අධිකාර බලතලවලට පටහැනිව වයිස්රෝයි I සහ II යන දුම්රිය දෙකේ පවත්වාගෙන යන ආපනශාලා සඳහා මත්පැන් බලපත්‍ර ලබාදීම වෙනුවෙන් නිර්දේශ ලබා දී තිබුණි. |
| (ඉ) | 1996 ජනවාරි 24 දිනැතිව ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ චක්‍රලේඛය | රජයේ ඉඩම් බදු දීමේදී බදු ගිවිසුම සහ බදු මුදල වර්ෂ 05 කට වරක් සංශෝධනය කළ යුතු වුවද අධිකාරිය විසින් බදුදී තිබුණු ඉඩම් සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

(ඊ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.1 හා 9.14.2 වගන්ති

මානව සම්පත් කළමනාකරණයට අදාල නීති හා රෙගුලාසි පිළිබඳ සියලු කරුණු ඇතුලත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පරිච්ඡේදයක් සහිතව පරිපාටි සංග්‍රහයක් භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය සහිතව පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත්, අධිකාරිය එම අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(උ) 2015 මැයි 24 දිනැති අංක පීඊඩී 02/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

හිමිකම් ලබන නිලධාරීන්ගේ දුරකථන ඇමතුම් බිල්පත් අධිකාරියෙන් ගෙවීම වෙනුවට මාසික සන්නිවේදන දීමනාව ලෙස රු.390,460 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී නිළධාරීන්ගේ වැටුප් සමඟ ගෙවා තිබුණි.

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 1 පරිච්ඡේදයේ 12(4) (iii) වගන්තියට අනුව අදාල අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව පෞද්ගලික හෝටලයක් වෙත රාජ්‍ය බැංකුවකින් ලබාදුන් රු.මිලියන 100 ක ණය මුදලට අදාල පොලියෙන් රු.7,382,305 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. 308,312,524 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.325,029,262 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,716,738 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. අපගමන බදු ආදායම

රු.26,428,493 කින් වැඩිවුවද වෙනත් ආදායම රු.11,477,891 කින් අඩුවීමත්, සේවක පාරිශ්‍රමික රු.17,428,210 කින් වැඩිවීමත් හා නිකේතන ක්‍රියාකාරකම්වලින් රු.12,392,516 ක අලාභයක් ලැබීමත් ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලය අඛණ්ඩව වර්ධනය වී තිබුණද 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එය සියයට 5 කින් අඩු වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු.237,514,201 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.442,960,183 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ආදායම රු.මිලියන 545 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු.මිලියන 546 සමඟ සැසඳීමේදී සියයට 0.2 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ සංචාරක සංවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු. මිලියන 221 සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා රු.මිලියන 236 ක් වැය කර තිබුණි. ඒ අනුව සියයට 6.8 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

### 3.3 අධිකාරියට එරෙහිව හා අධිකාරිය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

රජයේ දේපල අයුතු ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් බාහිර පුද්ගලයන් 11 දෙනෙකුට එරෙහිව අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණ අතර බදුකරුවෙක් විසින් සහන ඉල්ලා අධිකාරියට එරෙහිව නඩුවක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ පරමාර්ථ පහත සඳහන් පරිදි වේ.

ශ්‍රී ලංකාව, ශ්‍රී ලංකාවේ සහ විදේශීයන්හිදී සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන් දියුණු කිරීම,

- වාරිකා හා සංචාරක කර්මාන්තයට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් සම්පාදිත ප්‍රතිපත්ති ඇතුළත, මෙම ක්ෂේත්‍රයට අදාළව සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයා හට උපදෙස් දීම,

- සංචාරක හා වාරිකා ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා අලෙවි කටයුතු කිරීම ශ්‍රී ලංකාවේ සහ විදේශීයන්හි සිදු කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කාර්යාංශයට මග පෙන්වීම.

- මානව සම්පත් පුහුණු කිරීමේ කටයුතු සහ සංවර්ධන කටයුතු භාර ගැනීම, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට මග පෙන්වීම.

- ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය කිරීමට සහ ව්‍යාප්ත කිරීමට දායකත්වයක් ලබා දීමේ අරමුණින්, සංචාරක කර්මාන්තය සහ වාරිකා පිළිබඳ ව්‍යාපාරික ක්ෂේත්‍ර නංවාලීමට කටයුතු කිරීම,

- සත්කාරක සේවා පිළිබඳ කර්මාන්තයද ඇතුලුව, ප්‍රමාණවත්, ආකර්ශණීය සහ කාර්යක්ෂමව සංචාරක සේවා දැරිය හැකි ආකාරයෙන් වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම,

- සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්තවලට අදාළව දේශීය වෙනත් කර්මාන්තවලට අදාළව,දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිති වැඩි දියුණු කිරීම, බලාත්මක කිරීම හා පවත්වා ගෙන යාම සඳහා සංචාරක ව්‍යවසායකයන්ට බලපත්‍ර ලබා දීම සහ බලය ලබා දීම,

- සංචාරක කර්මාන්තය ප්‍රවර්ධන කිරීමට සහ ඒ කර්මාන්තයට සම්බන්ධිත ප්‍රවර්ධනාත්මක කටයුතු සහ පුහුණු කටයුතුවලට සහභාගිවීමට පෞද්ගලික අංශයේ තැනැත්තන් සහ පුද්ගල මණ්ඩල දිරිමත් කිරීම,

- ඉහත පරමාර්ථ සියල්ලම හෝ සියල්ලම හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ඉහත අරමුණු ඉටුකරගැනීම පිළිබඳව සිදුකරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් අරමුණු ඉටු කර ඇති බව සනාථ කරගැනීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(i) දිගුකාලීන ඉලක්ක හා සිව් අවුරුදු සැලැස්ම පිළියෙල කිරීම හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සහ වාර්ෂික නව දිගුකාලීන ඉලක්ක ඇතුළත් කිරීමේ අරමුණින් ප්‍රතිශෝධනය කිරීම සහ ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

(ii) පනතේ නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම,මේ තුලින් සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්තවලට අදාලව,දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිත වැඩි දියුණු කිරීම,බලාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා සංචාරක ව්‍යවසායකයන්ට බලපත් ලබා දීම හා බලය ලබා දීම.

(iii) පනතේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ පහසුකම් සැලසීම සඳහා සාමාන්‍ය හෝ වෙනත් මණ්ඩල පිහිටුවීම.

(iv) ශ්‍රී ලංකාවේ ඇති සංචාරකයන්ගේ සිත්ගත් ස්ථානවල චාරිකා කරන තැනැත්තන්ට ප්‍රවාහන පහසුකම් සැලසීමේ ව්‍යාපාර කරගෙන යාම.

(v) සංචාරක ව්‍යවසායකයන් සහ සංචාරක සේවා ලියාපදිංචි කිරීම සහ සංචාරක සේවා සම්බන්ධයෙන් වූ මිල, ගාස්තු රේට ප්‍රමාණ සහ අයකිරීම් විධිමත් කිරීම.

(vi) සංචාරක උපදේශන කමිටුව යනුවෙන් හැඳින්වෙන මණ්ඩලයක් පිහිටුවීම.

(ආ) අධිකාරියේ අයිතිය හා කළමනාකරණය යටතේ සංචාරක නිවාඩු නිකේතන 04 ක් සහ සංචාරක නිකේතන 03 ක් පැවතුණි. 2014 වර්ෂයේදී මෙම නිකේතනවලින් රු.1,529,201 ක ශුද්ධ අතිරික්තයක්වූ අතර සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ පාඩුව රු.12,392,516 ක් විය. අධික පොදු කාර්ය වියදම හේතුකොටගෙන නිවාඩු නිකේතන පහක රු.32,342,280 ක ඌනතාවක් ජනිත වී තිබුණි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් 82 අතුරින් වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණේ ක්‍රියාකාරකම් 47 ක් පමණි. එනම් සියයට 57 කි. වර්ෂය තුල ආරම්භ කළ ව්‍යාපෘති අතුරින් වෙන්කළ මුදලින් සියයට 10 ට අඩුවෙන් වැයකළ ව්‍යාපෘති 7 ක්ද, සියයට 50 ට අඩුවෙන් වැයකළ ව්‍යාපෘති 9 ක්ද නිරීක්ෂණය විය. ඒ අනුව වර්ෂය තුල ව්‍යාපෘති 51 ක් සඳහා වෙන්කළ මුදලට අපේක්ෂිත කාර්ය සාධනයක් සිදුව නොමැති බව නිරීක්ෂණය විය එමෙන්ම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ උපායමාර්ග 6 ක් යටතේ ව්‍යාපෘති ඉටු කිරීම පිණිස රු. මිලියන 749.31 ක් වෙන්කර තිබුණද වර්ෂය තුල වැයකර තිබුණේ රු. මිලියන 297.02 ක් පමණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

### (අ) ඉඩම් හා දේපල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මීට වර්ෂ කිහිපයකට පෙර ත්‍රිකුණාමලය කුච්චවේලි ප්‍රදේශයෙන් අධිකාරිය වෙත පවරාගන්නා ලද ඉඩම් අක්කර 510 කට ආසන්න බිම් ප්‍රමාණයකින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සංවර්ධනය කිරීමට හෝ කටයුතු සිදු කර තිබුණේ ඉඩම් අක්කර 50කට අඩු ප්‍රමාණයකි.

(ii) සංචාරක සංවර්ධන කටයුතු සඳහා යාල පලටුපාන වන ජීවී ප්‍රදේශයේ අධිකාරියට පවරාගෙන ඇති හෙක්ටයාර 448.3 ක භූමියෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ආයෝජකයන් වෙත බදු පදනම මත ලබා දී තිබුණේ හෙක්ටයාර් 26.8 ක් පමණි.

(iii) මූලික පාලන ක්‍රමයන් ලෙස දේපලවල ඔප්පු පැවරුම් එකතු කිරීම් හා සංවර්ධනය කිරීම් යනාදී විස්තර දක්වමින් ඉඩම් හා වත්කම් වෙනුවෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(iv) විගණනය විසින් කරන ලද නියැදි පරීක්ෂාවකට අනුව තානායම් 56 ක් හා අක්කර 6,495 ක වපසරියක් සහිත ඉඩම් කැබලි 166 ක් ආයතනයට පවරා ගැනීම සඳහා ගැසට් නිවේදන නිකුත් කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පවරාගෙන තිබුණේ කොටසක් පමණි.

(ආ) නුවරඑළිය නිවාඩු නිකේතනයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.1,166,349 ක මුදලක් ගෙවා තිබුණද අලුත්වැඩියා කටයුතු නිසි පරිදි කලේද යන්න පිළිබඳ සහතිකයක් ලබා දී නොතිබූ අතර කරන ලද අලුත්වැඩියා කටයුතු ගිවිසුම ප්‍රකාරව සිදු කර නොතිබූ බව විගණන සෝදිසි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) බණ්ඩාරවෙල නිවාඩු නිකේතනය පිහිටා ඇති අක්කර 22 රූඩ් 1 පර්චස් 17.23 ක භූමි ප්‍රමාණය නිසි පරිදි මැනුම් සිදුකර අධිකාරියට පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර නිකේතන භූමියේ ඇති මිල අධික ඉහල වටිනාකමින් යුත් ගස් 200 ක් පමණ ඉන්වෙන්ට්‍රිගත කර සුරක්ෂිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි අක්කර 11 රූඩ් 03 පර්.13 ක ඉඩමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 65,104,138 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද එකී ඉඩම අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම ඉඩමෙහි ආරක්ෂණ වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.639,529 ක මුදලක් ද වැයකර තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 සැප්තැම්බර් 3 දින අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචරණ සුහසාධක සංගමය වෙත රු.5,738,075 ක මුදලක් ගෙවා තිබුණි. එම මුදලින් සංචරණ සුහසාධක සංගමය 2014 සැප්තැම්බර් 3 දින සිට 9 දින දක්වා බලංගොඩ, දෙහිඅත්තකණ්ඩිය, පදියතලාව, හසලක, ලුණුගම්වෙහෙර හා නුවරඑළිය යන ප්‍රදේශවලදී තෝරාගත් කණ්ඩායම්වලට ආහාරපාන සැපයීමට සහ කාර්යමණ්ඩල පහසුකම් සඳහා රු. 4,768,982 ක් වැයකර ඉතිරිය සුහසාධක සංගමයට අයත් ගිණුමක තැන්පත් කර තිබුණි. මෙම මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා අධිකාරියට ලබා දී නොතිබුණි.

**4.4 අරමුදල් උපයෝජනය**

අධිකාරියේ මාසික මූල්‍ය ප්‍රකාශන විග්‍රහාත්මක තොරතුරු අනුව සාමාන්‍ය කාරක ප්‍රග්ධන අවශ්‍යතාවය වූ රු.මිලියන 170 ඉක්මවා රු.මිලියන 599 ක මූල්‍ය අතිරික්තයක් උපරිම ආයෝජන ප්‍රතිලාභයකින් තොරව සමාලෝචිත වර්ෂය පුරාම අරමුදල් කළමනාකරණ ගිණුමේ රඳවාගෙන තිබුණි.

**4.5 සේවක පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම**

සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීමට වෙන් කරන ලද රු.52,288,318 ක ප්‍රතිපාදනයෙන් ආයෝජනය කර තිබුණේ රු.19,768,441 ක ප්‍රමාණයකි.

**4.6 දෘෂ්‍ය අක්‍රමිකතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කල්පිටිය තොරයිඅඩි ජැටිය ඉදිකිරීම සහ වන්නිමුන්දලම කලපුව අසල තාර දැමීම සඳහා කළුගල්,බොරළු හා ඒ.බී.සී.සැපයීම සම්බන්ධව විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

(i) වෙළෙඳපල මිල සැඳවුම් ක්‍රමය යටතේ, කළුගල් සැපයීමට තෝරාගත් සැපයුම්කරු වෙනුවට ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි වෙනත් පුද්ගලයෙකුගෙන් කළුගල් කියුබ් 1648 ක් වැඩි මිලට මිලදී ගැනීම නිසා රු.824,000 ක වැඩිපුර මුදලක් අධිකාරියට දැරීමට සිදුවී තිබුණ අතර එම මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා අයකරගෙන නොතිබුණි.

(ii) කල්පිටිය වැඩබිමට කළුගල්,බොරළු සහ ඒ.බී.සී සැපයීම සඳහා යොදාගත් බවට සඳහන් ටිපර් රථයක ධාරිතාවය කියුබ් 3 ක් වුවද කියුබ් 4 බැගින් ද්‍රව්‍යය සැපයූ ලෙස සලකා ගෙවීම් කිරීම නිසා වැඩිපුර ගෙවූ රු.2,549,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) කළුගල් කියුබ් 1648 ක්, ඒ.බී.සී කියුබ් 368 ක් සහ බොරළු කියුබ් 40 ක් ලෙස භෞතිකව භාර නොගත් ද්‍රව්‍ය වටිනාකම වූ රු.10,196,000 ක් සඳහා අධිකාරිය විසින් ගෙවීම්කර තිබුණි.

(ආ) කතරගම සංචාරක නිවාඩු නිකේතනයේ සිදුකළ අළුත්වැඩියා කටයුතුවලට වැඩිපුර ගෙවන ලද රු.11,089,228 ක් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීමට හා විනය ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කටයුතුකර නොතිබුණි.

(ඇ) කල්පිටිය මොහොට්ටුවාරම ජැටිය ඉදිකිරීමේ කටයුතු සඳහා ඩෝසර් යන්ත්‍ර සැපයූ බවට සැපයුම්කරුවන් ඉදිරිපත් කළ ලිපි තුනක් පදනම් කරගෙන පැය 941.7 ක් සඳහා රු.3,226,950 ක මුදලක් ගෙවා තිබුණි. එහෙත් මෙම ඩෝසර් යන්ත්‍ර සේවය ලබාගත් බවට දිනපතා මනු කියවා වැඩපැය සටහන්කර එම වැඩපැය වාර්තා අධිකාරියේ නිලධාරියෙකුගෙන් සහතික කරගැනීමකින් තොරව මෙම ගෙවීම සිදුකර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති වැඩපරීක්ෂක විසින් ට්‍රැක්ටර් සේවාව සතුටුදායක ලෙස ලබා ගත් බවට උක්ත ලිපි තුනේ සහතික කර තිබුණි.

(ඇ) බෙන්තොට නිකේතන කළමනාකරු විසින් 2012 හා 2013 යන වර්ෂවල වැටුප් රහිත නිවාඩු 65½ ක ප්‍රමාණයක් ලේඛනගත කිරීමකින් තොරව ලබාගෙන කළමනාකරණයට නොදන්වා එම වර්ෂ දෙකේදීම ඉතිරිකරගත් නිවාඩු දීමනාව ලෙස රු. 80,960 ක් ලබාගෙන තිබුණි.

(ඉ) බෙන්තොට නිකේතන කළමනාකරු විසින් ව්‍යාජ අංකයන් සඳහන් වාහනයක් සඳහා වසරක කාලසීමාවකට ආයතන දෙකකට වාහන කුලිය ලෙස රු. 480, 000ක් සහ ඉන්ධන රු.128,226 ක් ලෙස මුළු මුදල රු. 608,226 ක් නීති රීති රෙගුලාසිවලින් බැහැරව ගෙවා තිබුණි.

(ඊ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සුදුසුකම් නොමැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති ඇතුලත් අංක 1589/30 හා 2009 පෙබරවාරි 20 දිනැති ගැසට් පත්‍රයේ නියමයන් හා 2015 ජුනි 29 දිනැති මැතිවරණ කොමසාරිස්ගේ අංක

පීඒ/2015/04 දරන ලිපියෙන් ප්‍රකාශිත මැතිවරණ නීතිරීති නොපිළිපදිමින් අධිකාරියට බඳවාගත් සහකාර අධ්‍යක්ෂකවරුන් 9 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,879,478 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## 4.7 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1969 වර්ෂයේදී සංචාරක කර්මාන්තය සඳහා ලංකා සංචාරක මණ්ඩලයටද, පසුව සංචාරක සංවර්ධන අධිකාරියට පවරා දෙන ලද බෙන්තොට සංචාරක නිවාඩු නිකේතනයට අයත් අක්කර 94 ක පමණ භූමියෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම උපයෝජනය කර තිබුණේ අක්කර 50 ක පමණ භූමි ප්‍රමාණයකි. මේ අනුව වර්ෂ 46 කට වැඩි කාලයක් අක්කර 40 කට වැඩි භූමි ප්‍රමාණයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) බෙන්තොට ජාතික නිවාඩු නිකේතන භූමියේ පිහිටි වර්ග අඩි 2880 ක පමණ ගොඩනැගිලි ඉඩ ප්‍රමාණයක් 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ආර්ථිකමය කටයුත්තකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

## 4.8 ආර්ථික නොවන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බිබිල, රාගල, හොරව්පතාන, මහියංගනය, වීරකැටිය, බත්තුළුඔය සහ නිකවැරටිය යන ප්‍රදේශවල වර්ෂ 3කට පෙර සිට නිවාඩු නිකේතන 7 ක ආරක්ෂක කටයුතු සඳහා රු.7,483,180 ක් පමණ වැය කර තිබුණි. එහෙත් මෙම නිකේතන ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් අවශ්‍යතාවය ඇගයීමකින් තොරව සෝපා පුටු 55 ක් මිලදී ගැනීමට රු.2,659,875 ක් වැයකර තිබුණි. මෙම සෝපා පුටු මිලදී ගැනීමට සීමිත මිල ගණන් කැඳවා තිබුණද ආදර්ශ පුටුව සැපයූ ආයතනයෙන් මිල ගණන් ලබා ගෙන නොතිබුණි. පුටු මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තියට පටහැනිව අත්තිකාරම් ලෙස මුළු සැපයුම් වටිනාකමින් සියයට 50 ක් ගෙවා තිබුණ අතර අවස්ථා කීපයකදී පුටු ප්‍රවාහනය වෙනුවෙන් රු.211,000ක නිශ්කාර්ය වැයක්ද දරා තිබුණි. එසේම රු.159,803 ක් වටිනා පුටු 03 ක් අස්ථානගත වී තිබුණි.

## 4.9 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බෙන්තොට ජාතික නිවාඩු නිකේතන ඉඩමේ වගාකර තිබෙන පොල් හා තැඹිලි ගස් 600 ක පමණ ප්‍රමාණයකින් 2013 වර්ෂයේ ජූලි මාසයේ සිට අඛණ්ඩව මාස 06ක පමණ කාලයක් ඵලදාව නෙලා නොගැනීමෙන් රු.100,000 කට වැඩි පාඩුවක් අධිකාරියට සිදු වී තිබුණි. මෙම පාඩුවට වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 30 ඉක්මවූ ව්‍යාපෘතියක් වශයෙන් කල්පිටිය ඒකාබද්ධ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය වර්ගකර නිළධාරින්ට වැටුප් හා දීමනා ගෙවා තිබීම නිසා 2009 සිට 2011 දක්වා රු.3,780,253 ක වැඩිපුර ගෙවූ මුදල අධිකාරියට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරිය සතු කොළඹ පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ (Dutch Hospital) ක්ෂය ප්‍රතිපාදන අඩුකළ වටිනාකමට වඩා රු.7,274,715 ක් අඩුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට පවරා තිබුණි.

## 4.10 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාසිකුඩා සංචාරක නිකේතන ව්‍යාපෘතියේ වැසි වතුර බැස යාමේ කාණු පද්ධතිය ඉදිකිරීමට අදාල විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

(i) අධිකාරියේ සැලසුම් හා සංවර්ධන අංශයේ අධ්‍යක්ෂවරයා මෙම ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කර ඇති අතර ඔහු විසින් මෙම ව්‍යාපෘතියට අදාලව රු.31,394,813 ක ගෙවීම් වවුචර් සහතික කර තිබුණි. අදාල මිණුම් වාර්තා සහ ගෙවීම් බිල්පත් පරීක්ෂාකර සහතික කර ගෙවීම් වවුචර් පිළියෙල කර තිබුණේ අධ්‍යක්ෂකවරයා යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවය කළ නිකේතන නිලධාරී විසිනි. මේ අනුව නිලධාරීන්ට අදාල කාර්යයන් සඳහා තිබෙන වෘත්තීය නිපුණතාවය සහ ස්වාධීනත්වය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

14

(ii) විගණනය විසින් ඉදිකිරීම් භෞතිකව පරීක්ෂා කිරීමේ දී අදාල භූමියේ භූ විෂමතාව සැලකිල්ලට ගෙන ඉදිකිරීම් සිදු නොකිරීම හේතු කොටගෙන කාණු පද්ධතියේ ජලය රැඳී තිබෙන බව විගණනයට නිරීක්ෂණය වූ අතර ගණනය කළ තථ්‍ය මිණුම් වාර්තා, බිල්පත්වල සඳහන් ගෙවීම් ප්‍රමාණයන් සමග සැසඳීමේදී රු.3,792,420 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියේ "වන් ස්ටොප්" ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වෙබ් අඩවිය නිර්මාණය කිරීමට පූර්ව සැලසුමක් හෝ ඇස්තමේන්තුවක් සකස්කර නොතිබුණු අතර තෝරාගත් කොන්ත්‍රාත්කරු සමඟ ලිඛිත ගිවිසුමකට ඇතුළත් වීමකින් තොරව අදාල කාර්යභාරය පමණක් ලිඛිතව දැනුම් දී තිබුණි.

(ii) කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් කාර්යසාධන ඇපකරයක් ලබාගෙන නොතිබුණි.

(iii) 2014 ජනවාරි 6 දිනට මෙම කොන්ත්‍රාත්තුවට අදාලව රු.699,300 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛයේ 8 ඡේදයේ සඳහන් අරමුණුවලට පටහැනිව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා බෙන්තොට පල්දෝරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ශ්‍රම කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන පරිපාටියෙන් තොරව පුද්ගලික ආයතනයක් වෙත පවරා රු.28,740,018 ක ගෙවීමක් කර තිබුණි.

(ඇ) පාසිකුඩා සංචාරක කලාපයේ ජාතික නිවාඩු නිකේතනයේ කිලෝමීටර් 1.126 ක පිවිසුම් මාර්ගය කාපට් කිරීම සඳහා ව්‍යාජ ලෙස අදියර 04 කට පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර ප්‍රසම්පාදන පරිපාටි අනුගමනය කිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරු තෝරාගෙන ඉදිකිරීම් සඳහා මුදල් ගෙවීමේදී රු.22,013,564 ක වැඩිපුර මුදලක් එම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

## 4.11 ප්‍රමාද වූ ව්‍යාපෘති

අතිරේක කාමර 4,000ක් සහිත නිකේතන ඉදිකිරීම සහ යටිතල සහසුකම් ඇති කිරීම පිණිස රු.මිලියන 5,521 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ කර තිබුණු කල්පිටිය ඒකාබද්ධ සංචාරක ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කල්පිටිය ඒකාබද්ධ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වර්ෂ 5කින් නිම කිරීම සඳහා 2008 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ මහා භාණ්ඩාගාරයේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් කිසිදු ඉදිකිරීමක් කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සහ ව්‍යාපෘතියේ කළමනාකරණ වියදම්, උපදේශන හා ප්‍රාග්ධන වැඩ යනාදිය ආවරණය වන පරිදි විස්තරාත්මක අයවැයක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතිය යටතේ දූපත් 14 ක් ආයෝජකයින් සඳහා ලබා දීමට අධිකාරිය යටතට පත්කර ඇති අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආයෝජකයින් වෙත ලබා දී තිබුණේ දූපත් 3ක් පමණි.

(ඈ) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාලව කල්පිටිය සහ දෙද්දූව ප්‍රදේශවල ඉඩම් අත්පත් කරගැනීම සඳහා එම ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත 2007 වර්ෂයේදී රු.මිලියන 71 ක අත්තිකාරම් මුදල් ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම එම ඉඩම් අත්පත් කරගෙන නොතිබුණි.

## 4.12 කාර්ය මණ්ඩල පරිපාලනය

අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව තනතුරු නාම 19 ක් යටතේ තනතුරු 199 ක සංඛ්‍යාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ තත්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 180 ක් සහ 156 ක් විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි සඳහන් අයිතම කිහිපයක් සඳහා ඉලක්ක සඳහන් කර නොතිබුණු අතර එක් එක් වර්ෂය අවසානයේ ලඟා කරගත යුතු ඉලක්ක කාලානුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ කාල නියමයන් සඳහන් කර තිබුණද අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරට සමාලෝචිත වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සුදුසුකම් නොමැති නිළධාරියකු පත්කර තිබුණු අතර අභ්‍යන්තර විගණන අංශයේ සැලැස්මට අනුව විගණනයක්ද සිදු කර නොතිබුණි.

### 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(අ) අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.5 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 13 ක අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 32 සිට සියයට 283 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2015 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ සභාගතකර තිබුණි.

17

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව අධිකාරියේ සභාපතිවරයා වරින්වර දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | සංවර්ධන වැඩසටහන් | සංවර්ධන වැඩසටහන් අධිකාරියේ ක්‍රියාකාරිත්ව සැලැස්මට අනුකූලව සිදුකිරීම හා භෞතික ප්‍රගතිය පිළිබඳ ව වාර්තා කිරීමට වැඩපිළිවෙලක් සකස්කර නොතිබීම. |
| (ආ) | ව්‍යාපෘති පාලනය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඒවා අධීක්ෂණය හා ගෙවීම් නිර්දේශ කිරීමේදී හා අනුමත කිරීමේදී කළ වැඩ වාර්තා ප්‍රමාණවත් කරුණු පරීක්ෂාවකින් තොරව සිදුකර තිබුණි. |
| (ඇ) | වත්කම් කළමනාකරණය | වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම හා වත්කම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | ගිණුම්කරණය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ගිණුම්කරණය කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම හා ප්‍රාග්ධන වත්කම් ගිණුම් තැබීම අදාලව මූලික ලියකියවිලි නොමැතිව ගිණුම් තැබීම් සිදුකර තිබීම. |

එච්. එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

18

